# 2

# ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය

## 2.1 සමස්ත නිරීක්ෂණ

ශ්‍රී ලංකා ආර්ථිකය, නිදහසින් පසු මුහුණ දුන් බරපතළම ආර්ථික අර්බුදය හමුවේ, 2022 වසරේ දී පෙර නොවූ විරූ පරිදි සියයට 7.8ක පහත වැටීමක් වාර්තා කළ අතර, ක්‍රියාත්මක කරන ලද විචක්ෂණශීලී ප්‍රතිපත්ති අර්බුදකාරී වාතාවරණය තවදුරටත් තීව්‍ර වීම වැළැක්වීමට උපකාරී විය. අර්බුදය මුල් අවධියේ දී ප්‍රධාන වශයෙන් දැඩි විදේශ විනිමය හිඟතාවය හේතුවෙන් භාණ්ඩ සැපයුම් ක්‍රියාවලිය සඳහා බාධා සිදු වීම නිසා පාරිභෝගික භාණ්ඩ, ඉන්ධන හා විදුලිය වැනි බලශක්ති සහ නොයෙකුත් කර්මාන්ත සඳහා අවශ්‍ය යෙදවුම් ආදියේ උග්‍ර හිඟයක් ඇති වූ අතර, ඒ හා සමගාමීව ඒවායේ මිල මට්ටම් ද විශාල ලෙස ඉහළ යන ලදී. මෙම වාතාවරණය තවදුරටත් උග්‍ර වීම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් උද්ධමනය පාලනය කිරීමට සැලකිය යුතු ලෙස ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම සහ විදේශ විනිමය පිටතට ගලා යෑම පාලනය කිරීමට අත්‍යවශ්‍ය ආනයන සඳහා පමණක් ප්‍රමුඛතාව ලබා දීම වැනි දැඩි නමුත් අත්‍යවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරනු ලැබීය. මෙම ක්‍රියාමාර්ග මගින් අධික ඉල්ලුම පාලනය කිරීමට, සැපයුම් අංශයේ අවහිරතා අවම කිරීමට මෙන්ම ඉන්ධන සහ කර්මාන්ත සඳහා අවශ්‍ය යෙදවුම් ඇතුළු අත්‍යවශ්‍ය ආනයන සඳහා වැඩි ඉඩප්‍රස්ථා ඇති කිරීම තුළින් ආර්ථිකය ක්‍රමයෙන් ස්ථාවර කිරීමට හැකි විය. ආර්ථිකයෙහි ඇති වූ අයහපත් ක්‍රියාකාරීත්වය පෙන්නුම් කරමින් කර්මාන්ත, සේවා සහ කෘෂිකර්මාන්ත යන ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වයේම ක්‍රියාකාරීත්වය 2022 වසරේ දී පහත වැටුණි. ඒ අනුව, නිෂ්පාදන කර්මාන්ත, ඉදිකිරීම් සහ පතල් හා කැණීම් කටයුතු කර්මාන්ත කටයුතුවල පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ දී සංචාරක පැමිණීම් ඉහළ යෑම නිසා ඇති වූ ප්‍රතිලාභ හමුවේ වුවද, නිවාස අයිතිය ද ඇතුළත් දේපළ වෙළඳාම් කටයුතු, රක්ෂණ සේවා හා මූල්‍ය සේවා ආදියේ පසුගාමීත්වය සමස්ත සේවා කටයුතුවල පහත වැටීමට මූලිකව හේතු විය. මේ අතර, ඉන්ධන හිඟය හේතුවෙන් මත්ස්‍ය නිෂ්පාදන කටයුතු පහත වැටීම, සත්ත්ව ආහාර හිඟය නිසා සත්ත්ව නිෂ්පාදන කටයුතු පහත වැටීම සහ පොහොර හිඟය නිසා වී සහ එළවළු වගා කටයුතුවලට බාධා සිදුවීම සමස්ත කෘෂිකාර්මික කටයුතු පහත වැටීමට හේතු විය. තවද, ප්‍රධාන ශ්‍රම වෙළඳපොළ දර්ශක යම් යහපත් ප්‍රවණතාවයක් පෙන්නුම් කළ ද මෙම අයහපත් ආර්ථික තත්ත්වය මත ශ්‍රම ඵලදායීතාවය පහත වැටුණි. මේ අතර, වියදම් ප්‍රවේශය සැලකූ විට මිල මට්ටම් ශීඝ්‍රයෙන් ඉහළ යෑම හේතුවෙන් පවත්නා මිල අනුව ආයෝජන මෙන්ම පරිභෝජන වියදම් ද 2022 වසර තුළදී සැලකිය යුතු ලෙස ඉහළ යන ලදී. කෙසේ වුව ද, ස්ථාවර මිල අනුව සැලකූ විට ඉහළ උද්ධමනය සහ ණය පොලී වියදම ඉහළ යෑම හමුවේ ක්‍රය ශක්තිය හීන වීම සහ ආයෝජකයින් විසින් ආයෝජන සිදු කිරීමට යොමු නොවීම නිසා පරිභෝජන මෙන්ම ආයෝජන වියදම ද පහත වැටුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකා රුපියල තියුණු ලෙස අවප්‍රමාණය වීම ද දායක කොටගෙන භාණ්ඩ හා සේවා ආනයනවලට වඩා භාණ්ඩ හා සේවා අපනයන ඉහළ යෑම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුමෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි. මෙහිදී, ආනයනවල සාපේක්ෂ අඩු වර්ධනය සඳහා බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ද්‍රවශීලතාව පහත වැටීම, අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම, රුපියල වේගයෙන් අවප්‍රමාණය වීම මෙන්ම දැඩි මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හේතු විය.

## 2.2 දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)[1], දළ ජාතික ආදායම (ද.ජා.ආ.) සහ ඒක පුද්ගල ද.දේ.නි.

2021 වසරේ දී ස්ථාවර වෙළඳපොළ මිල (2015) අනුව (මින් මතු "ස්ථාවර මිල" යනුවෙන් සඳහන් කරනු ලබන) සියයට 3.5කින් වර්ධනය වූ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.), 2022 වසරේ දී සියයට 7.8කින් පහත වැටුණු අතර, මේ සඳහා රට හමුවේ පැවති අහිතකර ආර්ථික තත්ත්වයන් සමනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් ගන්නා ලද දැඩි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඉවහල් විය. මේ අතර, පවත්නා වෙළඳපොළ මිල අනුව (මින් මතු "පවත්නා මිල" යනුවෙන් සඳහන් කරනු ලබන) ද.දේ.නි. 2022 වසරේ දී රුපියල් බිලියන 24,147.7 (එ.ජ. ඩොලර් බිලියන 77.1)ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 2021 වසරේ දී වාර්තා වූ රුපියල්

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදන, වියදම් සහ ආදායම් යන ප්‍රවේශ තුන යටතේ ද.දේ.නි. ඇස්තමේන්තු කරනු ලබයි.

**2.1 සංඛ්‍යා සටහන**

**කර්මාන්ත මූලය අනුව දළ දේශීය නිෂ්පාදිතය (2015 ස්ථාවර මිල අනුව) (අ)(ආ)**

| ආර්ථික කටයුතු | වර්ධනය (%) | | ද.දේ.නි. හි වර්ධනයට දායකත්වය (%) | | ද.දේ.නි. ට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2021 (ඇ) | 2022 | 2021 (ඇ) | 2022 | 2021 (ඇ) | 2022 |
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **0.9** | **- 4.6** | **0.1** | **- 0.3** | **7.3** | **7.5** |
| ධාන්‍ය වගාව (වී හැර) | 2.8 | - 21.6 | 0.00 | - 0.04 | 0.2 | 0.1 |
| වී වගාව | - 11.8 | - 13.0 | - 0.11 | - 0.11 | 0.8 | 0.8 |
| එළවළු වගාව | - 1.7 | - 8.4 | - 0.02 | - 0.07 | 0.8 | 0.8 |
| උක් වගාව, දුම්කොළ වගාව සහ වෙනත් බහුවාර්ෂික නොවන භෝග | - 7.3 | 1.8 | - 0.00 | 0.00 | 0.0 | 0.0 |
| පලතුරු වගාව | - 10.8 | 0.5 | - 0.07 | 0.00 | 0.6 | 0.6 |
| තෙල් සහිත පලතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 11.2 | 8.6 | 0.08 | 0.07 | 0.8 | 0.9 |
| තේ වගාව | 8.5 | - 15.9 | 0.05 | - 0.09 | 0.6 | 0.5 |
| වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | - 16.2 | - 9.1 | - 0.00 | - 0.00 | 0.0 | 0.0 |
| කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැළෑටි වගාව | 4.5 | 3.3 | 0.03 | 0.02 | 0.8 | 0.8 |
| රබර් වගාව | 6.2 | - 6.7 | 0.01 | - 0.01 | 0.2 | 0.2 |
| වෙනත් බහුවාර්ෂික භෝග වගාව | - 9.5 | 2.0 | - 0.02 | 0.00 | 0.2 | 0.2 |
| කිරි, බිත්තර, මස් සහ වෙනත් සත්ත්ව නිෂ්පාදනයන් | 8.2 | - 12.9 | 0.06 | - 0.09 | 0.7 | 0.7 |
| පැල බෝකිරීම | 30.8 | 8.3 | 0.00 | 0.00 | 0.0 | 0.0 |
| කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 14.2 | 14.7 | 0.03 | 0.03 | 0.2 | 0.3 |
| වන වගාව, ගස් කැපීම හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 4.4 | 16.1 | 0.01 | 0.05 | 0.3 | 0.4 |
| ධීවර කර්මාන්තය | 1.5 | - 10.5 | 0.02 | - 0.11 | 1.1 | 1.0 |
| **කර්මාන්ත** | **5.7** | **- 16.0** | **1.7** | **- 4.8** | **30.2** | **27.5** |
| පතල් හා කැණීම් කර්මාන්තය | 1.4 | - 31.0 | 0.03 | - 0.68 | 2.2 | 1.7 |
| නිෂ්පාදන කර්මාන්ත | 7.4 | - 12.6 | 1.23 | - 2.18 | 17.2 | 16.3 |
| විදුලිය, ගෑස්, වාෂ්ප හා වායුසමීකරණ සැපයීම | 4.9 | - 5.9 | 0.07 | - 0.09 | 1.4 | 1.5 |
| ජලය පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | - 17.8 | 0.6 | - 0.02 | 0.00 | 0.1 | 0.1 |
| මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය | - 3.3 | 3.9 | - 0.01 | 0.01 | 0.2 | 0.2 |
| ඉදිකිරීම් කර්මාන්තය සහ එම සේවාවන් | 4.4 | - 20.9 | 0.39 | - 1.88 | 9.0 | 7.7 |
| **සේවාවන්** | **3.5** | **- 2.0** | **2.0** | **- 1.1** | **56.9** | **60.5** |
| වෙළඳාම, ප්‍රවාහන සේවාවන්, නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 1.3 | 2.6 | 0.31 | 0.62 | 24.2 | 26.9 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවාවන් | 18.0 | - 1.4 | 0.51 | - 0.05 | 3.2 | 3.5 |
| මූල්‍ය, රක්ෂණය හා නිවාස අයිතිය සහ දේපළ වෙළඳාම | 7.5 | - 15.4 | 0.76 | - 1.63 | 10.5 | 9.7 |
| වෘත්තීයමය සේවාවන් සහ වෙනත් පෞද්ගලික සේවාවන් | 1.8 | - 0.6 | 0.18 | - 0.06 | 9.9 | 10.7 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවාවන් | 2.2 | - 0.3 | 0.20 | - 0.03 | 9.0 | 9.7 |
| **මූලික මිල අනුව සමස්ත එකතු කළ අගය** | **4.0** | **- 6.7** | **3.7** | **- 6.3** | **94.4** | **95.5** |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු - සහනාධාර | - 3.6 | - 27.1 | - 0.2 | - 1.5 | 5.6 | 4.5 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.)** | **3.5** | **- 7.8** | **3.5** | **- 7.8** | **100.0** | **100.0** |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | 12.6 | - 3.5 | | | | |
| **වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම** | **4.0** | **-8.1** | | | | |


(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2.1 රූප සටහන

## 2022 වසරේ ජාතික නිෂ්පාදිතය, වියදම, ආදායම සහ සේවා නියුක්තිය සංක්ෂිප්තයක් ලෙස


### අර්බුදකාරී වාතාවරණය හමුවේ ශ්‍රී ලංකා ආර්ථිකය පෙර නොවූ විරූ පහත වැටීමක් වාර්තා කළේය...





**ද.දේ.නි. පවත්නා වෙළඳපොළ මිල අනුව**
රු. බිලියන 24,148
එ.ජ. ඩොලර් බිලියන 77.1

**මධ්‍ය වාර්ෂික ජනගහනය (පුද්ගලයන් දහස්)**
22,181

**ඒක පුද්ගල ද.දේ.නි.**
රු. 1,088,667
එ.ජ. ඩොලර් 3,474




### නිෂ්පාදන ප්‍රවේශය





**සේවා** -2.0% ↓
දේපළ වෙළඳාම් සහ රක්ෂණ කටයුතු පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

**කර්මාන්ත** -16.0% ↓
නිෂ්පාදන සහ ඉදිකිරීම් කටයුතු පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

**කෘෂිකර්මාන්තය** -4.6% ↓
වී වගාව සහ සත්ත්ව නිෂ්පාදන කටයුතු පහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.

**බදු-සහනාධාර** -27.1% ↓

### වියදම් ප්‍රවේශය




**පෞද්ගලික පරිභෝජනය** 39.0% ↑
ආහාර සහ ප්‍රවාහනය සඳහා වූ වියදම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.


**රාජ්‍ය පරිභෝජනය** 3.8% ↑
සමාජ ආරක්ෂණය සහ අධ්‍යාපනය සඳහා වූ වියදම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.

**දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය** 28.4% ↑
දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය.

**ශුද්ධ අපනයන** 34.1% ↑
අපනයන වටිනාකම වැඩි වශයෙන් ඉහළ යෑම බලපාන ලදී.

- භාණ්ඩ හා සේවා අපනයන 74.1% ↑
- භාණ්ඩ හා සේවා ආනයන 41.2% ↑

### ආදායම් ප්‍රවේශය




**සේවක ආදායම්** 32.6% ↑

**දළ මෙහෙයුම් අතිරික්තය** 36.0% ↑
- ශුද්ධ මෙහෙයුම් අතිරික්තය 36.8% ↑
- ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය 31.2% ↑

**දළ මිශ්‍ර ආදායම** 45.4% ↑
- ශුද්ධ මිශ්‍ර ආදායම 46.4% ↑
- ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය 23.0% ↑


**නිෂ්පාදනය මත වෙනත් බදු-සහනාධාර** 30.4% ↑

### ශ්‍රම වෙළඳපොළ දර්ශක

| ශ්‍රම බලකාය | ආර්ථික වශයෙන් සක්‍රිය නොවන ජනගහනය | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය | සේවා නියුක්ත ජනගහනය | සේවා වියුක්ති අනුපාතිකය | විදේශ රැකියා සඳහා පිටත්ව යෑම් |
|---|---|---|---|---|---|
| මිලියන 8.553 (2021) | මිලියන 8.581 (2021) | 49.9% (2021) | මිලියන 8.114 (2021) | 5.1% (2021) | 122,264 (2021) |
| මිලියන 8.547 (2022) | මිලියන 8.615 (2022) | 49.8% (2022) | මිලියන 8.148 (2022) | 4.7% (2022) | 311,056 (2022) |

2

**2.2 රූප සටහන**
**වාර්ෂික ද.දේ.නි. වර්ධන අනුපාතිකය (අ)**




(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

බිලියන 17,600.2 (එ.ජ. ඩොලර් බිලියන 88.5)ක අගයට සාපේක්ෂව සියයට 37.2ක වර්ධනයකි. පවත්නා මිල අනුව ද.දේ.නි.යේ දක්නට ලැබුණු මෙම ඉහළ වර්ධනයට ප්‍රධාන වශයෙන් වසර තුළ දී පැවති ඉහළ මිල මට්ටම්වල බලපෑම හේතු වූ අතර, එය ද.දේ.නි. ගම්‍ය මිල අවධමනකය 2021 වසරේ දී වාර්තා කළ සියයට 8.5ක අගයේ සිට 2022 වසරේ දී සියයට 48.8ක් දක්වා ඉහළ යෑම මගින් ද පිළිබිඹු වේ.


**ද.දේ.නි.ට ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම ගැළපීම මගින් ඇස්තමේන්තු කරනු ලබන දළ ජාතික ආදායම (ද.ජා.ආ.) ද, 2021 වසරේ දී වාර්තා කළ සියයට 12.8ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේදී සියයට 36.7ක වර්ධනයක් වාර්තා කරන ලදී.** මෙහි දී, ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම පහළ ගොස් ඇති අතර, ඒ අනුව ද.ජා.ආ.හි දක්නට ලැබුණු මෙම වර්ධනය මගින් හුදෙක් පවත්නා මිල අනුව ද.දේ.නි.හි වාර්තා කළ ඉහළ වර්ධනය පිළිබිඹු වේ.

**ඒක පුද්ගල ද.දේ.නි. 2021 වසරේ දී පැවති රුපියල් 794,376 (එ.ජ. ඩොලර් 3,997)ට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් 1,088,667 (එ.ජ. ඩොලර් 3,474)ක් දක්වා වර්ධනය විය.** රුපියල් වටිනාකම අනුව ඒක පුද්ගල ද.දේ.නි.හි ඉහළ යෑම සඳහා පවත්නා මිල අනුව ද.දේ.නි.හි දක්නට ලැබුණු වර්ධනය බලපාන ලද අතර, එ.ජ. ඩොලර් අගය අනුව ගණනය කරන ලද ඒක පුද්ගල ද.දේ.නි. අඩු වීම කෙරෙහි එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම හේතු විය. මේ අතර, 2021 වසරේ දී රුපියල් 776,523 (එ.ජ. ඩොලර් 3,907)ක් ලෙස පැවති ඒක පුද්ගල ද.ජා.ආ. 2022 වසරේ දී රුපියල් 1,060,654 (එ.ජ. ඩොලර් 3,388)ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

## 2.3. ආයතනික අංශයන්හි දායකත්වය

**මූල්‍ය නොවන ආයතනික අංශය 2022 වසරේ දී විශාලතම ආයතනික අංශය ලෙස පවත්නා මිල අනුව සමස්ත දළ එකතු කළ අගයෙන් සියයට 43.6කට දායකත්වය දක්වන ලදී.** ඒ අනුව, මූල්‍ය නොවන ආයතනික අංශය පෙර වසරේ දී වාර්තා කළ සියයට 14.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 38.7කින් වර්ධනය විය. මෙහිදී, කර්මාන්ත කටයුතු සඳහා විශාලතම දායකත්වය මූල්‍ය නොවන ආයතනික අංශයෙන් ලැබුණු අතර, කෘෂිකර්මාන්ත සහ සේවා කටයුතු සඳහා ඉහළම දායකත්වය ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය

**2.3 රූප සටහන**
**2022 වසර තුළදී ආයතනික අංශ අනුව සමස්ත එකතු කළ අගයෙහි ප්‍රතිශතාත්මක දායකත්වය (පවත්නා වෙළෙඳපොළ මිල අනුව) (අ)**




(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**විශේෂ සටහන 4**

## ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය 2015 ලෙස යාවත්කාලීන කිරීම[1]

**හැඳින්වීම**

ආර්ථිකයක මූර්ත අංශයේ ප්‍රවණතා පිළිබිඹු කරන ජාතික ගිණුම් ඇස්තමේන්තු ආර්ථික විශ්ලේෂණවල දී මෙන්ම ප්‍රතිපත්ති සම්පාදනයේ දී ද තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඒ හේතුවෙන්, යම් රටක ආර්ථික සහ මිල ව්‍යුහයේ කාලානුරූපීව සිදුවන වෙනස්කම් නිශ්චිත කාලපරිච්ඡේදයක් තුළ දී සිදුකරනු ලබන පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේද මගින් ජාතික ගිණුම් ඇස්තමේන්තුවලට අනුගත කිරීම අත්‍යවශ්‍ය වේ. මෙම අවශ්‍යතාවය සපුරාලමින් ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය, අතීතයේ දී 1958, 1963, 1975, 1990, 2002, 2010 වසරවලදී සහ මෑතකාලීනව 2015 වසරේ දී යාවත්කාලීන කර ඇත. මෙහිදී, ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම් ඇස්තමේන්තු සකස් කිරීමේ වගකීම දරන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය පෙර පැවති 2010 වසරෙන් 2015 වසරට යාවත්කාලීන කරන ලදී. මෑතකදී සිදුකරන ලද මෙම පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමට සමගාමීව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදන ඉම මෙන්ම ආර්ථික කටයුතුවල ආවරණ පරාසය ද ඉහළ නංවන ලද අතර ජාතික ගිණුම් සකස් කිරීමේ ක්‍රමවේදය වැඩි දියුණු කිරීම සඳහා යම් යම් වෙනස්කම් ද සිදු කරන ලදී.

**නිෂ්පාදන ඉම සහ ආර්ථික කටයුතුවල ආවරණ පරාසය පුළුල් කිරීම**

ජාතික ගිණුම් ඇස්තමේන්තුවල මෑතකදී සිදුකරන ලද පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය තුළ දී බොහෝ ආර්ථික කටයුතුවල ආවරණ පරාසය පුළුල් කර ඇත. මෙහිදී, වසර 2014 සිට 2018 දක්වා කාලය තුළ දී ක්‍රියාත්මක වූ කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගර ව්‍යාපෘතියට අදාළ මුහුදු ප්‍රදේශය ගොඩකිරීමේ කටයුතු එම එක් එක් වර්ෂය තුළ දී නිම කරන ලද ප්‍රතිශතය සැලකිල්ලට ගනිමින් කර්මාන්ත කටයුතු ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීම, ආර්ථික කටයුතුවල ආවරණ පරාසය පුළුල් කිරීමට අදාළව සිදුකරන ලද ප්‍රධානතම වෙනසකි. මෙය 2014-2019 කාලය තුළ දී දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) ඇස්තමේන්තු සහ ඊට අනුරූප ද.දේ.නි.හි වර්ධන අගයයන්ගේ දක්නට ලැබුණු සැලකිය යුතු උච්චාවචනයන්ට හේතු වී ඇත. ඊට අමතරව, මෙම පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය තුළ දී, කෘෂිකාර්මික හා සේවා කටයුතු කිහිපයක ආවරණ පරාසය ද පුළුල් කර ඇත. මෙලෙස ආවරණ පරාසය වැඩි දියුණුවීමත් සමගම නිෂ්පාදන ප්‍රවේශයට අදාළ ද.දේ.නි. ඇස්තමේන්තු, 2010 පදනම් වර්ෂය යටතේ පැවති ආර්ථික කටයුතු 48 ක් වෙනුවට, 2015 පදනම් වර්ෂය යටතේ දී ආර්ථික කටයුතු 49 ක් යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබේ. මෙහිදී, කෘෂිකාර්මික කටයුතුවලට ඇතුළත් *පැළ බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා අදාළ වන ආධාරක කාර්යයන්* වෙන් වෙන් වශයෙන් ඇස්තමේන්තු කිරීම මෙම වෙනසට හේතු වී ඇත. මේ අතර, කෘෂිකාර්මික කටයුතු සැලකීමේදී, *පලතුරු සහ ඔයිල් පාම් වගාවන්, මල් පැළ බෝ කිරීම, ගෘහස්ත ද්‍රව නිෂ්පාදනය* සහ *කෘෂිකාර්මික කටයුතු සඳහා අදාළ වන ආධාරක කාර්යයන්වල* ආවරණ පරාසය වැඩිදියුණු කර ඇත. සේවා කටයුතු ආශ්‍රිතව සලකා බැලීමේදී, *තොරතුරු තාක්ෂණ, ගබඩාකරණ, ගුවන් විදුලි සහ රූපවාහිනී විකාශන, කුරියර් සේවා* සහ *මූල්‍ය සේවා* ආදී කටයුතුවල ආවරණ පරාසය මෙහිදී පුළුල් කර ඇත.

**ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ ක්‍රමවේද වැඩිදියුණු කිරීම සහ නව දත්ත මූලාශ්‍ර භාවිතය**

ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියට සමගාමීව, *කෘෂිකාර්මික කටයුතු සඳහා අදාළ වන ආධාරක කාර්යයන්, වන වගාව, මල් පැළ බෝ කිරීම, නිෂ්පාදන කර්මාන්ත, ඉදිකිරීම්, විදුලිය උත්පාදනය, තොරතුරු තාක්ෂණ සේවා, නවාතැන් සැපයීමේ සේවා, ආහාර පාන සැපයීමේ සේවා* සහ *තොග හා සිල්ලර වෙළඳාම්* වැනි බොහෝ ආර්ථික කටයුතු ඇස්තමේන්තු කිරීමේ ක්‍රමවේද වැඩිදියුණු කර ඇත. තවද, *2013/14 ආර්ථික සංගණනය, තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා සමීක්ෂණය (Information Technology and Information Technology Enabled Services Survey)* සහ කොළඹ කොටස් වෙළඳපොළ තුළ ලියාපදිංචි සමාගම්වලට අදාළ ආදායම් තොරතුරු ද ඇතුළු නව දත්ත මූලාශ්‍ර 2015 පදනම් වර්ෂය යටතේ ඇස්තමේන්තු සම්පාදනය කිරීමේදී භාවිතා කර ඇත. එපමණක් නොව, බොහෝ ආර්ථික කටයුතු සඳහා නව පදනම් වර්ෂයට අනුව ස්ථාවර මිල ගණන් යටතේ ඇස්තමේන්තු සම්පාදනය කිරීමේදී, "ඒක අවධමන ක්‍රමය" *(Single Deflation Method)* වෙනුවට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් "ද්විත්ව අවධමන ක්‍රමය" *(Double Deflation Method)* අනුගමනය කර ඇත.[2]

**ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය 2015 වසරට යාවත්කාලීන කිරීම තුළින් දක්නට ලැබුණු ප්‍රධාන වෙනස්කම්**


පදනම් වර්ෂය යාවත්කාලීන කිරීම ආර්ථිකයේ නිමැවුම (ද.දේ.නි.හි වටිනාකම), ද.දේ.නි.හි වර්ධන වේගය සහ ප්‍රධාන ආර්ථික කටයුතු ද.දේ.නි.ට දක්වන දායකත්වය වැනි බොහෝ

1. "Rebasing of National Accounts Estimates to Base Year 2015" යන මාතෘකාව යටතේ News Survey සඟරාවේ (වෙළුම 42, අංක 3) ප්‍රකාශයට පත් කරන ලද මෙම ලිපියේ සවිස්තරාත්මක පිටපත සකස් කිරීමේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සපයන ලද තොරතුරු සහ ඉතා ප්‍රයෝජනවත් අදහස් දැක්වීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අගය කරනු ලබයි.

2. "ඒක අවධමන ක්‍රමය'' යටතේ, නිමැවුම සහ අතරමැදි යෙදවුම්වල වටිනාකම යන දෙකම එකම මිල දර්ශකයක් භාවිතයෙන් අවධමනය කරනු ලබන අතර, "ද්විත්ව අවධමන ක්‍රමය'' තුළ දී වඩාත් නිවැරදි ව ස්ථාවර මිල අනුව ඇස්තමේන්තු පිළියෙළ කිරීම සඳහා නිමැවුම සහ අතරමැදි යෙදවුම්වල වටිනාකම එකිනෙකට වෙනස් සුදුසු මිල දර්ශක දෙකක් භාවිතා කරමින් අවධමනය කරනු ලැබේ.

2

**රූප සටහන වි.ස. 4.1**
**ස්ථාවර මිල අනුව ද.දේ.නි. ඇස්තමේන්තු සහ වර්ධන වේග සංසන්දනය කිරීම (2010-2021)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික දර්ශක කෙරෙහි බලපා ඇත. පෙර පැවති 2010 පදනම් වර්ෂයේ දත්ත හා සැසඳීමේදී, ස්ථාවර මිල ගණන් යටතේ පදනම් වර්ෂය 2015 වසරට යාවත්කාලීන කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තුවල වටිනාකමෙහි ඉහළ යෑමක් දක්නට ලැබුණු අතර ඒ සඳහා මිල ව්‍යුහයේ වෙනස්වීම් ග්‍රහණය කර ගැනීම උදෙසා 2010 පදනම් වර්ෂය යටතේ පැවති මිල ගණන් 2015 වසරේ මිල ගණන්වලින් යාවත්කාලීන කිරීම මෙන්ම ආර්ථික කටයුතුවල ආවරණ පරාසය පුළුල් කිරීම සහ ඇස්තමේන්තු සම්පාදනය කිරීමේ ක්‍රමවේද වැඩිදියුණු කිරීම හේතු විය. ඒ අනුව, එය ද.දේ.නි.හි අනුරූප වර්ධන අගයයන් කෙරෙහි ද බලපා ඇත. විශේෂයෙන්ම, කොළඹ ජාත්‍යන්තර මූල්‍ය නගර ව්‍යාපෘතියට අදාළ මුහුදු ප්‍රදේශය ගොඩකිරීමේ කටයුතු ජාතික ගිණුම් ඇස්තමේන්තුවලට ඇතුළත් කිරීම 2014-2019 කාලපරිච්ඡේදය තුළ දී ද.දේ.නි.හි වටිනාකම මෙන්ම ද.දේ.නි.හි වර්ධන අගයයන් ද සැලකිය යුතු ලෙස වෙනස් වීමට හේතු වී ඇති අතර එය සංඛ්‍යා සටහන වි.ස. 4.1 සහ රූප සටහන වි.ස. 4.1හි ඉදිරිපත් කර ඇති දත්ත වලින් පිළිබිඹු වේ.


**සංඛ්‍යා සටහන වි.ස. 4.1**
**මෑතකදී සිදුකළ ද.දේ.නි.හි පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලි සංසන්දනය කිරීම**

| | 2002 | 2010 | 2015 |
|---|---|---|---|
| පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. (රු. මිලියන) | 1,636,036.6 | 6,413,668.5 | 11,566,987.4 |
| ද.දේ.නි.හි වටිනාකමෙහි ඉහළ යෑම % (පවත්නා වෙළඳපොළ මිල අනුව) | | 14.4% | 5.6% |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

තවද, පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමත් සමගම කෘෂිකර්මාන්තය, කර්මාන්ත, සේවා සහ භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු (සහනාධාර අඩු කරන ලද පසු) යන ද.දේ.නි.හි ප්‍රධාන සංරචක ද.දේ.නි.ට දක්වන දායකත්වය වෙනස්වී ඇත. ඒ අනුව, රූප සටහන වි.ස. 4.2හි දැක්වෙන පරිදි විශේෂයෙන්ම කර්මාන්ත කටයුතුවල දායකත්වයෙහි ඉහළ යෑමක් සහ සේවා කටයුතු මෙන්ම භාණ්ඩ හා සේවා මත පනවන ලද බදු (සහනාධාර අඩු කරන ලද පසු) යන සංරචකවල දායකත්වයෙහි පහළ යෑමක් දක්නට ලැබේ.

**රූප සටහන වි.ස. 4.2**
**ස්ථාවර මිල අනුව ද.දේ.නි. සඳහා දක්වන දායකත්වය සංසන්දනය කිරීම (2015 සහ 2021)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමට සමගාමීව පවත්නා මිල අනුව ද.දේ.නි. ඇස්තමේන්තුවල වටිනාකම ඉහළ යෑම හේතුවෙන්, *අයවැය හිඟය* සහ *මධ්‍යම රජයේ ණය* වැනි ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශයට පත් කරන සාර්ව ආර්ථික දර්ශක ද සංශෝධනය වී ඇත. සාමාන්‍යයෙන්, ජාතික ගිණුම් ඇස්තමේන්තුවල පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියක් මගින් ප්‍රතිපත්ති සම්පාදකයින්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට වඩා නිවැරදි දත්ත හා තොරතුරු මත පදනම් වූ තීරණ ගැනීම සඳහා පවතින ආර්ථික ව්‍යුහය වඩාත් නිවැරදිව නිරූපණය වන ආර්ථික සංඛ්‍යාලේඛන සපයනු ලබයි. කෙසේ වුව ද, පදනම් වර්ෂය යාවත්කාලීන කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු විශ්ලේෂණය කිරීමේදී, ආර්ථිකය තුළ එක් වරකදී පමණක් වූ සිදුවීම්වලින් ද.දේ.නි. ඇස්තමේන්තු කෙරෙහි ඇතිවන බලපෑම දිගුකාලීනව පවතින සිදුවීම් මගින් ඇතිවන බලපෑම්වලින් වෙන්ව අවබෝධ කර ගැනීම සහ ඊට අනුරූපව ඒවා ඇගැයීම අත්‍යවශ්‍ය වේ.

මූලාශ්‍ර

1. Department of Census and Statistics. Key Findings of Rebased GDP Estimates (Base year 2015). Available at:http://www.statistics.gov.lk/NationalAccounts/StaticalInformation/2015/Reports/Key_findings

2. Thilangani, U.K.T. and Liyanage, D.N. (2022). 'Rebasing of National Accounts Estimates to Base Year 2015', News Survey, vol. 42, no. 03, pp. 2-8, Available at: https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/publications/satahana/News_Survey_2022_03.pdf


සලසන ආයතන අංශයෙන් ලැබුණි. මේ අතර, ගෘහ ඒකක සහ ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය, රාජ්‍ය අංශය සහ මූල්‍ය ආයතන අංශය 2022 වසරේ දී පිළිවෙලින් සියයට 42.5කින්, සියයට 7.1කින් හා සියයට 52.1කින් වර්ධනය විය.

## 2.4. නිමැවුම, ප්‍රතිපත්ති, ආයතනික පහසුකම් සහ ගැටලු

### කෘෂිකර්මාන්තය

**පොහොර සහ අනෙකුත් කෘෂි රසායනික ද්‍රව්‍ය ඇතුළු කෘෂිකාර්මික යෙදවුම්වල පැවති උග්‍ර හිඟය, නිෂ්පාදන පිරිවැය සැලකිය යුතු ලෙස ඉහළ යෑම සහ ඉන්ධන සැපයුමේ පැවති අවහිරතා 2022 වසරේ සමස්ත කෘෂිකාර්මික කටයුතුවල ක්‍රියාකාරිත්වයට බාධාවක් විය.** ඒ අනුව, කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගය 2021 වසරේ වාර්තා කළ සියයට 0.9ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේදී සියයට 4.6කින් පහත වැටුණු අතර, මේ සඳහා ධීවර කටයුතු, වී වගාව සහ සත්ත්ව නිෂ්පාදනවල දක්නට ලැබුනු සැලකියයුතු පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතු විය. මෙයට අමතරව, තේ, එළවළු, වී නොවන ධාන්‍ය සහ රබර් වගා කටයුතු ද වසර තුළ පහත වැටුණි. කෙසේ වුවද, වන වගාව, කෘෂිකර්මය සඳහා වන ආධාරක කාර්යයන්, පොල් ඇතුළුව තෙල් සහිත පලතුරු භෝග වගාව, කුළු බඩු සහ පලතුරු භෝග වගා කටයුතු වසර තුළ දී වර්ධනය විය. එසේම, වසරේ අවසාන කාලපරිච්ඡේදය වන විට කෘෂිකාර්මික යෙදවුම් හා ඉන්ධන යම් ප්‍රමාණයකට පැවති බැවින් සහ හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවල වර්ධනයක් දක්නට ලැබුණි. කෘෂිකාර්මික කටයුතුවල දුර්වල ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කාර්තුමය වශයෙන් පවත්වනු ලබන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ[2] කෘෂිකර්මාන්ත කටයුතුවලට අදාල නිෂ්පාදන සහ ඉල්ලුම යන උප දර්ශක වසර තුළ දී සමස්තයක් ලෙස පහත වැටුණි.

**2.4 රූප සටහන**
**2022 වසරේ කෘෂිකාර්මික කටයුතුවල වර්ධන වේගයන් (අ)**




(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලයං ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය

**කෘෂිකාර්මික අංශයේ නිමැවුම මනිනු ලබන කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශකය[3] 2022 වසරේ දී සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළේය.** සමස්ත කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශකය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2021 වසරේ සියයට 2.1ක වර්ධනයට සාපේක්ෂව, 2022 වසරේ දී සියයට 19.4කින් පහළ ගියේය. දර්ශකයෙහි සමස්ත පහත වැටීම සඳහා වී, තේ, රබර්, සහ පශු සම්පත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ඇතුළු බොහෝ උප දර්ශක දායක වූ අතර, පලතුරු උප දර්ශකය මෙන්ම පොල් උප දර්ශකය පෙර වසරට සාපේක්ෂව වර්ධනයක් පෙන්නුම් කළේය.

2 ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මගින් ද.දේ.නි.හි සංයුතිය අනුව තෝරාගත් ප්‍රධාන ව්‍යාපාරික ආයතන විසින් ලබාදෙන තොරතුරු සම්පිණ්ඩනය කරනු ලබයි.

3 ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සම්පාදනය කළ කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය, 2022 වසරේ සිට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදිත කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශකය මගින් යාවත්කාලීන කර ඇත.

**2.2 සංඛ්‍යා සටහන**
**කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශක**
**(2002 = 100) (අ)**

| අයිතමය | 2021 | 2022 (ආ) | වර්ධන වේගය (%) | |
|---|---|---|---|---|
| | | | 2020/21 | 2021/22 (ආ) |
| **සමස්ත දර්ශකය** | **199.1** | **160.4** | **2.1** | **-19.4** |
| තේ | 96.6 | 81.1 | 7.5 | -16.0 |
| රබර් | 84.9 | 78.3 | -1.7 | -7.8 |
| පොල් | 126.9 | 137.9 | 1.1 | 8.7 |
| වී | 180.1 | 118.6 | 0.6 | -34.1 |
| ධාන්‍ය වර්ග | 1,473.9 | 838.1 | 50.1 | -43.1 |
| වෙනත් ආහාර බෝග | 179.7 | 162.1 | 17.2 | -9.8 |
| එළවළු | 200.4 | 185.5 | -7.2 | -7.4 |
| පලතුරු | 180.0 | 322.4 | -15.5 | 79.1 |
| පශු සම්පත් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 180.1 | 175.2 | 3.5 | -2.7 |
| සුළු අපනයන බෝග | 193.0 | 188.5 | 4.7 | -2.3 |

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සම්පාදනය කරන ලද කෘෂිකාර්මික නිෂ්පාදන දර්ශකය, 2022 වසරේ සිට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදිත කෘෂිකාර්මික නිෂ්පාදන පරිමා දර්ශකය මගින් යාවත්කාලීන කර ඇත.
(ආ) තාවකාලික

මූලයං ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### වී

**පොහොර හිඟය ඇතුළු සැපයුම් අංශයේ දැඩි අවහිරතා මධ්‍යයේ, 2017 වසරෙන් පසු එහි අඩුම වාර්ෂික නිෂ්පාදනය වාර්තා කරමින්, රටේ සමස්ත වී නිෂ්පාදනය 2022 වසරේ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය.** 2021 වසරේ අග භාගයේ දී අකාබනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන ආනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කළද, එම තහනමේ බලපෑම මෙන්ම, අවශ්‍ය පරිදි පොහොර ආනයනය කිරීම සඳහා ප්‍රමාණවත් විදේශ විනිමය නොමැති වීමේ ඒකාබද්ධ බලපෑම සමඟ, රට තුළ උග්‍ර පොහොර හිඟයක් නිර්මාණය වූ අතර, එමගින්, අනෙකුත් කෘෂිකාර්මික අංශ අතර, වී නිෂ්පාදන අංශය කෙරෙහි ද සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. 2021 වසරේ වාර්තා වූ ඉහළ අස්වැන්නෙන් පසුව, වාර්ෂික වී නිෂ්පාදනය, 2022 වසරේ දී මෙට්‍රික් ටොන් මිලියන 3.4ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 34.1කින් පහළ යෑමක් වාර්තා කළේය. මෙය, 2022 වසරේ සමස්ත වී නිෂ්පාදනයෙන් සියයට 57.0ක් වූ 2021/2022 මහ කන්නයේ දී වී අස්වැන්නෙහි සිදු වූ සියයට 36.9ක පහළ යෑමෙහි සහ 2022 වසරේ යල කන්නයේ සිදු වූ වී අස්වැන්න සියයට 30.0කින් පහළ යෑමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. වසර තුළ දී අස්වැන්න නෙළා ගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය හෙක්ටයාර 1,114,246ක් දක්වා සියයට 1.1කින් සුළු වශයෙන් පහළ ගිය අතර, මෙම කන්නවල දී ඵලදායිතාවෙහි සිදු වූ පහළ යෑමෙහි සහ යෙදවුම් හිඟයෙහි සිදු වූ බලපෑම පිළිබිඹු කරමින්, වී නිෂ්පාදනයේ සාමාන්‍යය ඵලදාව, 2021 වසරේ වාර්තා වූ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 4,571ට සාපේක්ෂව 2022 වසරේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 3,045ක් දක්වා පහළ ගියේය. 2022 වසරේ සමස්ත වී නිෂ්පාදනය සහල් මෙට්‍රික් ටොන් මිලියන 2.1කට සමාන වූ අතර, එය ගෘහස්ත සහල් ඉල්ලුමෙන් මාස 11ක් සඳහා පමණ ප්‍රමාණවත් වනු ඇත.[4] දේශීය වෙළඳපොළ තුළ පැවති සහල් හිඟය හේතුවෙන් ඇති වූ මිල පීඩනය මැඩපැවැත්වීම සඳහා සහ ආහාර සුරක්ෂිතතාව තහවුරු කරමින් රටේ සමස්ත සහල් අවශ්‍යතාවය සපුරාලීම සඳහා 2022 වසර තුළ දී, රජය විසින් සහල් ආනයනය කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, පෙර වසරේ ආනයනය කළ සහල් මෙට්‍රික් ටොන් 147,091ට සාපේක්ෂව, 2022 වසරේ දී සහල් මෙට්‍රික් ටොන් 783,420ක් පමණ ආනයනය කර ඇත. කෙසේ වෙතත්, ආනයනික තොග සහ යල කන්නයේ අස්වැන්න ලැබීමත් සමඟ දේශීයව පවතින සහල් තොග ක්‍රමයෙන් ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දෙසැම්බර් 9 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි, වර්ග කිහිපයක් හැර, සහල් ආනයනය කිරීම තහනම් කරන ලදී.

**යෙදවුම් පිරිවැය ඉහළ යෑම මෙන්ම, නිෂ්පාදනය පහළ යෑම, 2022 වසරේ දී, වී සහ සහල් මිල ගණන් ඉහළ යෑමට හේතු විය.** 2021 වසරේ අග භාගයේ සිට දක්නට ලද ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, 2022 වසරේ මුල් භාගයේ දී වී මිල ගණන් තවදුරටත් ඉහළ යෑමක් වාර්තා කළේය. මේ සඳහා හේතු වූයේ 2021/2022 මහ කන්නයේ වී නිෂ්පාදනය පහළ යෑම හේතුවෙන් නිර්මාණය වූ සැපයුම් හිඟය සහ සැපයුම් හිඟය පිළිබඳ වෙළඳපොළ සමපේක්ෂණවල ප්‍රතිඵලයක් ලෙස වී සඳහා ඉල්ලුම ඉහළ යෑමයි. මිල විචලතා අවම කිරීමට සහ ස්ථාවර සැපයුමක් පවත්වා ගැනීම සඳහා, රජය, වී සහ සහල් වෙළඳපොළ වෙත වරින් වර මැදිහත් විය. ඒ අනුව, වී අලෙවි මණ්ඩලයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අනුව 2021/2022 මහ කන්නයේ දී වී මිලදී ගැනීමේ සහතික මිල, සම්බා, නාඩු සහ කීරි සම්බා වී කිලෝග්‍රෑමයක් සඳහා පිළිවෙළින්, රුපියල් 92.00, රුපියල් 90.00 සහ රුපියල් 95.00ක් දක්වා ඉහළ දමන ලදී. 2021/2022 මහ කන්නයේ දී වී මෙට්‍රික් ටොන් 71,280ක් පමණ මිලදී ගැනීමට වී අලෙවි මණ්ඩලයට හැකි විය. තවද, වී නිෂ්පාදන අංශයේ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම සැලකිල්ලට ගනිමින් 2022 වසරේ යල කන්නයේ දී, වී අලෙවි මණ්ඩලය විසින් සම්බා, නාඩු සහ කීරි සම්බා වී කිලෝග්‍රෑමයක් සඳහා මිලදී ගැනීමේ සහතික මිල, පිළිවෙළින්, රුපියල් 125.00, රුපියල් 120.00 සහ රුපියල් 130.00ක් දක්වා ඉහළ දමන ලදී. කෙසේ වෙතත්, වී අලෙවි මණ්ඩලයට වී මිලදී ගැනීම සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති වූ බැවින් නව සහතික මිල යටතේ වී මෙට්‍රික් ටොන් 7,076ක් පමණක් මිලදී ගැනීමට හැකි වූ අතර, ඒ හේතුවෙන් ගොවීන්ට තම වී තොග පෞද්ගලික සහල් මෝල් හිමියන් වෙත අඩු මිලට විකිණීමට සිදු වීමත් සමඟ, 2022 වසරේ අග භාගය වන විට වී මිල ගණන් පහළ ගියේය. කෙසේ වෙතත්, සියලුම වී වර්ගවල සාමාන්‍යය මිල ගණන් 2021 වසරේ දක්නට ලද මිල මට්ටම්වලට වඩා ඉහළ මට්ටමක පැවතුණි. සම්බා වී සඳහා සාමාන්‍ය මිල 2021 වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 65.32ක සිට කිලෝග්‍රෑමයකට රුපියල් 108.69ක් දක්වා 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත

4 මෙම ප්‍රමාණවත් මට්ටම, 2019 වසරේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයෙහි සාමාන්‍ය ගෘහස්ථ සහල් පරිභෝජන ඇස්තමේන්තුව මත පදනම් වේ. කෙසේ වෙතත්, ආපනශාලා සහ හෝටල්, සහල් ආශ්‍රිත ආහාර කර්මාන්ත වැනි අනෙකුත් ප්‍රභවයන් සඳහා වන සහල් ඉල්ලුම බැහැර කිරීම හේතුවෙන්, රටේ සැබෑ සහල් ඉල්ලුම, 2019 වසරේ ගෘහ ඒකක ආදායම් හා වියදම් සමීක්ෂණයෙහි සාමාන්‍ය ගෘහස්ථ සහල් පරිභෝජන ඇස්තමේන්තුවට වඩා කිසියම් දුරකට වැඩි විය හැක.

**2.3 සංඛ්‍යා සටහන**

**වී වගා අංශය පිළිබඳ සංඛ්‍යාන**

| අයිතමය | ඒකකය | 2021 (අ) | | | 2022 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | මහ | යල | එකතුව | මහ | යල | එකතුව |
| වපුරන ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 770 | 501 | 1,272 | 776 | 482 | 1,258 |
| අස්වැන්න නෙළාගන්නා ලද දළ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 762 | 497 | 1,259 | 766 | 480 | 1,246 |
| අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 682 | 445 | 1,127 | 685 | 429 | 1,114 |
| නිෂ්පාදනය | මෙ. ටො. දහස් | 3,061 | 2,088 | 5,150 | 1,931 | 1,462 | 3,393 |
| | බුසල් දහස් | 146,720 | 100,079 | 246,799 | 92,555 | 70,050 | 162,605 |
| හෙක්ටයාරයකට ඵලදාව (ඇ) | හෙක්ටයාරයට කි.ග්‍රෑ. | 4,492 | 4,692 | 4,571 | 2,819 | 3,407 | 3,045 |
| බැංකු අංශය මගින් දෙන ලද ණය ප්‍රමාණය (ඈ) | රුපියල් මිලියන | 8,603 | 4,449 | 13,052 | - | - | 12,454 |
| සහල් ආනයනය (ඉ) | මෙ. ටො. දහස් | - | - | 147 | - | - | 783 |
| සහල් ආනයනයට සමාන වී ප්‍රමාණය (ඉ) | මෙ. ටො. දහස් | - | - | 216 | - | - | 1,152 |


(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) මුළු නිෂ්පාදනය අස්වැන්න නෙළාගන්නා ලද ශුද්ධ බිම් ප්‍රමාණයෙන් බෙදීමෙන් හෙක්ටයාරයකට ඵලදාව ගණනය කර ඇත.
(ඈ) 2022 වසරේ සිට ණය දෙන බැංකු මගින් ලබා දුන් වගා ණය පිළිබඳ දත්ත මහ කන්නය සහ යල කන්නය සඳහා වෙන් වෙන් වශයෙන් ලබා ගත නොහැක.
(ඉ) වාර්ෂික අගය

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 66.4කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, නාඩු වී සඳහා සාමාන්‍ය මිල ද 2021 වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 57.61ක සිට කිලෝග්‍රෑමයකට 103.87ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 80.3කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2022 වසරේ අග භාගය වන විට මිල ගණන්වල සුළු පහළ යෑමක් පැවතිය ද, වී මිල ගණන් හා සමාන ප්‍රවණතාවක් අනුගමනය කරමින්, සහල් වර්ගවල මිල ද 2022 වසර පුරා ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2021 වසරේ, පිළිවෙළින්, කිලෝග්‍රෑමයකට රුපියල් 136.52ක් සහ රුපියල් 116.56ක් වූ සම්බා සහ නාඩු සහල්වල සාමාන්‍ය සිල්ලර මිල, 2022 වසරේ දී පිළිවෙළින්, කිලෝග්‍රෑමයකට රුපියල් 209.19ක් සහ රුපියල් 213.36ක් විය. මේ අතර, සහල් වර්ග සඳහා උපරිම සිල්ලර මිලක් නියම කිරීම සහ දේශීය වෙළඳපොළෙහි සහල් සැපයුම් හිඟය මධ්‍යයේ සහල් සිල්ලර මිලෙහි පවතින අධික උච්චාවචනයන්ට පිළියම් යෙදීම සඳහා සහල් ආනයනය හරහා සැපයුම ඉහළ නැංවීම ඇතුළු වෙළඳපොළ තුළ සහල් සඳහා සිල්ලර මිල ස්ථාවර කිරීමට රජය විසින් පියවර කිහිපයක් ගන්නා ලදී. ඒ අනුව, 2022 වසරේ මැයි මස 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි නාඩු, සම්බා සහ කීරි සම්බා සහල් සඳහා උපරිම සිල්ලර මිල ගණන්, පිළිවෙළින්, කිලෝග්‍රෑමයකට රුපියල් 220.00ක්, කිලෝග්‍රෑමයකට රුපියල් 230.00ක් සහ කිලෝග්‍රෑමයකට රුපියල් 260.00ක් ලෙස නියම කරන ලදී. අඛණ්ඩව පවතින ඉහළ මිල ගණන්වල බලපෑම අවම කිරීම සඳහා, 2023 වසරේ මාර්තු සහ අප්‍රේල් මාසවල දී අඩු ආදායම්ලාභී පවුල් සඳහා මසකට සහල් කිලෝග්‍රෑම් 10 බැගින් බෙදා දීමේ අරමුණු ඇතිව, 2022/2023 මහ කන්නයේ දී ගොවීන්ගෙන් නාඩු වී කිලෝග්‍රෑමයක් රුපියල් 100.00 බැගින් මිලදී ගැනීමේ වැඩසටහනක් රජය විසින් දියත් කරන ලදී.

**කෘෂිකාර්මික අංශයේ දිගු කාලීන ඵලදායිතාව ඉහළ නැංවීමට ප්‍රයත්න දරන අතරම, කෘෂි අංශය මුහුණ දෙන කාලීන ගැටලු විසඳීම සඳහා රජය විසින් 2022 වසරේ දී පියවර කිහිපයක් ක්‍රියාවට නංවන ලදී.** රසායනික පොහොර සහ කෘෂි රසායන ආනයනය තහනම් කිරීම සමග පොහොර ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් ඇතිවන අහිතකර බලපෑම් මෙන්ම, පොහොර ආනයනයට පහසුකම් සැලසීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පවතින සීමිත ද්‍රවශීලතාව පිළිබඳව මනා අවධානය යොමු කරමින්, 2022 වසරේ තෙවන කාර්තුවේ සිට රසායනික පොහොර ලබා දීම සඳහා රජය විසින් කඩිනම් පියවර ගන්නා ලදී. ඒ අනුව, රජය විසින්, 2022 වසරේ යල කන්නයේ වගා කටයුතු සඳහා ඉන්දියානු ණය යෝජනා ක්‍රමය යටතේ යූරියා මෙට්‍රික් ටොන් 65,000ක් ලබා ගත් අතර, 2022 වසරේ යල කන්නයේ දී කිලෝග්‍රෑම් 50ක යූරියා මිටියක් සඳහා රුපියල් 10,000.00ක සහනාධාර මිලක් යටතේ වී ගොවීන් වෙත යූරියා බෙදා හැරීම සිදු කරන ලදී. මීට අමතරව, විවිධ ආධාර වැඩසටහන් සහ ප්‍රදාන හරහා 2022/2023 මහ කන්නය සහ ඉදිරි කන්න සඳහා අවශ්‍ය වන යූරියා, ට්‍රිපල් සුපර් පොස්පේට් (TSP) හෙවත් මඩ පොහොර සහ මියුරියේට් ඔෆ් පොටෑෂ් (MOP) හෙවත් බන්ඩි පොහොර යන පොහොර වර්ග නිසි කලට සැපයීම සහතික කිරීම සඳහා, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ ආහාර හා

**2.5 රූප සටහන**
**සහල්: සැපයුම සහ ඉල්ලුම**




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කෘෂිකර්ම සංවිධානය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන සමඟ කටයුතු ගණනාවක් සිදු කරන ලදී. ඒ අනුව, 2022/2023 මහ කන්නයේ දී වී වගාව සඳහා යූරියා මෙට්‍රික් ටොන් 100,000ක් පමණ ලබා දීමට රජයට හැකි වූ අතර, එය වී නිෂ්පාදන අංශය යථා තත්ත්වයට පත් වීමට සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේය. තවද, දේශීය වශයෙන් වල් නාශකයක් ලෙස ග්ලයිෆොසේට් භාවිතයට අවසර දීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, 2022/2023 මහ කන්නයේ කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය ග්ලයිෆොසේට් ප්‍රමාණ ආනයනය කිරීමට හැකි වන පරිදි මාස හයක කාලයක් සඳහා ග්ලයිෆොසේට් ආනයනය කිරීමට අමාත්‍ය මණ්ඩලය විසින් 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අනුමැතිය ලබා දෙන ලදී. මීට අමතරව, පළිබෝධ සහ රෝග කළමනාකරණය සඳහා ව්‍යාප්ති සේවා කඩිනම් කිරීම මෙන්ම, පොහොර සහ අනෙකුත් කාබනික අතිරේක ද්‍රව්‍ය සැපයීම හරහා, 2022/2023 මහ කන්නයේ ඇතැම් දිස්ත්‍රික්කවල ගොයම් පැළ කහ පැහැ ගැන්වීමට හේතු වූ පෝෂණ ඌනතා මඟහරවා ගැනීමට කඩිනම් පියවර ගන්නා ලදී. මීට අමතරව, ඉහළ ඵලදාවක් සහිත ප්‍රභේද හඳුනාගැනීම සඳහා සහල් ප්‍රභේද පරීක්ෂා කිරීමේ වැඩසටහන් 2022 වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, කෙටි කාලයක් තුළ, ඉහළ අස්වැන්නක් ලබා ගත හැකි සහ නියඟයට ඔරොත්තු දෙන විශේෂ ලක්ෂණ සහිත නව වී ප්‍රභේද හතරක් 2022 වසරේ දී නිකුත් කරන ලදී. මෙම නව ප්‍රභේද හතරෙන් එකක් බිස්කට් නිෂ්පාදනය වැනි කාර්මික අරමුණු සඳහා නිකුත් කරන ලදී. වගා ප්‍රදේශයට විශේෂිත වූ වල් පැළෑටි බිහිවීම පාලනය හරහා වඩාත් ප්‍රශස්ත කෘෂිකාර්මික ක්‍රමයක් වැඩිදියුණු කිරීමේ ප්‍රයත්නයක් ලෙස, බහු වර්ණාවලි ඩ්‍රෝන තාක්ෂණය හරහා, පරීක්ෂණය සඳහා යොදා ගන්නා වී වගා බිම්වල, දක්නට ලැබෙන ප්‍රධාන වල් පැළෑටි ප්‍රභේද හඳුනා ගැනීම සහ එමගින් වී වගාවට වන බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීම සිදු කෙරිණි.

### තේ

**දේශීයව පැවති පොහොර සහ කෘෂි රසායනවල උග්‍ර හිඟයෙහි පසු බලපෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන, 2022 වසරේ දී තේ නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 16.0ක කැපී පෙනෙන පහළ යෑමක් වාර්තා කළේය.** තේ පර්යේෂණායතනය විසින් දිවයිනේ ප්‍රදේශ කිහිපයක තේ ඵලදාව විශාල වශයෙන් පහත වැටීම සම්බන්ධයෙන් සිදු කරන ලද මූලික හේතු විනිශ්චය මගින් රසායනික පොහොර සහ කෘෂි රසායන, විශේෂයෙන් ම යූරියා මත පදනම් වූ පොහොර සහ වල් නාශක ලබා ගත නොහැකි වීම, වසර තුළ වාර්තා වූ ඵලදාව අඩු වීම කෙරෙහි සැලකිය යුතු ලෙස බලපා ඇති බව පෙන්වා දී ඇත. ඒ අනුව සමස්ත තේ නිෂ්පාදනය සඳහා, පිළිවෙළින්, සියයට 22කින්, සියයට 16කින් සහ සියයට 62කින් පමණ දායක වූ උඩරට, මැදරට හා පහතරට තේ නිෂ්පාදනය, 2022 වසරේ දී, පිළිවෙළින්, සියයට 13.8කින්, සියයට 21.2කින් සහ සියයට 15.4කින් පහළ ගියේය. මේ අතර, කුඩා වතු හිමියන්ගේ තේ අස්වැන්නේ සාමාන්‍යය ඵලදාව, 2021 වසරේ දී වාර්තා වූ හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,414 හා සාපේක්ෂව මෙම වසරේ දී හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 1,193ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 15.6කින් පහළ ගියේය. රසායනික පොහොර සහ අනෙකුත් කෘෂිකාර්මික යෙදවුම්වල මිල ඉහළ යෑම සහ එම යෙදවුම්වල දේශීයව පැවති හිඟය මෙන්ම, ඉන්ධන, විදුලිය සහ ජලය ඇතුළු උපයෝගිතාවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ දී තේ අංශයේ නිෂ්පාදන පිරිවැය ඉහළ ගිය අතර, එමගින් ගෝලීය තේ වෙළඳපොළ තුළ රට සතු තරගකාරිත්වයට බාධා පමුණුවා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී තේ සඳහා ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය කිලෝග්‍රෑමයකට රුපියල් 639.00ක් දක්වා රුපියල් 20.00කින් ඉහළ ගියේය.

**2022 වසරේ දී කොළඹ තේ වෙන්දේසියේ තේ මිල ගණන් ඉතිහාසයේ වාර්තා වූ ඉහළම මට්ටම් දක්වා ළඟා වූ අතර, තේ මිල ගණන් වසර මුළුල්ලේම ඉහළ මට්ටමක පැවතුණි.** 2021 වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 619.15ක් වූ තේ මිලෙහි

සාමාන්‍යය, 2022 වසර තුළ දී කිලෝග්‍රෑමයකට රුපියල් 1,270.50ක් දක්වා සියයට 105.2කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ දී උඩරට, මැදරට සහ පහතරට තේ සඳහා වූ සාමාන්‍ය මිල ගණන්, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 94.6ක, සියයට 93.5ක සහ සියයට 110.8ක ඉහළ යෑමක් වාර්තා කළේය. තවද, අමු තේ දලු සඳහා කුඩා වතු හිමියන් ලද මිල ගණන්වල සාමාන්‍යය 2021 වසරේ දී පැවති කිලෝග්‍රෑමයකට රුපියල් 93.67ට සාපේක්ෂව 2022 වසර තුළ දී කිලෝග්‍රෑමයකට රුපියල් 182.07ක් දක්වා සැලකිය යුතු ඉහළ ගියේය. තේ අපනයන මිලෙහි (නැ.වි.ස.) සාමාන්‍යය පෙර වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට ඩොලර් 4.63ට සාපේක්ෂව 2022 වසරේ දී කිලෝග්‍රෑමයකට ඩොලර් 5.03ක් දක්වා සියයට 8.7කින් ඉහළ ගියේය. දේශීය තේ නිෂ්පාදනය පහත වැටීම මධ්‍යයේ කොළඹ තේ වෙන්දේසිය වෙත සපයනු ලැබූ තේ ප්‍රමාණය පහළ යෑම 2022 වසර තුළ දී තේ සඳහා වූ සාමාන්‍ය මිල ගණන් ඉහළ යෑම සඳහා කිසියම් දුරකට හේතු වූ අතර, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් රුපියල් වටිනාකම අනුව මිල වැඩි වීම ද, තේ මිල ඉහළ යෑමට දායකත්වය සැපයීය.

**2022 වසරේ දී, ශ්‍රී ලංකාවේ තේ කර්මාන්තයෙහි ඵලදායිතාව, අගය එකතු කිරීම සහ තරඟකාරිත්වය ඉහළ නැංවීම ඉලක්ක කර ගනිමින් රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාවට නැංවීය.** තේ කර්මාන්තශාලාවලට තම අමු තේ දලු සපයන්නන් සඳහා පොහොර මිලදී ගැනීමට හැකි වන පරිදි සියයට 8.0ක පොලී අනුපාතයකට සහනදායී ණය යෝජනා ක්‍රමයක් ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ආරම්භ කරන ලදී. නිෂ්පාදන ක්‍රියාවලියේ ගුණාත්මක භාවය ඉහළ නැංවීමේ අරමුණින්, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් කර්මාන්තශාලා නවීකරණ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ නවීකරණ කටයුතු සඳහා සහාය වෙමින් 2022 වසර තුළ දී කර්මාන්තශාලා 38ක් සඳහා රුපියල් මිලියන 16.9ක් ලබා දුන්නේය. මීට අමතරව, තේ ඉඩම්වල ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා නැවත වගා කිරීමේ සහනාධාර වැඩසටහන යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් රුපියල් මිලියන 56.4ක් ලබා දුන් අතර, මධ්‍යම පරිමාණ තේ ඉඩම් අක්කර 204ක වාරි ජල විදින පද්ධති සවි කිරීම සඳහා රුපියල් මිලියන 24.5ක සහනාධාරයක් ලබා දෙන ලදී. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් තේ පැළ නැවත සිටුවීමේ සහ නව වගා වැඩ සටහන් මෙන්ම, තේ වගා නැවත නගා සිටුවීමේ සහනාධාර වැඩසටහන්වලට අදාළව ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. 2022 වසරේ දී තේ ඉඩම් හෙක්ටයාර 912ක් නැවත වගා කිරීමට සහ නව ඉඩම් හෙක්ටයාර 408ක් තේ ඉඩම් බවට පරිවර්තනය කිරීමට කටයුතු කරන ලද අතර, තේ ඉඩම්වල පාළු සිටුවීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරන ලදී. කුඩා තේ වතු හිමියන් දැනුම්වත් කිරීමේ ප්‍රයත්නයන්, උපදේශන සේවා හරහා වසර පුරා ක්‍රියාත්මක විය. තේ පර්යේෂණායතනය සිය උපායමාර්ගික සැලැස්මට අනුකූලව පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙන්ම සේවා ව්‍යාපෘති සම්බන්ධයෙන් සිය ක්‍රියාමාර්ග අඛණ්ඩව ඉදිරියට ගෙන ගියේය. ඒ අනුව මෙරට තේ ඉඩම් සඳහා සුදුසු තෝරාගත් තේ අස්වනු නෙළන මෝටර් යන්ත්‍රයක් සංවර්ධනය කිරීම හා හඳුන්වාදීම, නියඟ අවදානම් පවතින ප්‍රදේශවල රෝපණ ද්‍රව්‍ය ප්‍රභවයක් ලෙස වැඩිදියුණු කළ බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා බීජ වගාවන් පිහිටුවීම, තේ වගාවේ ක්ෂුද්‍ර ජීවී ජෛව පළිබෝධනාශක වාණිජකරණය ප්‍රවර්ධනය කිරීම සහ නව තේ ප්‍රභේදවල මව් පඳුරු වගා ප්‍රදේශ ව්‍යාප්ත කිරීම වැනි විශේෂ ව්‍යාපෘති වසර තුළ ක්‍රියාත්මක විය.

### රබර්

**රබර් වගා කරන ප්‍රදේශවල පැවති අයහපත් කාලගුණික තත්ත්වයන්, පොහොර හිඟය සහ පෙස්ටලොටියෝප්සිස් (Pestalotiopsis) රෝගය පැතිරීම යන කරුණුවල ඒකාබද්ධ බලපෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන 2022 වසරේ දී රබර් නිෂ්පාදනය අඛණ්ඩව දෙවන වසරටත් පහළ ගියේය.** 2022 වසරේ දී පොහොර හිඟය හේතුවෙන් නොමේරූ රබර් වගාවන් සඳහා ඇති කළ බලපෑම සැලකිය යුතු මට්ටමක පැවති අතර, එමගින් ගස් වර්ධනය අඩාල වීම නිසා කිරි කැපීමේ අදියර ප්‍රමාද වන අතර, ඉදිරි කාලය තුළ එම රබර් ඉඩම්වල ඵලදායිතාව අඩු විය හැක. තවද, කෘෂිරසායන ද්‍රව්‍ය හිඟය හේතුවෙන් වසර තුළ දී පෙස්ටලොටියෝප්සිස් රෝගය රබර් වගාවන් තුළ දරුණු ලෙස ව්‍යාප්ත වීම සමඟ රබර් වගාවන් හෙක්ටයාර් 40,000කට පමණ ඉන් බලපෑම් ඇති වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඵලදාව සියයට 0-10 දක්වා අඩු විය. ඒ අනුව, 2022 වසරේ සමස්ත රබර් නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත කිලෝග්‍රෑම් මිලියන 70.9ක් දක්වා සියයට 7.8කින් පහළ ගියේය. රබර් නිෂ්පාදනයේ ප්‍රධාන කාණ්ඩ අතුරින්, සමස්ත රබර් නිෂ්පාදනයෙන් සියයට 49.0කට දායක වන ෂීට් රබර් නිෂ්පාදනය සියයට 9.6ක පසුබෑමක් වාර්තා කළ අතර, අනෙකුත් කාණ්ඩවල රබර් නිෂ්පාදනය 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී සියයට 11.7ක

### 2.4 සංඛ්‍යා සටහන
## ප්‍රධාන කෘෂි බෝගවල උපනති

| අයිතමය | ඒකකය | 2021 (අ) | 2022 (ආ) | වාර්ෂික වෙනස්වීම (%) | |
|---|---|---|---|---|---|
| | | | | 2020/21 (අ) | 2021/22 (ආ) |
| 1. තේ | | | | | |
| 1.1 නිෂ්පාදනය (ඇ) | කි.ග්‍රෑ. මිලියන | 299.5 | 251.5 | 7.4 | -16.0 |
| - පහතරට | කි.ග්‍රෑ. මිලියන | 183.2 | 155.0 | 7.8 | -15.4 |
| - මැදරට | කි.ග්‍රෑ. මිලියන | 51.0 | 40.2 | 9.1 | -21.2 |
| - උඩරට | කි.ග්‍රෑ. මිලියන | 65.3 | 56.3 | 5.0 | -13.8 |
| 1.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 267 | 267 | 0.3 | 0.2 |
| 1.3 දලු කැඩීම සිදු කරන ලද බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 267 | 267 | 0.3 | 0.2 |
| 1.4 නිෂ්පාදන පිරිවැය (ඈ) | රුපියල්/කි.ග්‍රෑ. | 618.49 | 638.99 | 13.2 | 3.3 |
| 1.5 සාමාන්‍ය මිල | | | | | |
| - කොළඹ වෙන්දේසිය | රුපියල්/කි.ග්‍රෑ. | 619.15 | 1,270.50 | -2.3 | 105.2 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 920.76 | 1,643.11 | 6.2 | 78.5 |
| 1.6 නැවත වගා කිරීම | හෙක්ටයාර | 1,123 | 1,239 | 38.3 | 10.3 |
| 1.7 අලුතින් වගා කිරීම | හෙක්ටයාර | 696 | 476 | 61.9 | -31.6 |
| 1.8 එකතු කළ අගය (ඉ) | ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් | 0.6 | 0.5 | 4.8 | -8.8 |
| 2. රබර් | | | | | |
| 2.1 නිෂ්පාදනය | කි.ග්‍රෑ. මිලියන | 76.9 | 70.9 | -1.7 | -7.8 |
| - ෂීට් රබර් | කි.ග්‍රෑ. මිලියන | 38.4 | 34.8 | -1.7 | -9.6 |
| - ක්‍රේප් රබර් | කි.ග්‍රෑ. මිලියන | 13.9 | 14.5 | 7.4 | 3.9 |
| - වෙනත් | කි.ග්‍රෑ. මිලියන | 24.5 | 21.7 | -6.2 | -11.7 |
| 2.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 139 | 139 | 0.6 | -0.1 |
| 2.3 කිරි කපන ලද බිම් ප්‍රමාණය (ඊ) | හෙක්ටයාර දහස් | 113 | 107 | -6.1 | -5.9 |
| 2.4 නිෂ්පාදන පිරිවැය | රුපියල්/කි.ග්‍රෑ. | 221.00 | 288.00 | 3.5 | 30.3 |
| 2.5 සාමාන්‍ය මිල | | | | | |
| - කොළඹ වෙන්දේසිය (RSS 1) | රුපියල්/කි.ග්‍රෑ. | 460.78 | 595.00 | 31.1 | 29.1 |
| - අපනයන (නැ.වි.ස.) | රුපියල්/කි.ග්‍රෑ. | 540.77 | 841.72 | 52.8 | 55.7 |
| 2.6 නැවත වගා කිරීම (ඊ) | හෙක්ටයාර | 1,522 | 1,264 | 55.9 | -16.9 |
| 2.7 අලුතින් වගා කිරීම (ඊ) | හෙක්ටයාර | 1,188 | 489 | 58.2 | -58.9 |
| 2.8 එකතු කළ අගය (ඉ) | ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් | 0.2 | 0.2 | 2.6 | 1.2 |
| 3. පොල් | | | | | |
| 3.1 නිෂ්පාදනය | ගෙඩි මිලියන | 3,120 | 3,391 | 11.7 | 8.7 |
| - දිසිදි පොල් | ගෙඩි මිලියන | 298 | 314 | 31.8 | 5.2 |
| - පොල් තෙල් | ගෙඩි මිලියන | 211 | 445 | 340.6 | 110.7 |
| - වෙනත් | ගෙඩි මිලියන | 2,607 | 2,628 | 3.6 | 0.8 |
| 3.2 මුළු වගා බිම් ප්‍රමාණය | හෙක්ටයාර දහස් | 505 | 505 | 0.2 | 0.0 |
| 3.3 නිෂ්පාදන පිරිවැය | ගෙඩියකට රුපියල් | 26.96 | 27.21 | 23.6 | 0.9 |
| 3.4 සාමාන්‍ය මිල | | | | | |
| - නිෂ්පාදක මිල | ගෙඩියක් රුපියල් | 71.88 | 74.86 | 17.7 | 4.1 |
| - අපනයන (නැ.වි.ස.) (උ) | ගෙඩියක් රුපියල් | 65.36 | 84.54 | 24.2 | 29.3 |
| 3.5 නැවත වගා කිරීම/ යටි වගාව (ඌ) | හෙක්ටයාර | 4,709 | 5,481 | -11.7 | 16.4 |
| 3.6 අලුතින් වගා කිරීම (එ) | හෙක්ටයාර | 9,622 | 13,913 | 20.3 | 44.6 |
| 3.7 එකතු කළ අගය (ඉ) | ද.දේ.නි. ප්‍රතිශතයක් වශයෙන් | 0.8 | 0.9 | 7.4 | 17.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) හරිත තේ ඇතුළුව
(ඈ) අමු තේ දලු සැපයුම්කරුවන්ගේ ලාභාංශද ඇතුළත් වේ
(ඉ) වගා කිරීම සහ සැකසුම් කටයුතු සිදු කළ ප්‍රමාණය පමණි
(ඊ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගා සහන යෝජනා ක්‍රමය අනුව වගා කළ බිම් ප්‍රමාණය
(උ) ප්‍රධාන පොල් මද නිෂ්පාදන තුන සඳහා පමණි
(ඌ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් දෙනු ලබන වගා සහනාධාර ක්‍රමය යටතට අයත් ඉඩම් පමණක් ආවරණය වේ
(එ) පොල් වගා කිරීමේ මණ්ඩලය විසින් බෙදා හරින ලද බීජ පැළ සංඛ්‍යාව අනුව අලුතින් වගා කළ බිම් ප්‍රමාණය ගණනය කර ඇත. මෙහිදී පොල් බීජ පැල 158ක් සඳහා හෙක්ටයාර එකක් යනුවෙන් අනුපාතය යොදා ගෙන ඇත.

මූලයන්: ශ්‍රී ලංකා තේ මණ්ඩලය
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
වැවිලි අමාත්‍යාංශය
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව
පොල් වගා කිරීමේ මණ්ඩලය
පොල් සංවර්ධන අධිකාරිය
කොළඹ තේ තැරැව්කරුවන්ගේ සංගමය
ලංකා වාණිජ මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

පහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2022 වසර තුළ දී ක්‍රේප් රබර් නිෂ්පාදනය සියයට 3.9ක වර්ධනයක් වාර්තා කළේය. 2022 වසරේ දී දේශීය රබර් මිලෙහි කැපී පෙනෙන ඉහළ යෑමක් සිදු වුවද, රබර් අංශයේ ඵලදායිතාව සහ කිරි කැපීමේ සීමා හේතුවෙන් රබර් නිෂ්පාදනයේ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ගැනීම දුෂ්කර වී ඇත. මේ අතර, රබර් කිරි කැපීමේ දින ගණන් අඩුවීම හේතුවෙන් 2022 වසරේ දී රබර් වගාවේ සාමාන්‍යය ඵලදාව, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, හෙක්ටයාරයකට කිලෝග්‍රෑම් 665ක් දක්වා සියයට 2.1කින් පහළ ගියේය. රබර් නිෂ්පාදන පිරිවැය මෑත වසර කිහිපය තුළ දී ඉහළ යමින් පැවති අතර, 2022 වසර අවසන් වන විට එය කිලෝග්‍රෑමයකට රුපියල් 288.00ක් දක්වා පෙර වසරට සාපේක්ෂව සියයට 30.3ක ඉහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ දී, කාර්මික අංශයේ දේශීය අමු රබර් පරිභෝජනය කිලෝග්‍රෑම් මිලියන 117.3ක් දක්වා සියයට 12.4කින් පහළ ගිය අතර, කොවිඩ්-19 වසංගතය පහව යෑමත් සමඟ දේශීය හා ගෝලීය වෙළඳපොළ තුළ වෛද්‍ය අත්වැසුම් සඳහා ඇති ඉල්ලුම අඩුවීම එයට කිසියම් දුරකට හේතු විය.

**2022 වසරේ පළමු භාගය තුළ ගෝලීය වෙළඳපොළ තුළ පැවති හිතකර ඉල්ලුම හේතුවෙන්, කොළඹ රබර් වෙන්දේසිය තුළ රබර් වර්ග බොහොමයක මිල ගණන් ඉතිහාසයේ වාර්තා වූ ඉහළම මට්ටමකට ළඟා විය.** 2022 වසරේ දී, කොළඹ රබර් වෙන්දේසියේ, දුම් ගැසූ දාර ෂීට් රබර් (RSS1) මිලෙහි වාර්ෂික සාමාන්‍යය, 2021 වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 460.78 සිට රුපියල් 595.00ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 29.1කින් ඉහළ ගිය අතර, ලේටෙක්ස් ක්‍රේප් රබර් මිලෙහි සාමාන්‍යය කිලෝග්‍රෑමයකට රුපියල් 626.32 සිට රුපියල් 903.27ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 44.2කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් දේශීය හා ගෝලීය වෙළඳපොළ තුළ රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා පවතින දුර්වල ඉල්ලුම හේතුවෙන් වසරේ අග භාගය වන විට රබර් මිල ගණන් පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2022 වසර අවසානය වන විට දුම් ගැසූ දාර ෂීට් රබර් (RSS1) සහ ලේටෙක්ස් ක්‍රේප් රබර් වෙන්දේසි මිල ගණන්වල සාමාන්‍යය, පිළිවෙළින්, කිලෝග්‍රෑමයකට රුපියල් 517.67ක් සහ රුපියල් 628.33ක් විය. රබර්වල අපනයන මිලෙහි (නැ.වි.ස.) සාමාන්‍යය, පෙර වසරේ වාර්තා වූ කිලෝග්‍රෑමයකට එ.ජ. ඩොලර් 2.72ක සිට 2022 වසරේ දී එ.ජ. ඩොලර් 2.73ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

**2022 වසර තුළ දී, රබර් අංශයේ ඵලදායිතාව සහ අගය එකතු කිරීම් කටයුතු වැඩිදියුණු කිරීම සඳහා වූ උපාය මාර්ග අඛණ්ඩව ක්‍රියාත්මක විය.** රබර් අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීමේ සිය ප්‍රයත්නය වෙනුවෙන් රබර් පර්යේෂණ ආයතනය විසින් වසර තුළ දී පර්යේෂණ අධ්‍යයනයන් කිහිපයක් සිදු කරන ලදී. වසර තුළ දී, විශේෂයෙන් ම සාම්ප්‍රදායික නොවන රබර් වගා ප්‍රදේශවල, නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ ශ්‍රම හිඟතාවයට විසඳුම් ලබා දීමේ අරමුණින්, දින කිහිපයකට වතාවක් අස්වනු නෙළීමේ ක්‍රම අනුගමනය කිරීම පිළිබඳ පර්යේෂණ සිදු කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කුඩා වතු හිමියන්ට සහ වතු සමාගම්වලට අයත් රබර් ඉඩම් දළ වශයෙන් හෙක්ටයාර් 1,600ක් 'දින හතරකට වරක් කිරි කැපීමේ ක්‍රමයට' පරිවර්තනය කරන ලදී. පත්‍ර රෝග හේතුවෙන් ඵලදාවේ සිදුවන සැලකිය යුතු පහළ යෑම් වැළැක්වීමේ ප්‍රයත්නයක් ලෙස පත්‍ර රෝගවලට එරෙහිව ප්‍රතිරෝධී ක්ලෝන හඳුනාගැනීම සඳහා ක්ලෝන පරීක්ෂා කිරීම 2022 වසරේ දී අවසන් කරන ලද අතර, තිරසාර රබර් වගාවක් සහතික කිරීම සඳහා දේශගුණයට ඔරොත්තු දෙන ක්ලෝන හඳුනාගැනීමේ ක්‍රියාමාර්ග ද ක්‍රියාවට නැංවිණි. මොණරාගල, මීද්දෙණිය, මතුගම, හොරණ, බුලත්සිංහල, කළුතර, කෑගල්ල සහ රත්නපුර යන ප්‍රදේශ ආවරණය වන පරිදි රබර් වගා කරන ප්‍රදේශ කිහිපයක, පොහොර අඩු වේගයකින් පසට අවශෝෂණය කරවීමේ ක්‍රමවේද (slow-release fertiliser techniques) සහ පැළවල පෝෂණ ගුණය ඉහළ නැංවීමේ ක්‍රමවේද පිළිබඳව රබර් වගා කරන්නන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. තවද, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව වසර තුළ දී නව වගා සහ නැවත වගා කිරීම් හරහා රබර් වගා ව්‍යාප්තිය පුළුල් කිරීමේ නිරත විය. රබර් නව වගා කිරීමේ වැඩසටහන් යටතේ උතුරු පළාතේ මුලතිව් දිස්ත්‍රික්කයෙහි ප්‍රථමයෙන් ස්ථාපිත කරන ලද රබර් වගාවෙහි රබර් කිරි කැපීම 2022 වසරේ දී ආරම්භ කරන ලදී. විවිධ රබර් ආශ්‍රිත අතුරු බෝග පද්ධති ප්‍රචලිත කිරීමට මෙන්ම ප්‍රයෝජනයට නොගත් ඉඩම්වල බෝග විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීමටද ආදර්ශ වගා බිම් වැඩසටහන් හරහා කටයුතු කරන ලදී. මේ අතර, වගා පිරිවැය ඉහළ යෑම මධ්‍යයේ, සහනාධාර අරමුදල් ප්‍රමාණය වෙනස් කිරීමකින් තොරව අරමුදල් සපයන වාරික ගණන අටේ සිට පහ දක්වා අඩු කරමින් 2022 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත වගා කිරීම සහ නව වගාකිරීම සඳහා වන සහනාධාර යෝජනා ක්‍රම සංශෝධනය කරන ලදී. ශ්‍රී ලංකා ජාතික

2

විද්‍යා පදනමේ මූල්‍ය අනුග්‍රහය ඇතිව, රබර් කඳ නිසි ලෙස කළමනාකරණය කිරීම තුළින් තිරසාර අස්වනු නෙලීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. මේ අතර, දේශීය රබර් නිෂ්පාදන ගෝලීය අගය දාමයට මුහු කිරීම ශක්තිමත් කිරීම උදෙසා රබර් අංශයේ අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින්, කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යවසායකයින් මෙන්ම, කුඩා රබර් වතු හිමියන් ඉලක්ක කර ගනිමින් රබර් ආශ්‍රිත නිෂ්පාදනයන් පිළිබඳ පුහුණු වැඩසටහන් වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.

### පොල්

**2021 සහ 2022 වසරවල දී පැවති හිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් 2022 වසරේ දී පොල් අංශය මෙතෙක් වාර්තා වූ එහි ඉහළම වාර්ෂික නිෂ්පාදනය වාර්තා කළේය.** ඒ අනුව, 2021 වසරේ වාර්තා වූ සියයට 11.7ක කැපී පෙනෙන වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 8.7ක වර්ධනයක් වාර්තා කරමින්, සමස්ත පොල් ගෙඩි නිෂ්පාදනය ගෙඩි මිලියන 3,391ක් දක්වා ඉහළ ගියේය. 2021 වසරේ සිට ප්‍රමාණවත් ලෙස ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් ලැබීම සහ ප්‍රධාන පොල් වගා කරන ප්‍රදේශයන්හි පැවති හිතකර වායුගෝලීය උෂ්ණත්වය පොල් නිෂ්පාදනයේ වර්ධනය සඳහා බොහෝ දුරට සහාය විය. මෙම හිතකර තත්ත්වයන්ගේ බලපෑම මගින් 2022 වසරේ දී පොල් වගාව සඳහා රසායනික පොහොර යෙදීම සීමාවීමෙහි අහිතකර බලපෑම මැඩපැවැත්විණි. ගෙඩි නිෂ්පාදනය ඉහළ යෑමත් සමඟම වසර තුළ දී පොල් ආශ්‍රිත නිෂ්පාදනවල ද ඉහළ යෑමක් දක්නට ලැබුණි. ඒ අනුව, දිසිදි පොල් නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 33,289 සිට මෙට්‍රික් ටොන් 35,030 දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 5.2කින් ඉහළ ගියේය. පොල්තෙල් සහ පාම් තෙල් යන දෙවර්ගයම සඳහා ආනයන සීමා පැනවීම සහ තෙල් නිෂ්පාදනය සඳහා ප්‍රමාණවත් පරිදි පොල් ගෙඩි පැවතීමෙහි බලපෑම පිළිඹිබු කරමින් පොල්තෙල් නිෂ්පාදනය 2022 වසරේදී මෙට්‍රික් ටොන් 68,590 දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 59.4කින් ඉහළ ගියේය. පිටිකළ පොල් කිරි නිෂ්පාදනය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 15.8කින් ඉහළ ගිය අතර, පොල් ක්‍රීම් සහ පොල් කිරි නිෂ්පාදන, පිළිවෙළින්, සියයට 12.5කින් සහ සියයට 0.9කින් පහළ යෑමක් වාර්තා කළේය. 2022 වසරේ දී පොල් නිෂ්පාදන අංශයේ කාර්යසාධනය ඉහළ ගියද, 2022 වසරේ දී ප්‍රමාද වී පොහොර යෙදීම සහ ප්‍රමාණවත් ලෙස රසායනික පොහොර නොයෙදීමේ පසු බලපෑම නුදුරු අනාගතයේ දී පොල් අස්වැන්න කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය. කෙසේ වෙතත්, 2022 වසර මුළුල්ලේ පැවති හිතකර වර්ෂාපතනයේ පසු බලපෑම මගින් පොහොර ප්‍රමාණවත් පරිදි නොයෙදීමේ අහිතකර ප්‍රතිවිපාක සමනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**පොල් නිෂ්පාදනය ඉහළ ගියද, 2022 වසර තුළ පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනවල මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි.** 2022 වසරේ දී, පොල් ගෙඩියක සිල්ලර මිලෙහි සාමාන්‍යය, ගෙඩියකට රුපියල් 91.36ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 8.9කින් ඉහළ ගිය අතර, 2022 වසරේ අග භාගය වන විට ගෙඩියක මිල රුපියල් 100.00 ඉක්මවමින්, පොල් සඳහා මෙතෙක් වාර්තා වූ ඉහළම මිල වාර්තා විය. කොළඹ පොල් වෙන්දේසියේ පොල් ගෙඩියක සාමාන්‍ය වෙන්දේසි මිල 2021 වසරේ වාර්තා වූ ගෙඩියකට රුපියල් 56.51 සිට සියයට 6.4ක වර්ධනයක් වාර්තා කරමින් 2022 වසරේ දී ගෙඩියකට රුපියල් 60.14ක් ලෙස සටහන් විය. දේශීය වෙළඳපොළෙහි දිසිදි පොල් මිල ද කිලෝග්‍රෑමයකට රුපියල් 538.75ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 0.3කින් සුළු වශයෙන් ඉහළ ගියේය. පොල්තෙල් මිලි ලීටර් 750ක බෝතලයක මිල, 2021 වසරේ දී වාර්තා වූ සියයට 29.2ක ඉහළ යෑමට සාපේක්ෂව, 2022 වසරේ දී රුපියල් 520.19ක් දක්වා සියයට 17.3කින් ඉහළ ගියේය. තවද, දේශීය නිෂ්පාදනය ඉහළ යෑමෙහි හිතකර බලපෑම පිළිබිඹු කරමින්, 2022 වසරේ දී දිසිදි පොල්, පොල්තෙල් සහ කොප්පරාවල මුළු අපනයන ප්‍රමාණය සහ වටිනාකම කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය.

**පොල් නිෂ්පාදන අංශය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවමින්, එම අංශයේ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා රජය විසින් 2022 වසර තුළ දී අඛණ්ඩව ප්‍රයත්න දරන ලදී.** ඒ අනුව, දැනට පවතින පොල් ඉඩම්වල ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා ඉහළ අස්වැන්නක් ලබා දෙන පොල් වගා ප්‍රභේද ලබාදීමට පොල් වගා කිරීමේ මණ්ඩලය පියවර කිහිපයක් ආරම්භ කළේය. ඉහළ අස්වැන්නක් ලබා දෙන 'කප්සුවය' දෙමුහුන් පොල් වගා ප්‍රභේදයෙහි පැළ නිෂ්පාදනය සඳහා නව බීජ පොල් නිෂ්පාදන වගාවක් සංවර්ධනය කිරීමට අදාළ කටයුතු වසර තුළ දී සිදු කෙරුණු අතර, 'කප්රුවන' දෙමුහුන් ප්‍රභේදය නිෂ්පාදනය කිරීම සඳහා වූ පරාගනය වැඩසටහන සහ කිනියාම බීජ වගාවෙහි පාළු සිටුවීම ද හලාවත වැවිලි සමාගම සමඟ

එක්ව සිදු කරන ලදී. සහනදායී මිලකට පොල් පැළ සැපයීම, පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම, නැවත වගා කිරීම, යටි වගා කිරීම සහ අලුතින් වගා කිරීම සඳහා වන සහනාධාර ඇතුළු සහනාධාර යෝජනා ක්‍රම කිහිපයක් 2022 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2022 වසරේ දී සුදු මැස්සන්ගේ පළිබෝධ හානිය තීව්‍ර වීමත් සමඟ දංකොටුව, නාත්තන්ඩිය, වෙන්නප්පුව ඇතුළු ප්‍රදේශවල සුදු මැස්සන්ගේ බලපෑමට ලක් වූ පොල් වගාවන්ගේ හානිය පාලනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් දියත් කළ අතර, වසර තුළ දී රසායනික ද්‍රව්‍ය සහ ජෛව රසායනික ද්‍රව්‍ය භාවිතයෙන් සුදු මැස්සන් රෝගය පාලනය කිරීම සඳහා නිර්දේශයන් නිකුත් කරන ලදී. තවද, පොල් සැකසුම් කර්මාන්තශාලාවල අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා අවශ්‍ය ඉන්ධන සැපයීම මගින් එම කර්මාන්තශාලාවලට ඉන්ධන හිඟය මගින් සිදු වූ බලපෑම අවම කිරීමට පියවර ගන්නා ලදී. මේ අතර, 'සිලෝන් කොකනට්' (Ceylon Coconut) සන්නාමයෙහි ගෝලීය ව්‍යාප්තිය පුළුල් කිරීමට අදාළ පියවරයන් ක්‍රියාත්මක වූ අතර, එමගින් පොල් කර්මාන්තයේ අගය එකතු කිරීම් ප්‍රවර්ධනය කෙරෙන අතර, ඒ තුළින් රටේ පොල් කර්මාන්තය සඳහා ගෝලීය වෙළඳපොළ තුළ වැඩි වශයෙන් අවස්ථා නිර්මාණය වනු ඇත.

### සුළු අපනයන බෝග

**දේශීය සැපයුම් දාමවල සහ පොහොර සුලබතාවය පිළිබඳව ගැටලු මධ්‍යයේ වුවද, 2022 වසරේ දී සුළු අපනයන බෝග නිෂ්පාදනය අඛණ්ඩව වර්ධනය විය.** අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාවකාලික ඇස්තමේන්තුවලට අනුව, සුළු අපනයන බෝග නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 143,165ක සිට මෙට්‍රික් ටොන් 186,962ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 30.6ක කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. ඉහළ ගෝලීය ඉල්ලුම් තත්ත්වයක් තුළ දේශීය මිල ඉහළ යෑම පාලනය කර ගැනීමට සහ ගෙවුම් ශේෂ අර්බුදය මධ්‍යයේ ආනයන වියදම සීමා කිරීම සඳහා පියවරක් ලෙස සුළු අපනයන බෝග කිහිපයක් මත පනවා ඇති ආනයන සීමා අඛණ්ඩව පවත්වාගෙන යෑමට රජය ගත් තීරණය සමඟ ගොවීන් සක්‍රීයව වගාවට යොමු වීමෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම අංශයේ නිෂ්පාදනය සැලකිය යුතු ලෙස වර්ධනය විය. 2022 වසරේ දී කුරුඳු, කරාබු නැටි, එනසාල්, කෝපි, කොකෝවා, සාදික්කා, පුවක් සහ බුලත් නිෂ්පාදන වර්ධනයන් වාර්තා කළ අතර, ගම්මිරිස් නිෂ්පාදනය පහළ ගියේය. මෙම අංශයේ සමස්ත අපනයන ප්‍රමාණය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 7.0කින් පහළ ගිය අතර, රුපියල් වටිනාකම අනුව අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 44.8කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. 2022 වසරේ දී කුරුඳු අපනයනයෙන් ලද ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 50.1කින් පමණ සැලකිය යුතු ලෙස වර්ධනය වූ අතර, සුළු අපනයන බෝග අංශයේ සමස්ත අපනයන ආදායමේ වර්ධනය සඳහා එය විශාල වශයෙන් දායක විය.

**සුළු අපනයන කෘෂිකර්මාන්තයේ කාර්යසාධනය ඉහළ නංවාලීම සඳහා රජය විසින් ක්‍රියාමාර්ග කිහිපයක් අනුගමනය කරන ලදී.** ඒ අනුව 2022 වසරේ දී, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් ගණනාවකගේ සහයෝගය ඇතිව, ශ්‍රී ලංකාවේ කුරුඳු සඳහා යුරෝපා කොමිසම වෙතින් භූගෝලීය දර්ශක සහතිකය (Geographical Indication Certification) ලබා ගැනීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී. මෙමගින් කුරුඳුවල ලංකාවට සුවිශේෂී ගුණාංග පිළිබඳ ලොව පුරා පිළිගැනීම වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරනු ලබයි. තවද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුරය, පොළොන්නරුව, අම්පාර, වව්නියාව සහ යාපනය වැනි සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල අපනයන කෘෂිකර්ම බෝග වගාව ව්‍යාප්ත කිරීම සඳහා පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කරන ලදී. මේ අතර, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම හඳුනාගත් ප්‍රදේශවල වගා බිම් ප්‍රමාණය ව්‍යාප්ත කිරීමේ අරමුණින් ගම්මිරිස්, පුවක්, ඉඟුරු, කහ සහ බුලත් වැනි සුළු අපනයන බෝග හඳුන්වා දීම අරමුණු කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවන ලදී. නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් කාබනික වගාව හඳුන්වාදීම සහ එය ප්‍රචලිත කිරීම, යහපත් කෘෂිකාර්මික පිළිවෙත් සහ යහපත් නිෂ්පාදන පිළිවෙත් හඳුන්වා දීම 2022 වසරේ දී සිදු කරන ලදී.

### වෙනත් ක්ෂේත්‍ර බෝග

**2021 වසරේ දී වාර්තා කළ ඉහළ අස්වැන්නට අනතුරුව, වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය කැපී පෙනෙන ලෙස පහත වැටුණු අතර, දේශීය වශයෙන් පොහොර සහ අනෙකුත් කෘෂි රසායනික ද්‍රව්‍ය හිඟවීම සහ සැපයුම් දාමයන්වලට ඇති වූ අවහිරතා ඒ සඳහා බොහෝ සෙයින් හේතු විය.** පොහොර සහ අනෙකුත් කෘෂි රසායනික ද්‍රව්‍ය හිඟවීම හේතුවෙන් වෙනත් ක්ෂේත්‍ර බෝගවල දේශීය නිෂ්පාදනය පහත වැටුණු

අතර, බොහෝ දුරට එම හිඟය ආනයන මගින් සැපයීම හේතුවෙන් 2022 වසරේ රටේ ආනයන වියදම මත එයින් පීඩනයක් ඇති විය. ඒ අනුව, 2022 වසරේ දී, වෙනත් ක්ෂේත්‍ර බෝගවල සමස්ත නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 526,803ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 37.5කින් පහත වැටුණු අතර, එය 2021/2022 මහ කන්නයේ නිෂ්පාදනයෙහි වාර්තා වූ සියයට 37.8ක පහළ යෑම සහ 2022 වසරේ යල කන්නයේ නිෂ්පාදනයේ වාර්තා වූ සියයට 36.8ක පහළ යෑමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. කෘෂිකාර්මික යෙදවුම්වල හිඟය සහ ඉහළ පිරිවැය හේතුවෙන් 2021 වසරට සාපේක්ෂව බඩ ඉරිඟු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 259,040ක් දක්වා සියයට 45.2කින් කැපී පෙනෙන ලෙස පහළ ගියේය. දේශීය බඩ ඉරිඟු නිෂ්පාදනය පහත වැටීමත් සමඟ, සත්ත්ව ආහාර කර්මාන්තයේ ඇති වූ ධාන්‍ය හිඟය සපුරාලීම සඳහා බඩ ඉරිඟු ආනයනය කිරීමට සිදු වූ අතර, 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 22,724ට සාපේක්ෂව 2022 වසරේ දී මෙට්‍රික් ටොන් 190,686ක් දක්වා බඩ ඉරිඟු ආනයනය ඉහළ ගියේය. 2022 වසරේ දී අර්තාපල් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 47,614ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 37.3කින් පහළ ගිය අතර, 2021 වසරට සාපේක්ෂව අර්තාපල් ආනයන සියයට 31.8කින් ඉහළ ගියේය. තවද, 2022 වසරේ දී ලොකු ළූණු නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 17,799ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 73.0කින් කැපී පෙනෙන ලෙස පහළ ගිය අතර, ලොකු ළූණු ආනයන මෙට්‍රික් ටොන් 263,781ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 2.5කින් ඉහළ ගියේය. එසේම, කුරක්කන්, කව්පි සහ සෝයා බෝංචි වැනි වෙනත් ක්ෂේත්‍ර බෝගවල දේශීය නිෂ්පාදනය මෙම වසර තුළ දී ඉහළ ගිය අතර, රතු ළූණු, මුං, උඳු, රටකජු, ඉඟුරු සහ අමු මිරිස් නිෂ්පාදනය පහළ ගියේය. මේ අතර, රටේ ආහාර සුරක්ෂිතතාවය ඉහළ නැංවීම සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝගවල දේශීය නිෂ්පාදනය වැඩිදියුණු කිරීමට රජය අඛණ්ඩව කටයුතු කළේය. ඒ අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය වසර තුළ දී ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී. අභිජනන වැඩසටහන හරහා මිරිස්, අර්තාපල්, බඩ ඉරිඟු, මෙනේරි, කව්පි, උඳු සහ මුං වැනි වෙනත් ක්ෂේත්‍ර බෝගවල නව ප්‍රභේද සංවර්ධනය කිරීම, නිර්දේශිත සියලුම බෝග වර්ග නඩත්තු කිරීම, නිර්දේශිත ප්‍රභේදවල බීජ නිෂ්පාදනය, වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා තාක්ෂණික නිර්දේශ සැපයීම, පාංශු පරීක්ෂණ සේවා සහ තාක්ෂණය බෙදාහැරීම යනාදිය මෙම ක්‍රියාමාර්ගවලට ඇතුළත් වේ. කෙසේ වෙතත්, පොහොර සහ පළිබෝධනාශක වැනි කෘෂිකාර්මික යෙදවුම්වල ප්‍රමාණවත් සැපයුමක් සහතික කිරීම, උසස් තත්ත්වයේ බීජ නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සහ පාංශු හා බෝග කළමනාකරණ සම්බන්ධ යහපත් පිළිවෙත් සහිත ජාතික මට්ටමේ වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදන සැලැස්මක් අනුව සියලුම වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය ඉහළ නැංවීමට තවදුරටත් ක්‍රියාකිරීම අවශ්‍ය වන අතර, දේශීයව නිෂ්පාදනය කිරීමට හැකියාව ඇති වෙනත් ක්ෂේත්‍ර බෝග ආනයනය සඳහා මුදල් රටින් පිටතට ගලායෑම අවම කිරීම සඳහා සැපයුම් දාම ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.

## එළවළු

**දේශීය වශයෙන් පොහොර සහ වෙනත් කෘෂිරසායනික ද්‍රව්‍ය හිඟවීම, සැපයුම් දාමය ආශ්‍රිත අවහිරතා සහ නිෂ්පාදන පිරිවැය ඉහළ යෑම හේතුවෙන් 2022 වසරේ දී එළවළු සැපයුම පහළ ගියේය.** සමස්ත එළවළු නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 1,669,515ට සාපේක්ෂව 2022 වසරේ දී මෙට්‍රික් ටොන් 1,588,256ක් දක්වා සියයට 4.9කින් පහළ ගියේය. 2021/2022 මහ කන්නයේ දී එළවළු නිෂ්පාදනය පෙර වසරේ මහ කන්නයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 815,482ක් දක්වා සියයට 6.5කින් පමණ පහළ ගිය අතර, 2022 යල කන්නයේ නිෂ්පාදනය ද 2021 වසරේ යල කන්නයට සාපේක්ෂව මෙට්‍රික් ටොන් 772,773ක් දක්වා සියයට 3.1කින් පමණ පහළ ගියේය. මේ අතර, එළවළු නිෂ්පාදනය පහළ යෑම සහ ඉන්ධන හිඟය හේතුවෙන් සැපයුම් දාමයේ ඇති වූ කෙටි කාලීන අවහිරතා හේතුවෙන් 2022 වසර තුළ දී එළවළු මිල අඛණ්ඩව ඉහළ මට්ටමක පැවතිණි. එළවළු අස්වනු සඳහා අවාරය පැමිණීම මෙන්ම, ඉන්ධන හිඟය වඩාත් උග්‍ර වීම හේතුවෙන් 2022 වසරේ මැයි සහ ජූනි මාසවල දී එළවළු මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවාහනය කිරීම සඳහා ඉන්ධන බෙදාහැරීම සහ 2022 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී කන්න අස්වැන්න වෙළඳපොළට පැමිණීම හේතුවෙන් 2022 වසරේ ජූලි මාසයේ සිට දේශීය වෙළඳපොළ තුළ එළවළු මිල ගණන්වල සුළු පහළ යෑමක් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, අධික වර්ෂාව සහ ගබඩා කිරීමේ සහ ප්‍රවාහන පහසුකම්වල දුෂ්කරතා හේතුවෙන් 2022 වසරේ අග භාගය තුළ එළවළු මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. මේ අතර, 2022 වසර තුළ දී එ.ජ. ඩොලර් මිලියන 26.7ක වටිනාකමකින් යුත්

එළවළු මෙට්‍රික් ටොන් 15,835ක් අපනයනය කර ඇත. මෙම වසර තුළ දී දේශීය එළවළු නිෂ්පාදනය තිරසාර ලෙස ඉහළ නැංවීම සඳහා රාජ්‍ය ආයතන විසින් ක්‍රියාමාර්ග ගණනාවක් ගෙන ඇත. ඒ අනුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය විසින් මෙම අංශයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින්, නව එළවළු ප්‍රභේද සංවර්ධනය, පළිබෝධකයන්ට සහ රෝගවලට ප්‍රතිරෝධී එළවළු ප්‍රභේද හඳුන්වාදීම, එළවළු වගාව සඳහා සුදුසු පරිදි පසෙහි සාරවත් බව කළමනාකරණය කිරීම, එළවළු වගාවේ පළිබෝධකයින් සහ රෝග කළමනාකරණය සඳහා අවශ්‍ය වන තාක්ෂණික සංවර්ධනය සහ එළවළු සංරක්ෂණය සහ පෝෂක කළමනාකරණ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම ඇතුළු ක්‍රියාමාර්ග ගණනාවක් මෙම වසර තුළ දී ගෙන ඇත.

### පලතුරු

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, 2022 වසරේ දී සමස්ත පලතුරු නිෂ්පාදනය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය.** දොඩම්, දෙහි, රඹුටන්, අලිගැටපේර සහ කොමඩු නිෂ්පාදනය සැලකිය යුතු ලෙස පහළ යෑම සමඟ 2022 වසරේ දී සමස්ත පලතුරු නිෂ්පාදනය පෙර වසරට සාපේක්ෂව සියයට 26.9කින් පහළ ගිය අතර, අඹ, පැපොල්, කෙසෙල් සහ අන්නාසි යන පලතුරු නිෂ්පාදනයෙහි ඉහළ යෑම් වාර්තා විය. සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ, අපනයන වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 37.6ක වටිනාකමින් යුතු කෙසෙල්, පැපොල් ඇතුළු පලතුරු මෙට්‍රික් ටොන් 41,526ක් අපනයනය කර ඇති අතර, එ.ජ. ඩොලර් මිලියන 42.2ක වටිනාකමක් සහිත මෙට්‍රික් ටොන් 32,591ක පලතුරු ප්‍රමාණයක් ආනයනය කර ඇත. ආනයන වියදම අවම කිරීම සඳහා රජය විසින් පලතුරු කිහිපයක් ආනයනය කිරීමට පනවා ඇති තහනම හේතුවෙන් දේශීයව නිෂ්පාදනය කරනු ලබන පලතුරු සඳහා පවතින ඉල්ලුම ඉහළ ගියද, දේශීය නිෂ්පාදකයන් තුළ දේශීය ඉල්ලුමට සරිලන පරිදි පලතුරු සැපයීම ඉහළ නැංවීම සඳහා පවතින ධාරිතාව සීමා වීම සහ සැපයුම් දාමයන් සම්බන්ධ ගැටලු හේතුවෙන් දේශීය පලතුරු නිෂ්පාදන අංශයට එයින් අත්කර ගැනීමට හැකිව තිබූ ප්‍රතිලාභ සීමා විය. පලතුරු නිෂ්පාදන අංශය මගින් ආදායම් සහ රැකියා අවස්ථා නිර්මාණය කරමින් ජාතික ආර්ථිකයට ලබාදෙන දායකත්වය මෙන්ම, ජනතාවගේ පෝෂණය සම්බන්ධව එයින් ඇති කෙරෙන සැලකිය යුතු දායකත්වය හේතුවෙන් දේශීය පලතුරු නිෂ්පාදකයන්ගේ නිෂ්පාදන ශක්‍යතාව ඉහළ නැංවීම සහ දේශීය හා විදේශීය වෙළඳපොළවලට පලතුරු සැපයීමේ දී එහි ගුණාත්මකභාවය මෙන්ම සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීමේ වැදගත්කම තවදුරටත් අවධාරණය කෙරේ. විශේෂයෙන් කෘෂිකාර්මික යෙදවුම් භාවිතය සහ අස්වනු නෙලීම වැනි කටයුතුවල දී යහපත් කෘෂිකාර්මික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම, නිෂ්පාදකයින් සහ අපනයනකරුවන් අතර ඍජු සම්බන්ධතා ඇති කිරීම, කොන්ත්‍රාත් පදනම මත නිෂ්පාදන ලබාගැනීමේ ක්‍රමවේදය තවදුරටත් වර්ධනය කිරීම, පසු අස්වනු හානිය අවම කිරීම හා පලතුරු සංරක්ෂණය, ගබඩා කිරීම සහ එකතු කළ අගය වැඩිකිරීම සම්බන්ධ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යනාදිය මෙම අංශයේ කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. ඒ අනුව, රජය විසින් දේශීය පලතුරු අංශය ප්‍රවර්ධනය කිරීම සඳහා වසර තුළ දී ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පලතුරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය විසින් පලතුරු වගාකිරීම හා සංවර්ධනය කිරීම, පලතුරු බෝග වගාව සම්බන්ධ නිෂ්පාදන තාක්ෂණයන් පිළිබඳ උපදේශන සේවා සැපයීම, පළිබෝධකයන් සහ රෝග හඳුනා ගැනීම, නිර්දේශිත පලතුරු වර්ගවල හොඳ තත්ත්වයේ රෝපණ ද්‍රව්‍ය සැපයීම මෙන්ම, පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීම වසර තුළ දී සිදු විය. මේ අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මකවන ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහාය ඇතිව අඹ, කෙසෙල්, දෙළුම්, අන්නාසි, රඹුටන් සහ දූරියන් ඇතුළු පලතුරු බෝග හයක් වගා කළ හැකි ප්‍රදේශ පිළිබඳ තක්සේරුවක් සහ සිතියම් ගතකිරීමක් සිදුකරන ලදී.

### සීනි

**2019 වසරේ සිට අඛණ්ඩව ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ සීනි නිෂ්පාදනය, දේශීය වශයෙන් පැවති පොහොර හිඟය මධ්‍යයේ සීනි කර්මාන්තය මුහුණ දුන් අවහිරතා හේතුවෙන් 2022 වසරේ දී පහළ ගියේය.** වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සමස්ත සීනි නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 80,555ට සාපේක්ෂව 2022 වසරේ දී මෙට්‍රික් ටොන් 78,857ක් දක්වා සියයට 2.1කින් පහළ ගියේය. සමස්ත සීනි නිෂ්පාදනය පහළ යෑම සඳහා දායක වෙමින්, සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ සෙවනගල සහ පැල්වත්ත සීනි කර්මාන්තශාලාවල නිෂ්පාදනය, පිළිවෙළින්, සියයට 29.0කින් සහ සියයට 20.6කින් පහළ ගියේය. කෙසේ වෙතත්, 2022 වසර

2

2

තුළ දී ගල්ඔය සහ ඇතිමලේ කර්මාන්තශාලාවල සීනි නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, පිළිවෙළින්, සියයට 27.4කින් සහ සියයට 36.2කින් ඉහළ ගියේය. මේ අතර, ගල්ඔය, සෙවනගල, පැල්වත්ත සහ ඇතිමලේ කර්මාන්තශාලාවල සීනි නිෂ්පාදනය සමස්ත දේශීය නිෂ්පාදනයෙන්, පිළිවෙළින්, සියයට 36.2ක්, සියයට 16.0ක්, සියයට 30.6ක් සහ සියයට 17.2ක් විය. මෙම කර්මාන්තශාලා හතර විසින් සීනි නිෂ්පාදනය සඳහා යොදාගනු ලැබූ නිරි වගාව ඇතුළු උක් වගාවේ මුළු බිම් ප්‍රමාණය 2022 වසර තුළ දී සියයට 2.1කින් සුළු වශයෙන් පහළ ගියේය. මේ අතර, උක් වගාව සඳහා අවශ්‍ය පෝෂකවල පවතින කැපී පෙනෙන හිඟය පිළිබිඹු කරමින් මෙම සීනි කර්මාන්තශාලා හතරෙහි ඵලදාවේ සාමාන්‍යය සියයට 11.1කින් පහළ ගියේය. ඒ අනුව, ඵලදාවේ සාමාන්‍යය 2021 වසරේ දී වාර්තා වූ හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 67.2 හා සාපේක්ෂව 2022 වසරේ දී හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 59.7ක් දක්වා පහළ ගියේය. උක් පර්යේෂණායතනයට අනුව, 2022 වසර අවසානය වන විට, සමස්ත දේශීය සීනි අවශ්‍යතාවයෙන් සියයට 15.0 පමණ දේශීයව සපුරාගෙන ඇති අතර, ඉතිරි අවශ්‍යතාවය ආනයනය හරහා සපුරාගෙන ඇත.

**දේශීය සීනි අවශ්‍යතාවය සපුරාගැනීම සඳහා ආනයනය මත අනවශ්‍ය පරිදි යැපීම අවම කරමින්, දේශීය සීනි කර්මාන්තය ශක්තිමත් කිරීම අරමුණු කරගත් වැඩසටහන් කිහිපයක් රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** දේශීය වශයෙන් සීනි නිෂ්පාදනය කිරීම සඳහා පවතින ඉහළ විභවතාව සහ දේශීය සීනි අවශ්‍යතාවය සපුරාලීම සඳහා දේශීය උක් වගාව ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් උක් පර්යේෂණායතනය දේශීය සීනි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. දේශීය සීනි නිෂ්පාදනය ප්‍රවර්ධනයට අදාළව සිදුකළ යුතු ප්‍රමුඛ කාර්යභාරයන් ලෙස, වගා ප්‍රදේශ ව්‍යාප්ත කිරීමේ සහ කර්මාන්තශාලාවල ධාරිතාව ඉහළ නැංවීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, ලංකා සීනි (පුද්ගලික) සමාගමට අනුබද්ධිතව නව සීනි කර්මාන්ත ශාලාවක් ලෙස වැලිඔය සීනි කර්මාන්තශාලාව ස්ථාපිත කිරීමට 2022 වසරේ මුල් භාගයේ දී අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දුන්නේය. මේ අතර, නීතිමය ගැටලුවක් හේතුවෙන් කන්තලේ සීනි කර්මාන්තශාලාව නැවත ස්ථාපිත කිරීමේ වැඩසටහනට සම්බන්ධ කටයුතුවල ප්‍රගතිය මෙම වසර තුළ දී ද මන්දගාමීව සිදු විය. හකුරු නිෂ්පාදනය සඳහා විශේෂයෙන් ම වැඩිදියුණු කරන ලද නව ප්‍රභේදයක උක් බීජ ගුණනය කිරීමේ තවානක් කිලිනොච්චිය වන්නෙරිකුලම් ප්‍රදේශයේ ස්ථාපිත කිරීම ද 2022 වසරේ දී සිදුවිය. දේශීය සීනි කර්මාන්ත සඳහා සකස් කරන ලද ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ඉදිරිපත් කිරීමට විශේෂ කාර්යසාධක බලකායක් ස්ථාපිත කරන ලද අතර, තිරසාර ලෙස උක් බීජ නිෂ්පාදනය කිරීමට සහ සැපයුම් දාමයන් ස්ථාපිත කිරීම සඳහා උක් බීජ සම්බන්ධ ප්‍රතිපත්තියක් සකස් කිරීමේ කටයුතු ද සිදුවෙමින් පැවතුණි.

### පශු සම්පත්

**ආර්ථික අර්බුදය හේතුවෙන් පැන නැගුණු අභියෝග හේතුවෙන් 2022 වසරේ දී පශු සම්පත් අංශයේ ක්‍රියාකාරිත්වය මන්දගාමී විය.** මෙම වසර තුළ දී, ආර්ථිකයේ තීව්‍ර වුණු විදේශ විනිමය ද්‍රවශීලතා අර්බුදය හේතුවෙන් පැන නැගුණු ගැටලු වන සත්ත්ව ආහාර ආනයන සීමා කිරීම සමඟ සත්ත්ව ආහාර හිඟවීම හේතුවෙන් එහි පිරිවැය ඉහළ යෑම, තෘණ සහ සත්ත්ව ආහාර වගාව සඳහා අවශ්‍ය රසායනික පොහොර නොමැතිවීම සහ ගබඩා කිරීමේ හා ප්‍රවාහන පහසුකම්වල දුෂ්කරතා යනාදිය හේතුවෙන් කිරි නිෂ්පාදනය හා සම්බන්ධ සමස්ත අගය දාමයට දැඩි බලපෑමක් එල්ල විය. ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවලට අනුව, ජාතික කිරි නිෂ්පාදනය, 2021 වසරේ වාර්තා වූ ලීටර් මිලියන 513ට සාපේක්ෂව 2022 වසරේ දී ලීටර් මිලියන 506ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 1.3කින් අඩු විය. 2022 වසරේ දී එළකිරි නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ලීටර් මිලියන 419ක් දක්වා සියයට 1.5කින් පහළ ගිය අතර, මී කිරි නිෂ්පාදනය

**2.5 සංඛ්‍යා සටහන**

**පශු සම්පත් අංශය පිළිබඳ සංඛ්‍යාන**

| උප අංශය | 2021 (අ) | 2022 (ආ) | වාර්ෂික වෙනස්වීම (%) | |
|---|---|---|---|---|
| | | | 2020/21 (අ) | 2021/22 (ආ) |
| 1. මුළු ගවයන් සංඛ්‍යාව (මිලියන) | 1.5 | 1.5 | 2.6 | -0.8 |
| එළ ගවයන් | 1.1 | 1.1 | 2.5 | -0.3 |
| මී ගවයන් | 0.3 | 0.3 | 3.2 | -2.5 |
| 2. ජාතික කිරි නිෂ්පාදනය (ලීටර් මිලියන) | 513.3 | 506.4 | 4.4 | -1.3 |
| එළ කිරි | 425.4 | 419.2 | 2.8 | -1.5 |
| මී කිරි | 87.9 | 87.3 | 12.9 | -0.8 |
| 3. නිෂ්පාදක මිල - එළකිරි (රු./ලීටර්) | 98.00 | 115.00 | 19.5 | 17.3 |
| 4. බිත්තර නිෂ්පාදනය (මිලියන) | 1,953.7 | 1,848.6 | 4.5 | -5.4 |
| 5. කුකුළු මස් නිෂ්පාදනය (මෙ.ටො.දහස්) | 236.8 | 228.1 | 9.5 | -3.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත ලීටර් මිලියන 87ක් දක්වා සියයට 0.8ක සුළු පහළ යෑමක් වාර්තා කළේය. මේ අතර, එළකිරි නිෂ්පාදනය සඳහා වන සාමාන්‍ය පිරිවැය 2021 වසරේ දී වාර්තා වූ ලීටරයක් සඳහා රු. 69.30ට සාපේක්ෂව 2022 වසරේ දී ලීටරයකට රු. 80.50ක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, ආනයනික සහ දේශීය කිරිපිටි හිඟය සමඟ දියර කිරි සඳහා ඇති ඉල්ලුම වැඩිවීම මෙන්ම, කිරිපිටි මිලෙහි සැලකිය යුතු ඉහළ යෑම හේතුවෙන් ගොවීන්ට වසර තුළ දී දේශීයව නිෂ්පාදනය කරන ලද දියර කිරි සඳහා විධිමත් හා අවිධිමත් කිරි වෙළඳපොළ තුළ සාපේක්ෂ වශයෙන් ඉහළ මිලක් ලැබුණි. ඒ අනුව, එළකිරි ලීටරයක් සඳහා සාමාන්‍ය ගොවිපළ මිල 2021 වසරේ දී වාර්තා වූ රු.98.00 සිට 2022 වසරේ දී රු.115.00ක් දක්වා සියයට 17.3කින් ඉහළ ගියේය. වී සහ බඩ ඉරිඟු නිෂ්පාදනය කැපී පෙනෙන ලෙස පහළ යෑමත් සමඟ දේශීයව නිෂ්පාදනය කරනු ලබන සත්ත්ව ආහාර ද්‍රව්‍ය ප්‍රමාණය අඩුවීමත්, විදේශ විනිමය ද්‍රවශීලතාවය අඩුවීම නිසා ආහාර ද්‍රව්‍ය ආනයන සීමාකර තිබීමත් සමඟ කුකුල් පාලනය සඳහා ප්‍රමාණවත් ලෙස සත්ත්ව ආහාර ද්‍රව්‍ය නොලැබීම හේතුවෙන් 2022 වසරේ දී කුකුළු නිෂ්පාදන අංශය පසුබෑමට ලක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, බිත්තර නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මිලියන 1,954ට සාපේක්ෂව 2022 වසරේ දී මිලියන 1,849ක් දක්වා, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 5.4කින් පහළ ගියේය. තවද, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අනුව, බිත්තරයක් සඳහා නිෂ්පාදන පිරිවැය 2021 දී වාර්තා වූ රු. 18.07 සිට 2022 වසරේ දී රු. 38.10ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, කුකුල් මස් නිෂ්පාදනය 2021 වසරේ දී වාර්තා වූ මෙට්‍රික් ටොන් 236,790ක අගයක සිට 2022 වසරේ දී මෙට්‍රික් ටොන් 228,130 දක්වා සියයට 3.7 ක පහළ යෑමක් වාර්තා කළ අතර, කුකුළු මස් කිලෝග්‍රෑමයක් සඳහා නිෂ්පාදන පිරිවැය 2021 වසරේ දී වාර්තා වූ රු. 434.19 සිට 2022 වසරේ දී රු. 965.66ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රජය විසින් බිත්තර සහ කුකුළු මස් සඳහා පාලන මිලක් නියම කළ ද, විශේෂයෙන් ම බිත්තර සැපයුමෙහි පැවති දැඩි හිඟය සහ එහි ප්‍රතිඵලයක් ලෙස තොග රැස්කිරීම හේතුවෙන් වසර පුරාම බිත්තර මිල ගණන් ඉහළ මට්ටමක පැවතුණි. තවද, 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, එළු මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 2,730ක් දක්වා සියයට 9.2කින් ඉහළ ගිය අතර, ඌරු මස් සහ හරක් මස් නිෂ්පාදනය, පිළිවෙළින්, මෙට්‍රික් ටොන් 9,300ක් සහ මෙට්‍රික් ටොන් 21,890ක් දක්වා සියයට 5.3කින් සහ සියයට 21.4කින් පහළ ගියේය.

**පශු සම්පත් අංශය මුහුණ දෙන කාලීන අභියෝග පිළිබඳව නිසි අවධානය යොමු කරමින්, එම අංශයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා 2022 වසර මුළුල්ලේ අඛණ්ඩ ප්‍රයත්නයන් දරන ලදී.** පසුගිය වසර කිහිපය තුළ, ශ්‍රී ලංකාව බිත්තර හා කුකුළු මස් නිෂ්පාදනයෙන් ස්වයංපෝෂිත වූ බැවින් දේශීය පරිභෝජන අවශ්‍යතා බොහෝ දුරට දේශීය නිෂ්පාදනය හරහා සපුරා ගන්නා ලද අතර, එම කර්මාන්තය අපනයන වෙළඳපොළ සඳහා තරගකාරීත්වයක් සහිත ව්‍යාපාරයක් ලෙස ඉදිරියට යමින් පැවතුණි. කෙසේ වෙතත්, සත්ත්ව ආහාර ද්‍රව්‍ය හිඟවීම සහ නිෂ්පාදන මිල ගණන් ඉහළ යෑම තුළින් නිෂ්පාදනය සඳහා පවතින බාධාවන් තවදුරටත් උග්‍ර කර ඇති අතර, මෙමගින් සත්ත්ව ප්‍රෝටීනවල සැපයුම් හිඟයක් නිර්මාණය කර ඇත. මෙම තත්ත්වය රටේ ආහාර සුරක්ෂිතතාව කෙරෙහි අභියෝගයක් වී ඇත. මෙම තත්ත්වය තුළ, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සමඟ එක්ව, රජය විසින් සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා බඩ ඉරිඟු සහ වෙනත් සුදුසු ධාන්‍ය ආනයනය කිරීමට ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබූ අතර, මෙමගින් විදේශ ගිණුම් මත ඇතිවන පීඩනය අවම කිරීම සඳහා දේශීය වශයෙන් සත්ත්ව ආහාර නිෂ්පාදන අංශය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරන ලදී. තවද, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ දැනට සිටින ගව ගහනයේ ජානමය විභවයන් වැඩිදියුණු කිරීම තුළින් කිරි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වූ පශු සම්පත් (කිරි) අභිජනන ව්‍යාපෘතිය, සායනික හා උප සායනික බුරුළු ප්‍රදාහය වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා වූ විස්තීර්ණ බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන ඇතුළු ව්‍යාපෘති කිහිපයක් සහ පාද හා මුඛ රෝග, රක්තපාත සෙප්ටිසිමියා, කාල ගාත්‍ර රෝගය සහ බෲසෙල්ලා රෝගවලට එරෙහිව ගොවිපළවල සතුන් සඳහා එන්නත්කරණ වැඩසටහන්

**2.6 සංඛ්‍යා සටහන**
**මත්ස්‍ය නිෂ්පාදනය**

මෙ.ටො.දහස්

| උප අංශය | 2021 | 2022 (අ) | වාර්ෂික වෙනස්වීම (%) | |
|---|---|---|---|---|
| | | | 2020/21 | 2021/22 (අ) |
| මුහුදු මත්ස්‍ය | 332 | 281 | 1.5 | -15.4 |
| වෙරළ හා කලපු ආශ්‍රිත | 178 | 149 | -2.4 | -16.2 |
| ගැඹුරු මුහුදු මත්ස්‍ය | 153 | 131 | 6.3 | -14.5 |
| මිරිදිය මත්ස්‍ය | 104 | 117 | 2.4 | 11.9 |
| මිරිදිය ජලාශ | 81 | 95 | -4.3 | 17.5 |
| ජලජීවී වගාව | 9 | 8 | -10.2 | -15.7 |
| ඉස්සන් වගාව | 14 | 14 | 95.8 | -2.3 |
| **එකතුව** | **436** | **397** | **1.7** | **-8.9** |

(අ) තාවකාලික

මූලය: ධීවර අමාත්‍යාංශය

ක්‍රියාත්මක කරන ලදී. තවද, ඇමෙරිකා එක්සත් ජනපදයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍යාධාර ඇතිව, කිරි නිෂ්පාදකයින්ගේ කාර්යසාධනය සහ ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ප්‍රශස්ත ගොවිපළ පරිචයන් යොදාගැනීම අරමුණු කරගත්, වෙළඳපොළ ඉලක්කගත කිරි නිෂ්පාදන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක විය.

2

## ධීවර

**ආර්ථික අර්බුදයත් සමග පැන නැගුණු අභියෝග මධ්‍යයේ, 2022 වසරේ දී ධීවර අංශයේ ක්‍රියාකාරිත්වය මන්දගාමී විය.** ප්‍රධාන වශයෙන් රට තුළ පැවති ඉන්ධන හිඟයත් සමග විශේෂයෙන් ම මුහුදු මත්ස්‍ය කර්මාන්තයට අදාළව ධීවර කටයුතු සහ සැපයුම් දාමවල ඇති වූ අවහිරතා හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව 2022 වසරේ දී සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 397,230ක් දක්වා සියයට 8.9කින් පහළ ගියේය. ඒ අනුව, 2022 වසරේ දී, සමස්ත මත්ස්‍ය නිෂ්පාදනයෙන් සියයට 71ක් පමණ වූ මුහුදු මත්ස්‍ය නිෂ්පාදනය, මෙට්‍රික් ටොන් 280,610ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 15.4කින් පහළ ගියේය. කෙසේ වෙතත්, 2021 වසරට සාපේක්ෂව, මිරිදිය මත්ස්‍ය අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 11.9ක වර්ධනයක් මෙම වසර තුළ දී වාර්තා කළ අතර, ඒ සඳහා ජල මූලාශ්‍ර නිසි පරිදි කළමනාකරණය කිරීම සහ ජලාශවල මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය ඉහළ නැංවීම හේතු විය. ප්‍රවාහන හා සැපයුම් වියදම් ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් ලෙස, 2022 වසරේ දී මත්ස්‍ය ප්‍රභේදවල සිල්ලර මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, 2022 වසරේ අගෝස්තු සහ නොවැම්බර් මාසවල භූමිතෙල් මිල ගණන් ඉහළ දැමීමත් සමඟ වසරේ අග භාගය වන විට මත්ස්‍ය මිල ගණන් 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. ධීවර අමාත්‍යාංශයට අනුව, ධීවර අංශයේ මන්දගාමී ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරමින්, මත්ස්‍ය අපනයන ප්‍රමාණයද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 3.8කින් පහළ ගිය අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී මත්ස්‍ය ආනයන ප්‍රමාණයද, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, සියයට 25.7කින් පහළ ගියේය. බලශක්ති අර්බුදය මධ්‍යයේ, මෙම අංශය කම්පන ගණනාවකට මුහුණ දුන් අතර, ක්ෂේත්‍රය දැඩි ආර්ථික කම්පන වලින් ආරක්ෂා කරගැනීම සහ ධීවර කර්මාන්තයේ කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා දුෂ්කර කාලපරිච්ඡේදවල දී ධීවර අංශයේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වයක් සහතික කිරීම සඳහා රජයට පියවර ගැනීමට සිදුවිය. ඒ අනුව, සීමිත ඉන්ධන තොග බෙදාහැරීම සඳහා ප්‍රමුඛතා පදනම මත ප්‍රධාන ධීවර කලාපවල පිරවුම්හල් හඳුනා ගනිමින්, සාමාන්‍ය කාර්යපටිපාටියෙන් තොරව ධීවර කටයුතු සඳහා ඉන්ධන සැපයීම සිදුකරන ලදී.

**2.7 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්ගේ සුලබතාවය**

| | අයිතමය | ඒකකය | 2010 | | | 2021 (අ) | | | 2022 (ආ) | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | නිෂ්පාදනය | ආනයන | ඒක පුද්ගල ආහාර සුලබතාවය (වසරකට කි.ග්‍රෑ.) | නිෂ්පාදනය | ආනයන | ඒක පුද්ගල ආහාර සුලබතාවය (වසරකට කි.ග්‍රෑ.) | නිෂ්පාදනය | ආනයන | ඒක පුද්ගල ආහාර සුලබතාවය (වසරකට කි.ග්‍රෑ.) |
| 1. | සහල් (ඇ) | මෙ.ටො.දහස් | 3,011 | 126 | 152 | 3,203 | 147 | 151 | 2,081 | 783 | 129 |
| 2. | ඉරිඟු | මෙ.ටො.දහස් | 162 | 16 | 9 | 472 | 23 | 22 | 259 | 191 | 20 |
| 3. | තිරිඟු | මෙ.ටො.දහස් | - | 1,051 | 51 | - | 1,319 | 60 | - | 817 | 37 |
| 4. | ලොකු ළූණු | මෙ.ටො.දහස් | 59 | 158 | 10 | 66 | 257 | 15 | 18 | 264 | 13 |
| 5. | සීනි | මෙ.ටො.දහස් | 31 | 548 | 28 | 81 | 582 | 30 | 79 | 460 | 24 |
| 6. | අර්තාපල් | මෙ.ටො.දහස් | 52 | 130 | 9 | 76 | 117 | 9 | 48 | 154 | 9 |
| 7. | මාළු | මෙ.ටො.දහස් | 385 | 14 | 19 | 436 | 10 | 20 | 397 | 4 | 18 |
| 8. | එළ කිරි | ලීටර් මිලියන | 192 | - | 9 (ඈ) | 425 | - | 19 (ඈ) | 419 | - | 19 (ඈ) |
| 9. | පොල් තෙල් | මෙ.ටො.දහස් | 65 | 3 | 3 | 43 | 99 | 6 | 69 | 14 | 4 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) වී මෙට්‍රික් ටොන් 1ක්, සහල් මෙට්‍රික් ටොන් 0.68කට සමාන වේ.
(ඈ) වසරකට ලීටර්


මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා රේගුව
සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම - සෙවනගල ඒකකය
සීමාසහිත ලංකා සීනි (පෞද්ගලික) සමාගම - පැල්වත්ත ඒකකය
සීමාසහිත ගල්ඔය (හිඟුරාන) සීනි කර්මාන්තායතනය
සීමාසහිත ඇතිමලේ වැව්ලි (පෞද්ගලික) සමාගම
ධීවර අමාත්‍යාංශය
පොල් සංවර්ධන අධිකාරිය

**2022 වසර තුළ දී ද ධීවර කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු විය.** ඒ අනුව, ධීවර අමාත්‍යාංශය විසින් ධීවර අංශය සංවර්ධන කිරීම ඉලක්ක කරගත් ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර, තිරසාර ධීවර භාවිතයන් සහතික කිරීම සඳහා, නීති විරෝධී, වාර්තා නොකළ සහ නියාමනය නොකළ ධීවර කටයුතු වැළැක්වීමට කටයුතු කරන ලදී. 2022 වසරේ මාර්තු මාසය වන විට වෙල්ලමංකර ධීවර වරායේ ඉදිකිරීම් කටයුතු නිම කරන ලද අතර, ගන්දර ධීවර වරාය, බලපිටිය ධීවර වරාය සහ ඊකව ධීවර වරාය ඇතුළු තවත් වරාය සංවර්ධන ව්‍යාපෘති කිහිපයක් 2022 වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවතුණි. වෙරළබඩ ප්‍රදේශවල ස්වභාවික මත්ස්‍ය ගහනය ඉහළ නැංවීම සඳහා කලපු කිහිපයක් පිරිසිදු කිරීම හා ඒවායේ ගැඹුර වැඩි කිරීම ඉලක්ක කරගත් කලපු සංරක්ෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් වසර තුළ දී ක්‍රියාත්මක වෙමින් පැවති අතර, පසු අස්වනු හානි අවම කිරීම සඳහා ඊට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමටද පියවර ගන්නා ලදී. මේ අතර, ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් මිරිදිය මත්ස්‍ය සහ ජලජීවී වගාව ආශ්‍රිත නිෂ්පාදන ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව කටයුතු කළ අතර, එය මත්ස්‍ය අපනයනය ඉහළ නැංවීමට සැලකිය යුතු ලෙස දායක විය. ජලාශ තුළ ගබඩා කිරීම සඳහා අවශ්‍ය මත්ස්‍ය බීජ සැපයුම ඉහළ නැංවීම සඳහා ප්‍රජා මූලික මත්ස්‍ය අභිජනන ඒකක තුනක් අම්පාර, ත්‍රිකුණාමලය සහ කිලිනොච්චිය යන ප්‍රදේශවල ස්ථාපිත කරන ලද අතර, එම ඒකක මගින් මිරිදිය ජලජීවී වගාව සඳහා මත්ස්‍ය පැටවුන් අඛණ්ඩව සැපයීමට අපේක්ෂා කෙරේ. මෙම වසර තුළ දී, මත්ස්‍ය පැටවුන් මුදාහැරීම සඳහා කුඩා පරිමාණයේ මත්ස්‍ය බීජ නිෂ්පාදන ඒකක වැඩිදියුණු කිරීම මෙන්ම, මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ජලජීවී වගා සංවර්ධන මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇත. ඉස්සන් වගා කිරීම දිවයිනේ වඩාත්ම ලාභදායී වාණිජ ජලජීවී වගා ක්‍රියාකාරකමක් වන බැවින්, විභවයක් සහිත සෑම ප්‍රදේශයකම ඉස්සන් වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය මූලික ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව, කාර්යක්ෂම ජල ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් හඳුන්වාදීම සහ ගොවිබිම්වල ජෛවීය ආරක්ෂාව වැඩිදියුණු කිරීම මගින් ඉස්සන් වගාකිරීමේ කටයුතු ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන ඇති අතර, ඕලන්ද ඇළ ගැඹුරු කිරීම සහ පුත්තලම ප්‍රදේශයේ ඉස්සන් ගොවිපළ සඳහා දියුණු විදුලිබල සැපයුම් පද්ධතියක් ලබාදීමේ කටයුතු අඛණ්ඩව සිදු කෙරිණි. ඉස්සන් වගාවට අමතරව, වාණිජ ජලජීවී වගාව ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා මුහුදු පැලෑටි, මෝදා මසුන්, මුහුදු කැකිරි සහ කිරි මත්ස්‍ය වගාව සංවර්ධනය කිරීම ද සිදුකෙරිණි. ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් යාපනය, කිලිනොච්චිය, මන්නාරම සහ පුත්තලම යන මුහුදු ප්‍රදේශවල ප්‍රජා මූලික මුහුදු පැලෑටි වගාව සඳහා පහසුකම් සැපයීම සිදු කරන ලදී. කිලිනොච්චිය සහ යාපනය දිස්ත්‍රික්කවල මුහුදු කැකිරි අපනයන ගම්මාන ආශ්‍රිතව පොකුරු වශයෙන් මුහුදු කැකිරි අභිජනනාගාර ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ අතර, මන්නාරම ප්‍රදේශයේ ජලජීවී වගා කලාපයක් පිහිටුවීමට සැලසුම් සකස්කර ඇත. ඉහළ වටිනාකමකින් යුත් විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම හරහා විදේශ විනිමය ඉපයීම් ඉහළ නැංවීමේ අරමුණින් යුතුව, නව විසිතුරු මත්ස්‍ය ප්‍රභේද සංවර්ධනය කිරීම, අභිජනනය සඳහා පැටවුන් තොග සැපයීම, රෝග විනිශ්චය පහසුකම්, පුහුණුව සහ තාක්ෂණික සහාය ඇතුළුව විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය අඛණ්ඩව ක්‍රියාමාර්ග ගනු ලැබීය. තවද, බංගදෙණියේ සමුද්‍ර විසිතුරු මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් පිහිටුවීමට ද ශ්‍රී ලංකා ජලජීවී වගා සංවර්ධන අධිකාරිය මගින් පියවර ගෙන ඇත.

### කර්මාන්ත

**බලශක්ති අර්බුදය, බැංකු පද්ධතිය තුළ විදේශ විනිමය ද්‍රවශීලතාවය පහත වැටීම හේතුවෙන් අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය හිඟ වීම මෙන්ම ක්‍රය ශක්තිය පිරිහීමත් සමඟ ඉල්ලුම පහත වැටීම 2022 වසරේ වැඩි කාලයක් තුළ දී කර්මාන්ත ක්‍රියාකාරකම් කෙරෙහි බාධා පැමිණවීය.** ආර්ථිකයේ ඇති වූ මෙම බාධාකාරී තත්ත්වයන් පාලනය කිරීමට ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල බලපෑමෙන් වසර අවසානය වන විට සැපයුම් අංශයේ අවහිරතා සහ අමුද්‍රව්‍ය මිලගණන්හි ඉහළ යෑම යම් පමණකින් සමනය වුවද, දේශීය සහ විදේශීය යන දෙඅංශයෙන්ම පැමිණි මෙම බහුවිධ අභියෝගයන්ගේ දැඩි බලපෑමට ලක් වූ කර්මාන්ත කටයුතු 2022 වසරේ දී, 2021 වසර තුළ වාර්තා කළ සියයට 5.7ක වර්ධනයට සාපේක්ෂව සියයට 16.0කින් පහත වැටුණි. නිෂ්පාදන කර්මාන්ත හා ඉදිකිරීමේ කටයුතුවල පසුබෑම කර්මාන්ත කටයුතුවල පහත වැටීම කෙරෙහි මූලිකවම හේතු වූ අතර, පතල් හා කැණීම් කටයුතු මෙන්ම විදුලිය, ගෑස්, වාෂ්ප සහ වායුසමීකරණ සැපයීමේ කටයුතු ද සැලකිය යුතු ලෙස පහත වැටීම, සමස්ත කර්මාන්ත කටයුතුවල පසුබෑම තීව්‍ර කරන ලදී. එසේ වුවද, සමස්ත කර්මාන්ත ක්‍රියාකාරකම් සඳහා යහපත් දායකත්වයක් ලබා දෙමින්, ජලය

**2.6 රූප සටහන**
**2022 වසරේ කර්මාන්ත කටයුතුවල වර්ධන වේගයන් (අ)**




(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)


මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීමේ කටයුතු සහ මලාපවහන, කසළ කළමණාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ කටයුතු වසර තුළ දී වර්ධනය විය. කර්මාන්ත කටයුතුවල මෙම සමස්ත පසුබෑම පිළිබිඹු කරමින් ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ කර්මාන්ත කටයුතුවලට අදාළ නිෂ්පාදන සහ ඉල්ලුම යන උප දර්ශක වසර තුළ දී සමස්තයක් ලෙස පහත වැටුණි.

### නිෂ්පාදන කර්මාන්ත

**දේශීය වශයෙන් ඇතිවන කම්පනයන්ට සැහෙන දුරට ඔරොත්තු දිය හැකි රෙදිපිළි, නිමි ඇඳුම් හා සම් භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත කටයුතු හැර අනෙකුත් සියළුම නිෂ්පාදන කර්මාන්ත මෙම වසර තුළ දී පහත වැටීමක් වාර්තා කළ අතර, ඒ කෙරෙහි විදුලි කප්පාදුව, ඉන්ධන හා අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය හිඟය, ප්‍රවාහන අවහිරතා සහ ඉල්ලුම පහත වැටීම ආදියෙහි අහිතකර බලපෑම හේතු විය.** ඒ අනුව, සමස්ත නිෂ්පාදන කර්මාන්තවල එකතු කළ අගය 2021 වසරේ දී වාර්තා කළ සියයට 7.4ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 12.6කින් පහත වැටුණි. මෙහිදී, නිෂ්පාදන කර්මාන්ත සඳහා විශාලතම දායකත්වය දක්වන ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන අංශය 2022 වසරේ දී සියයට 14.2කින් සැලකිය යුතු ලෙස පහත වැටීම සමස්ත නිෂ්පාදන කර්මාන්ත කටයුතුවල දක්නට ලැබුණු සැලකිය යුතු පහත වැටීම කෙරෙහි හේතු විය. තවද, ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන, රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන සහ ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, නිෂ්පාදන කර්මාන්තවල එකතු කළ අගය පහත වැටීම කෙරෙහි දායක වූ අනෙකුත් ප්‍රධාන නිෂ්පාදන අංශ විය. නිෂ්පාදන කටයුතුවල මෙම පහත වැටීම පිළිබිඹු කරමින්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන කාර්මික නිෂ්පාදන දර්ශකය මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය[5] ද වසර තුළ දී සමස්තයක් ලෙස පහත වැටීමක් වාර්තා කරන ලදී.

**2.7 රූප සටහන**
**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)**




(අ) 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාල ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### කාර්මික නිෂ්පාදන දර්ශකය

**ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දුන් පෙර නොවූ ආකාරයේ ආර්ථික අර්බුදය මගින් පැන නැගුණු අහිතකර බලපෑම් රාශියක් හේතුවෙන්, නිෂ්පාදන කර්මාන්තවල අගය එකතු කිරීම 2022 වසරේ දී සෘණාත්මක වර්ධනයක් වාර්තා කළේය.** මෙතෙක් වාර්තාගත දරුණුතම ආර්ථික අර්බුදය හමුවේ නිෂ්පාදන අංශය, අමුද්‍රව්‍ය හිඟය, ප්‍රවාහන ජාල බිඳවැටීම්, විදුලිය විසන්ධි කිරීම්, සහ යෙදවුම් මිල ඉහළ යෑම ඇතුළුව බහුවිධ අභියෝගවලට මුහුණ දුන් අතර, එමගින් වසර තුළ දී එම අංශයේ ක්‍රියාකාරිත්වය කෙරෙහි අහිතකර බලපෑම් එල්ල විය. ඉහළ යන උද්ධමනය සහ වැය කළ හැකි ආදායමේ මූර්ත වටිනාකම පහත වැටීම මධ්‍යයේ, නිෂ්පාදන අංශයේ ක්‍රියාකාරිත්වයට තවදුරටත් බලපෑම් ඇති කරමින්, සමස්ත වෙළඳපොළ ඉල්ලුම ද වසර තුළ දී පහළ ගියේය. කාර්මික නිෂ්පාදන දර්ශකය මගින් පිළිබිඹු වන පරිදි, සමස්ත කර්මාන්ත අංශයෙන් සියයට 59ක් පමණ වූ සමස්ත නිෂ්පාදන අංශය, වාර්ෂික

5 ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, පෙර මාසයට සාපේක්ෂව සලකා බලනු ලබන මාසය තුළ දී සිදු වූ වෙනස්කම් පිළිබඳව විමසීමට ලක් කරනු ලබන ප්‍රධාන ව්‍යාපාරික ආයතන සහභාගී වන සංජානන සමීක්ෂණයක් මත පදනම්ව ඇත.

**2.8 රූප සටහන**
**කාර්මික නිෂ්පාදන දර්ශකය**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ලක්ෂ්‍යමය පදනම මත, පෙර වසරේ දී වාර්තා කරන ලද සියයට 7.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 12.1කින් පසුබෑමකට ලක් විය. කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි සමස්ත පහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක වෙමින්, ආහාර නිෂ්පාදන, රෙදිපිළි, අඟුරු සහ පිරිපහදු කළ ඛනිජතෙල් නිෂ්පාදන, වෙනත් ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන සහ මූලික ලෝහ නිෂ්පාදන යන උප අංශ 2022 වසර තුළ දී සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, කාර්මික නිෂ්පාදන දර්ශකයෙන් සියයට 30කට පමණ දායක වූ ඇඟලුම්, රසායනික ද්‍රව්‍ය හා රසායනික නිෂ්පාදන, බීම වර්ග, දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදන, සම් නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, සහ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ නිෂ්පාදන යන උප අංශ, කෙටි කාලීනව යම් පහළ යෑම් වාර්තා කළ ද, වසර තුළ දී සමස්තයක් ලෙස වර්ධනයක් වාර්තා කළේය.

**2022 වසර තුළ දී ආහාර නිෂ්පාදන කටයුතු සැලකිය යුතු පසුබෑමක් වාර්තා කළ අතර, බීම වර්ග නිෂ්පාදන කටයුතු දෙවන වසර සඳහාත් අඛණ්ඩව ශක්තිමත් වර්ධනයක් වාර්තා කළේය.** ඒ අනුව, කාර්මික නිෂ්පාදන දර්ශකයෙන් තුනෙන් එකකට වඩා වැඩි ප්‍රමාණයකට දායක වන ආහාර ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශය, 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වාර්තා කරන ලද සියයට 0.2ක සුළු වර්ධනයෙන් පසුව, 2022 වසරේ දී සියයට 14.8ක පහළ යෑමක් වාර්තා කළේය. ප්‍රධාන වශයෙන්, ආර්ථික අර්බුදය සමග සැපයුම් දාමයන්ට සහ බෙදාහැරීම් ජාලයන්ට ඇති වූ බාධාවන්, අමුද්‍රව්‍ය සහ ඇසුරුම් ද්‍රව්‍යවල පිරිවැය ඉහළ යෑම මෙන්ම, ආනයන සීමා කිරීම්

**2.8 සංඛ්‍යා සටහන**
**කාර්මික නිෂ්පාදන දර්ශකය**
**(2015 = 100)**


| කාණ්ඩය | දර්ශකයෙහි බරතැබීම් (%) | 2021 (අ) | 2022 (ආ) | වාර්ෂික වෙනස්වීම % 2020/21 (අ) | වාර්ෂික වෙනස්වීම % 2021/22 (ආ) |
|---|---|---|---|---|---|
| 1. ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය | 35.2 | 109.3 | 93.1 | 0.2 | -14.8 |
| 2. බීම වර්ග නිෂ්පාදනය | 3.8 | 106.0 | 127.5 | 9.8 | 20.3 |
| 3. දුම්කොළ ආශ්‍රිත ද්‍රව්‍ය නිෂ්පාදනය | 1.7 | 77.9 | 83.2 | 8.0 | 6.8 |
| 4. රෙදි නිෂ්පාදනය | 3.3 | 128.7 | 101.5 | 25.9 | -21.1 |
| 5. ඇඟලුම් නිෂ්පාදනය | 19.8 | 95.4 | 100.5 | 17.5 | 5.3 |
| 6. සම් සහ සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදනය | 0.3 | 78.6 | 87.4 | 1.3 | 11.2 |
| 7. ගෘහ භාණ්ඩ හැර, දැව හා ලීයෙන් කරන ලද නිෂ්පාදන, පිදුරුවලින් හා ගොතන ලද ද්‍රව්‍ය නිෂ්පාදනය | 0.2 | 82.5 | 81.0 | 15.0 | -1.8 |
| 8. කඩදාසි සහ කඩදාසි ද්‍රව්‍ය නිෂ්පාදනය | 1.7 | 86.5 | 49.0 | 5.8 | -43.4 |
| 9. මුද්‍රණය සහ පටිගත කරන ලද මාධ්‍ය නිෂ්පාදනය | 1.4 | 117.9 | 112.1 | 4.8 | -4.9 |
| 10. අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදනය | 7.4 | 71.1 | 30.0 | -26.8 | -57.8 |
| 11. රසායනික සහ රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය | 4.1 | 89.8 | 98.6 | -4.7 | 9.8 |
| 12. මූලික ඖෂධ සහ ඖෂධ හා සම්බන්ධ සැකසීම් නිෂ්පාදනය | 0.1 | 117.9 | 102.5 | 12.6 | -13.1 |
| 13. රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය | 5.7 | 102.9 | 92.7 | 35.7 | -9.9 |
| 14. වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය | 7.8 | 137.4 | 113.5 | 23.0 | -17.4 |
| 15. මූලික ලෝහ වර්ග නිෂ්පාදනය | 2.4 | 133.6 | 88.1 | 20.7 | -34.1 |
| 16. පිරිසකසන ලද ලෝහ නිෂ්පාදනය (යන්ත්‍රසූත්‍ර සහ උපකරණ හැර) | 1.3 | 124.6 | 72.0 | 23.5 | -42.2 |
| 17. විදුලි උපකරණ නිෂ්පාදනය | 2.0 | 81.4 | 65.1 | 20.6 | -20.0 |
| 18. යන්ත්‍රසූත්‍ර හා උපකරණ නිෂ්පාදනය (වෙනත් තැනක සඳහන් නොවන) | 0.7 | 122.0 | 139.1 | 18.6 | 14.0 |
| 19. ගෘහ භාණ්ඩ නිෂ්පාදනය | 0.8 | 77.5 | 63.3 | 0.7 | -18.3 |
| 20. අනෙකුත් නිෂ්පාදන | 0.3 | 69.6 | 69.6 | 6.0 | - |
| **කාර්මික නිෂ්පාදන දර්ශකය** | | **104.2** | **91.6** | **7.3** | **-12.1** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

හේතුවෙන් ආහාර ද්‍රව්‍ය කිහිපයක අමුද්‍රව්‍ය සැපයුම සීමා වීම සමඟ සහල්, ටින් මාළු, කිරි පිටි, තිරිඟු පිටි, පාන් සහ තේ නිෂ්පාදනය පහත වැටීම ආහාර නිෂ්පාදන උප අංශයේ දුර්වල කාර්යසාධනයට

**2.9 රූප සටහන**
**ධාරිතා උපයෝජනය**




සටහන: කාණ්ඩවලට අදාළ බර තැබීම් වරහන් තුළ දක්වා ඇත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

හේතුවිය. කෙසේ වෙතත්, අරක්කු, බියර් සහ සිසිල් බීම නිෂ්පාදනයන්ගේ වර්ධනය හේතුවෙන්, කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි අනෙකුත් සියලුම උප අංශ අතුරින්, බීම වර්ග නිෂ්පාදනයේ කාර්යසාධනය වසර තුළ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.8ක වර්ධනයක් වාර්තා කළ බීම වර්ග නිෂ්පාදන කටයුතු, 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 20.3ක වර්ධනයක් වාර්තා කර ඇත. 2022 වසරේ දී බීම වර්ග නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සමස්තයක් ලෙස ධනාත්මක කාර්යසාධනයක් වාර්තා කළ ද, වසරේ සිව්වන කාර්තුවේ දී එම අංශයේ ක්‍රියාකාරිත්වයේ සුළු මන්දගාමී වීමක් පෙන්නුම් කළේය.

**ගෝලීය සැපයුම් දාමයන් යථා තත්ත්වයට පත් වීම ප්‍රධාන වශයෙන් මූලික කරගෙන, කාර්මික නිෂ්පාදන දර්ශකයෙහි දෙවන විශාලතම උප අංශය වන ඇඟලුම් නිෂ්පාදනය 2022 වසරේ දී යථා තත්ත්වයට පත්වීමක් වාර්තා කරන කළ අතර, රෙදිපිළි උප අංශයේ කාර්යසාධනය පහළ ගියේය.** ඒ අනුව, 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වාර්තා කරන ලද සියයට 17.5ක සැලකිය යුතු වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී ඇඟලුම් උප අංශයේ නිෂ්පාදනය සියයට 5.3ක වර්ධනයක් වාර්තා කළේය. ආනයන සීමා කිරීම්, සැපයුම් ක්‍රියාවලියෙහි ඇති වූ ගැටලු සහ විදුලිය විසන්ධි කිරීම් මගින් ඇඟලුම් ක්ෂේත්‍රය මත ඇති වූ අහිතකර බලපෑම්, රජය විසින් ක්‍රියාත්මක කරන ලද විවිධ ප්‍රතිපත්තිමය තීරණ මගින් බොහෝ දුරට සමනය විය. සලකා බලන ලද කාල පරිච්ඡේදය තුළ දී, අපනයනකරුවන්ට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් සෘජුවම එ.ජ. ඩොලර් භාවිතා කර ඉන්ධන මිලදී ගැනීමට අවසර ලබා දීම සහ අමුද්‍රව්‍ය රැසක් ආනයනය සඳහා තීරුබදු සහන ලබා දීම වැනි තීරණ එයට ඇතුළත් විය. මීට අමතරව, විනිමය අනුපාතිකය අවප්‍රමාණයවීම සහ කොවිඩ්-19 වසංගතයෙන් පසුව, විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තයන් ඇතුළුව ගෝලීය ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම, ඇඟලුම් උප අංශයේ අපනයන ආදායම කෙරෙහි හිතකර බලපෑමක් ඇති කළේය. කෙසේ වෙතත්, වසංගතයෙන් පසුව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 25.9ක වර්ධනයක් සමඟ 2021 වසරේ දී ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළ රෙදිපිළි නිෂ්පාදන ක්‍රියාකාරකම්, නිමි රෙදිපිළි, රෙදිපිළි මුද්‍රණ කටයුතු සහ කොහු කෙඳි නිෂ්පාදනය පහත වැටීම හේතුවෙන් 2022 වසරේ දී, සියයට 21.1 කින් පමණ සැලකිය යුතු ලෙස පහළ ගියේය.

**වෙනත් ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදන, මූලික ලෝහ නිෂ්පාදන සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන යන උප අංශ 2022 වසරේ දී සැලකිය යුතු ලෙස පහළ යෑම් වාර්තා කළේය.** ඒ අනුව, 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 20කට වඩා වැඩි වර්ධනයක් වාර්තා කළ වෙනත් ලෝහ නොවන ඛනිජමය නිෂ්පාදන, මූලික ලෝහ නිෂ්පාදන සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන උප අංශවල කාර්ය සාධනය, 2022 වසර තුළ දී පිළිවෙළින්, සියයට 17.4කින්, සියයට 34.1කින් සහ සියයට 42.2කින් පහළ ගියේය. රජය විසින් අරමුදල් සපයන ලද ව්‍යාපෘති අත්හිටුවීම, ඉහළ යන අමුද්‍රව්‍ය පිරිවැය සහ ආනයන සීමා කිරීම් හේතුවෙන් දේශීය ඉදිකිරීම් අංශය විවිධ ගැටලුවලට මුහුණ දීමත් සමඟ එම අංශයෙන් වන ඉල්ලුම අඩු වීම, මෙම උප අංශවල නිෂ්පාදන සඳහා ඇති ඉල්ලුම පහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඉදිකිරීම් අංශයෙන් වන ඉල්ලුම දුර්වල වීම පිළිබිඹු කරමින්, සිමෙන්ති, සෙවිලි තහඩු, පිඟන් ගඩොල් සහ සෙවිලි උළු නිෂ්පාදනය 2022 වසරේ දී සැලකිය යුතු පහළ යෑමක් වාර්තා කර ඇති අතර, එමගින් වෙනත් ලෝහ නොවන ඛනිජමය ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑම් ඇති විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ මූලික යකඩ සහ වානේ, ඊයම් හා වානේ ගෘහ භාණ්ඩ නිෂ්පාදනවල පහළ යෑම, මූලික ලෝහ නිෂ්පාදන සහ පිරිසකසන ලද ලෝහ නිෂ්පාදන උප අංශවල සමස්ත පහළ යෑම සඳහා විශාල වශයෙන් හේතු විය.

**කාර්මික නිෂ්පාදන දර්ශකයේ සියයට 7කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා දායක වන අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය උප අංශයේ නිෂ්පාදනය, 2022 වසරේ දී අඛණ්ඩව තෙවැනි වසර සඳහාත් පසුබෑමක් පෙන්නුම් කළේය.** ඒ අනුව, 2016 වසරේ සිට වාර්තා වූ විශාලතම වාර්ෂික පසුබෑම වාර්තා කරමින්, අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය නිෂ්පාදනය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 57.8කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය. දේශීය වෙළඳපොළ තුළ පැවති විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය මධ්‍යයේ බොරතෙල් ආනයනය කිරීම සීමා කිරීම හේතුවෙන් 2022 වසර තුළ දී ඛනිජ තෙල් පිරිපහදුව දිගු කාලයක් පුරා වසා දැමීම, මෙම පසුබෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, සුදු ඩීසල්, පෙට්‍රල් සහ දැවි තෙල් ඇතුළු පිරිපහදු කළ පෙට්‍රෝලියම් නිෂ්පාදන 2022 වසරේ දී පහළ ගියේය. කෙසේ වෙතත්, අඟුරු සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ද්‍රව්‍ය උප අංශයේ නිෂ්පාදනය වසරේ පෙබරවාරි, ජූනි, අගෝස්තු, සැප්තැම්බර් සහ දෙසැම්බර් යන මාසවල දී මාසික පදනමින් ඉහළ යෑම් වාර්තා කළේය.


**සම් නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත නිෂ්පාදන උප අංශය සහ රසායනික ද්‍රව්‍ය හා රසායනික නිෂ්පාදන උප අංශය 2022 වසර තුළ දී වර්ධනයක් වාර්තා කළේය.** සම් සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන උප අංශය 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වාර්තා කළ සියයට 1.3ක් වූ සුළු ඉහළ යෑමට සාපේක්ෂව, නිමි සම්, ස්වභාවික සම් ජැකට් සහ සපත්තු, නිෂ්පාදනයන්හි වර්ධනය හේතුවෙන් 2022 වසර තුළ දී සියයට 11.2කින් වර්ධනය විය. මේ අතර, රසායනික ද්‍රව්‍ය සහ රසායනික නිෂ්පාදන උප අංශය ද වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 9.8ක සමස්ත වර්ධනයක් වාර්තා කළේය. මෙම වර්ධනයට දායක වෙමින් ආස්තරණ මලු සහ සේදුම්කාරක නිෂ්පාදනය වසර තුළ දී, සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන උප අංශය සහ මූලික ඖෂධ නිෂ්පාදන හා ඖෂධ සම්බන්ධ ද්‍රව්‍ය නිෂ්පාදන උප අංශවල නිෂ්පාදනය 2022 වසර තුළ දී පහළ යෑම් වාර්තා කළේය.** 2021 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 35.7ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ රබර් සහ ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදනය, 2022 වසරේ දී සියයට 9.9කින් පහළ ගියේය. දේශීය හා ගෝලීය වශයෙන් කොවිඩ්-19 රෝගීන්ගේ පහළ යෑම හේතුවෙන් වෛද්‍ය රබර් අත්වැසුම්වලට පැවති ඉල්ලුම අඩු වීම, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන උප අංශයේ පසුබෑම සඳහා මූලික වශයෙන් හේතු විය. මීට අමතරව, ටයර්, සිපර (Zippers) සහ රබර් ෂීට් නිෂ්පාදනවවල දේශීය නිෂ්පාදනය අඩු වීම ද මෙම පසුබෑම සඳහා බලපෑවේය. මේ අතර, වසංගත තත්ත්වය හේතුවෙන් ඖෂධ සහ අනෙකුත් සෞඛ්‍ය ආශ්‍රිත නිෂ්පාදන සඳහා ඇති වූ ඉල්ලුමත් සමග ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කළ මූලික ඖෂධ නිෂ්පාදන හා ඖෂධ නිෂ්පාදන උප අංශය 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 13.1ක පහළ යෑමක් වාර්තා කළේය.

2022 වසරේ දී, **කාර්මික නිෂ්පාදන දර්ශකයේ අනෙකුත් උප අංශයන් වන, දැව නිෂ්පාදන (ගෘහ භාණ්ඩ හැර), විදුලි උපකරණ, ගෘහ භාණ්ඩ, කඩදාසි හා කඩදාසි නිෂ්පාදන සහ මුද්‍රණ හා පටිගතකළ මාධ්‍ය නිෂ්පාදනය ආදී අංශයන්හි ක්‍රියාකාරිත්වයෙහි පසුබෑමක් දක්නට ලැබුණු අතර, දුම්කොළ නිෂ්පාදන සහ යන්ත්‍රෝපකරණ හා උපකරණ නිෂ්පාදන යන උප අංශවල වර්ධනයන් වාර්තා විය.** රැලි සහිත කඩදාසි, කඩදාසි බෑග් සහ අභ්‍යාස පොත් නිෂ්පාදනය අඩුවීම හේතුවෙන් කඩදාසි හා කඩදාසි නිෂ්පාදන උප අංශය 2022 වසරේ දී මන්දගාමී කාර්යසාධනයක් පෙන්නුම් කළේය. ඒ අනුව, කඩදාසි හා කඩදාසි නිෂ්පාදන උප අංශය වාර්ෂික ලක්ෂ්‍යමය පදනම යටතේ 2022 වසරේ දී සියයට 43.4ක සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය. සලකා බලන ලද කාලපරිච්ඡේදය තුළ ප්‍රධාන වශයෙන් දක්නට ලැබුණු සැපයුම් හිඟය මෙන්ම, මුදල් නෝට්ටු සහ පුවත්පත් මුද්‍රණය පහළ යෑම හේතුවෙන් මුද්‍රණ හා පටිගතකළ මාධ්‍ය නිෂ්පාදන උප අංශයේ ක්‍රියාකාරිත්වය පෙර වසරට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.9ක අඩුවීමක් පෙන්නුම් කළේය. විදුලි පැනල් පුවරු සහ දඟර උපාංග

**2.10 රූප සටහන**

**2022 වසරේදී කාර්මික නිෂ්පාදන දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්වීමට ප්‍රධාන කාණ්ඩවල දායකත්වය**




සටහන: කාණ්ඩවලට අදාළ බරතැබීම් වරහන් තුළ දක්වා ඇත.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සඳහා ඇති ඉල්ලුම අඩුවීම හේතුවෙන්, විදුලි උපකරණ නිෂ්පාදන අංශයේ සමස්ත කාර්යසාධනය 2022 වසරේ දී දුර්වල විය. කෙසේ වුවද, යන්ත්‍රෝපකරණ හා උපකරණ නිෂ්පාදන උප අංශය පෙර වසරේ වාර්තා කළ සියයට 18.6ක වර්ධනයට සාපේක්ෂව 2022 වසර තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 14.0ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, ප්‍රධාන වශයෙන් සිගරට් නිෂ්පාදනය ඉහළ යැමත් සමඟ, දුම්කොළ නිෂ්පාදන අඛණ්ඩව දෙවන වසරටත් ඉහළ යැමක් වාර්තා කරමින්, 2022 වසරේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.8කින් වර්ධනය විය.

### කාර්මික ප්‍රතිපත්ති සහ ආයතනික සහාය

**වසංගතයෙන් මෙන්ම ඉන් අනතුරුව ඇති වූ ආර්ථික අර්බුදයෙන් වූ බලපෑමෙන් යථා තත්ත්වයට පත්වීම සඳහා කර්මාන්ත අංශයට සහාය සපයමින්, ප්‍රතිපත්තිමය පියවර ගණනාවක් ක්‍රියාවට නැංවීම හරහා කර්මාන්ත අංශයේ වර්ධනයට සහ සංවර්ධනයට අඛණ්ඩව සහයෝගය ලබා දීමට 2022 වසර තුළ දී, රජය විසින් කටයුතු කරන ලදී.** කර්මාන්ත අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකාවෙහි කර්මාන්ත අංශය සංවර්ධනය සඳහා විස්තීර්ණ සහ සමස්ත පැතිකඩ ආවරණය කෙරෙන ප්‍රතිපත්තිමය රාමුවක් ඇතිකිරීම උදෙසා 2023 - 2048 කාල සීමාව සඳහා 'කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය' (National Policy for Industrial Development - NaPID) සකස් කරන ලදී. තව ද, 'කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය' තුළින් ගෝලීය වශයෙන් තරගකාරීවන සහ සැමට ප්‍රතිලාභ හිමිවන දේශීය කාර්මික අංශයක් ඇති කිරීම අරමුණු කරයි. 'කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තයෙහි' සඳහන් කාර්යයන් බලගැන්වීම සඳහා ක්‍රියාත්මක කිරීමේ රාමුවක්, අධීක්ෂණය සහ ඇගයීම සඳහා වන යාන්ත්‍රණ සහ කාල පරාසයන් අතර සමාලෝචන සිදුකිරීමේ ක්‍රමවේදයන් ඇතුළත් උපාය මාර්ගික ක්‍රියාකාරී සැලසුම් වසර 5 බැගින් වූ කාල පරාසයන් සඳහා සකස් කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, කාර්මික සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්තිය සහ 2023-2027 කාලපරිච්ඡේදය සඳහා උපාය මාර්ගික ක්‍රියාකාරී සැලසුම, 2023 වසරේ පෙබරවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. මේ අතර, 2012 වසරේ දී නවතා දැමුණු ඇඹිලිපිටිය කඩදාසි කම්හලේ නිෂ්පාදනය රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් ලෙස නැවත ආරම්භ කිරීම සඳහා 2023 වසරේ පෙබරවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය දෙන ලදී. ඇමරිකානු ඩොලර් මිලියන 16ක ආයෝජනයක් මගින් මෙම ව්‍යාපෘතියෙහි පළමු අදියරේ සංවර්ධන කටයුතු සිදු කෙරෙන අතර, මෙමගින් යන්ත්‍රෝපකරණ සහ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හරහා ඍජු හා වක්‍ර අපනයන වෙළඳපොළ සඳහා කාර්මික ශ්‍රේණියේ කඩදාසි නිෂ්පාදනය කිරීම ඉලක්ක කර ඇත. 2024 වසර වන විට මෙම කර්මාන්තශාලාව නිම කිරීමට අපේක්ෂා කරන අතර, වාර්ෂිකව කඩදාසි මෙට්‍රික් ටොන් 74,000ක් පමණ නිෂ්පාදනය කිරීමට එමගින් අපේක්ෂා කරයි. වසර තුළ දී කුරුංචතිව් ලුණු ලේවායෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ නැවත ආරම්භ කිරීමට අදාළ කටයුතුද සිදු විය. මෙම ව්‍යාපෘතිය අවසන් වීමත් සමඟ මෙම ලුණු ලේවාය මගින් වාර්ෂිකව මෙට්‍රික් ටොන් 30,000ක පමණ ලුණු නිෂ්පාදනයක් සිදුකිරීමට අපේක්ෂා කෙරේ. තවද, මෝටර් රථ නිෂ්පාදනයට අදාළව, එකලස් කිරීම සහ අමතර කොටස් නිෂ්පාදන කර්මාන්තය සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටි මාර්ගෝපදේශ යටතේ දේශීය වශයෙන් මෝටර් රථ එකලස් කිරීම අඛණ්ඩව පුළුල් විය. 2022 වසර අවසානය වන විට සම්මත මෙහෙයුම් පටිපාටි යටතේ නිෂ්පාදන සමාගම් 20ක් ලියාපදිංචි කර ඇති අතර, වසර තුළ දී වාහන 10,490ක් එකලස් කර ඇත. මේ අතර, ශ්‍රී ලංකා ජෛව තාක්ෂණ ආයතනය, ජාත්‍යන්තර හවුල්කරුවෙකු සමඟ සහයෝගීව, 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය ස්ථාපිත කිරීම සඳහා පියවර රැසක් ක්‍රියාවට නැංවීය. රට තුළ ජෛව තාක්ෂණ නවෝත්පාදනයන් සඳහා වන සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස කටයුතු කරමින්, දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ආයෝජන ආකර්ෂණය කරගැනීමටත්, එමඟින් ශ්‍රී ලංකාවෙහි අධි තාක්ෂණික අපනයන ඉහළ නැංවීමටත් මෙම ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය මගින් අපේක්ෂා කෙරේ. මේ අතර, ආසියානු සංවර්ධන බැංකුවෙහි සහාය ඇතිව ස්ථාපිත කරන ලද 'කුඩා හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර සම්බන්ධක වේදිකාව' 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ අධීක්ෂණය යටතේ දියත් කරන ලදී. මෙම වේදිකාව මගින් දැනුම, හැකියාවන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතර ජාලකරණය සඳහා ප්‍රවේශය ලබාදීමට අපේක්ෂා කරන අතර, කාන්තාවන්ගේ මූල්‍ය සාක්ෂරතාවය සහ ව්‍යාපාර කළමනාකරණ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා කාන්තාවන් විසින් මෙහෙයවන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කෙරෙහි මෙමගින් විශේෂ අවධානයක් යොමු කරයි. තවද, කලාපය තුළ වෘත්තීය පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා 'නිපුණතා

උදාන' වැඩසටහන වයඹ පළාත තුළ ආරම්භ කර ක්‍රියාවට නැංවීය. මේ අතර, මාතර දිස්ත්‍රික්කයෙහි ජර්මානු කාර්මික විද්‍යාලයක් ස්ථාපිත කිරීමට අදාළ පියවර රැසක් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. කෙසේ වෙතත්, 2022 අංක 03 දරණ ජාතික අයවැය චක්‍රලේඛයට අනුව රාජ්‍ය වියදම් සීමා කිරීම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල් මාසයේ සිට කාර්මික අංශයෙහි ප්‍රවර්ධන සහ සංවර්ධන කටයුතු තරමක් දුරට සීමා විය.

**අපනයන සංවර්ධන මණ්ඩලය සහ ආයෝජන මණ්ඩලය විසින් අපනයන ඉලක්කගත දේශීය නිෂ්පාදන කර්මාන්ත ප්‍රවර්ධනය කිරීමෙහි සක්‍රීයව නියැලුණු අතර, විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා පියවර කිහිපයක් ආරම්භ කරන ලදී.** 2022 වසර සඳහා වන අතුරු අයවැය මගින් යෝජනා කළ පරිදි, ජාත්‍යන්තර වෙළඳපොළට සරිලන පරිදි දේශීය ඇසුරුම් ද්‍රව්‍ය හා මෝස්තර ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම අරමුණු කරගත් 'ජාතික ඇසුරුම් මධ්‍යස්ථානයෙහි' කටයුතු නැවත සක්‍රීය කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය පියවර ගත්තේය. තවද, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ඇඟලුම්, මැණික්, ස්වර්ණාභරණ, විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික නිෂ්පාදන, රබර් සහ රබර් ආශ්‍රිත නිෂ්පාදන, සහ බෝට්ටු හා බෝට්ටු තැනීම ඇතුළු ආර්ථිකයේ හඳුනාගත් අපනයන අංශ කිහිපයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික අපනයන සන්නාමයක් සහ 2022-2026 කාලපරිච්ඡේදය සඳහා ප්‍රවර්ධන සැලැස්මක් ද සංවර්ධනය කරන ලදී. එසේම, 2021 වසරේ දී අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ප්‍රධාන අපනයන ක්ෂේත්‍ර 24ක් ආවරණය වන පරිදි පත් කරන ලද අපනයන උපදේශක කමිටු මගින් අපනයන ක්ෂේත්‍රවල ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමට අවශ්‍ය තේමාත්මක ප්‍රමුඛතා හඳුනාගැනීම සඳහා රැස්වීම් මාලාවක් වසර තුළ පවත්වන ලදී. එමෙන්ම, වසර තුළ දී අපනයන ඉලක්ක කරගත් ව්‍යාපාර ප්‍රවර්ධන කිරීම ඉලක්ක කරමින් වෙළඳ ප්‍රදර්ශන, වෙළඳපොළ සබඳතා නිර්මාණය කර ගැනීමේ වැඩසටහන්, දැනුම්වත් කිරීමේ සැසි, සහ ශක්‍යතා සංවර්ධන වැඩසටහන් පවත්වන ලදී. මේ අතර, ආයෝජන මණ්ඩලය විසින් සමාගම්, පර්යේෂණ ආයතන හා නව ව්‍යාපාර ආයතන සඳහා සහාය වීමට සහ ඔවුන්ගේ ඉදිරි ව්‍යාපාර යෝජනා හෝ නවෝත්පාදන සඳහා සුදුසු හවුල් කරුවන් සොයා ගැනීමට පහසුකම් සැලසීම සඳහා දේශීය හා ජාත්‍යන්තර ව්‍යවසායයන් සම්බන්ධීකරණය කෙරෙන පොදු වේදිකාවක් ලෙස නව ව්‍යාපාර හවුල්කාරිත්ව පිළිබඳ දත්ත පද්ධතියක් ස්ථාපිත කරන ලදී. තවද, ආයෝජකයන් හට ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව වැඩිදියුණු කෙරෙන පරිදි, ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම තුළින් ආයෝජන අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් සහ කඩිනම් කිරීම සඳහා 'ආයෝජකයින් වෙත පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයක්' ස්ථාපිත කරන ලදී.

**අනෙකුත් රාජ්‍ය නියෝජිත ආයතන දේශීය කර්මාන්ත අංශයට පහසුකම් සැලසීම සඳහා පියවර රැසක් ක්‍රියාත්මක කළේය.** ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් දේශීය සම්පත් භාවිතා කරන ව්‍යාපාර සඳහා පිළිගැනීමක් ලබාදෙන 'Made in Sri Lanka' ලාංඡනය ප්‍රචලිත කිරීමට අදාළ සිය ප්‍රයත්නයන් අඛණ්ඩව ක්‍රියාවට නැංවීය. මේ සඳහා, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් දිස්ත්‍රික් මට්ටමේ සහ ක්ෂුද්‍ර මට්ටමේ වෙළඳ ප්‍රදර්ශන පවත්වන ලද අතර, ප්‍රථම 'Made in Sri Lanka' බලයලත් වෙළඳසැල මාතලේ දිස්ත්‍රික්කයේ විවෘත කරන ලදී. 2022 වසරේ දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් එහි 'ප්‍රාදේශීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන' හරහා ව්‍යවසායක පුහුණු වැඩසටහන් 1,292ක් පවත්වන ලද අතර, ව්‍යාපාර 957ක් සහ ව්‍යාපාර පුළුල් කිරීම් 1,573ක් නිර්මාණය කිරීමට සහාය දෙන ලදී. එමෙන්ම, ආහාර විජලනය, මී පැණි, දිවුල් සහ අනෙකුත් ඍතුමය නිෂ්පාදන, කොස්, පන් සහ තල් වර්ග යන ක්ෂේත්‍රවල කර්මාන්ත පොකුරු කිහිපයක් සඳහා සංවර්ධන වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලදී. මේ අතර, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී කර්මාන්ත සංවර්ධන මණ්ඩලය විසින් දේශීය කර්මාන්තකරුවන් සඳහා නව වෙළඳපොළ සහ ආයෝජන අවස්ථා නිර්මාණය කිරීමට අවශ්‍ය සහාය සැපයීම සඳහා 'කර්මාන්ත 2022' ජාතික කාර්මික ප්‍රදර්ශනය, කර්මාන්ත 20ක සහභාගීත්වයෙන් යුතුව පවත්වන ලදී. තවද, රටේ කාර්මික සහ ව්‍යවසාය වර්ධනය ඉහළ නැංවීමේ අරමුණින් කර්මාන්ත සංවර්ධන මණ්ඩලය යටතේ 'Getup Startup for a Wealthy Nation' වැඩසටහන ආරම්භ කරන ලදී. පාසල් සිසුන් සඳහා 'ව්‍යවසායක සමාජ' ඇරඹීම, ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටලු විසඳීම සඳහා 'ව්‍යාපාරික සායන' සහ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් වෙත ආයෝජන යොමු කිරීම සඳහා අන්තර්ජාලය පදනම් කරගත් 'ආයෝජක සංචිත' වැඩසටහන ඇතුළුව ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග මෙම වැඩසටහන තුළින් ආවරණය කරන ලදී. තවද, මෙම වැඩසටහන යටතේ කර්මාන්තකරුවන් සහ කර්මාන්ත සංවර්ධන මණ්ඩලය අතර සමීප සම්බන්ධතාවක් ඇති කිරීම සඳහා වේදිකාවක් නිර්මාණය කරමින් කර්මාන්ත සංවර්ධන

මණ්ඩලයේ ජංගම දුරකථන යෙදුම සහ හදිසි ප්‍රතිචාර අංකයක් ද හඳුන්වා දෙන ලදී. මේ අතර, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය දිවයින පුරා සිටින කුඩා පරිමාණ ව්‍යවසායකයින් සවිබල ගැන්වීම අරමුණු කරගත් ඵලදායිතාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කළේය.

**කර්මාන්ත මණ්ඩල විසින් පුහුණු සහ ප්‍රවර්ධන කටයුතු හරහා දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා සහාය සැලසීම අඛණ්ඩව සිදුකරන ලදී.** මේ අතර, වසර තුළ දී, වෙළඳ හා ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳ නියෝජිත කණ්ඩායම්, ජාලකරණ වැඩසටහන්, ජාත්‍යන්තර අන්තර්ජාල සම්මන්ත්‍රණ සහ සාකච්ඡා සංසඳ සඳහා ලංකා වාණිජ මණ්ඩලය විසින් අඛණ්ඩව පහසුකම් සලසන ලදී. තවද, 'දේශසීමා හරහා වෙළඳාම සඳහා ව්‍යාපාරික ඉඟි' (Business tips for Trading Across Borders) යන තේමාව යටතේ අපනයන අභිමුඛ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වෙළඳ දැනුම ඉහළ නැංවීම සඳහා ලංකා වාණිජ මණ්ඩලය, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය සමඟ එක්ව කටයුතු කළේය. ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය විසින් දිවයින පුරා පුහුණු වැඩසටහන් මාලාවන් සංවිධානය කරමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය දැනුම්වත් කිරීමට සහ සවිබල ගැන්වීමට කැපවී ක්‍රියා කරන ලදී. එමෙන් ම, ජාතික වාණිජ මණ්ඩලය විසින් වෙළඳ අවස්ථා වැඩිදියුණු කිරීම සහ කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගනිමින්, කලාපීය කර්මාන්ත මණ්ඩල, රාජ්‍ය ආයතන, සහ ජාත්‍යන්තර ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් වලට එළඹෙන ලදී.

**තාක්ෂණික දියුණුව ප්‍රවර්ධනය කිරීම සඳහා වූ රජයේ ප්‍රයත්න වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක විය.** රජයේ මෙම ප්‍රයත්නය සඳහා පහසුකම් සපයමින්, ජාතික මූලික අධ්‍යයන ආයතනය විසින් දේශීය නිෂ්පාදන කර්මාන්ත සඳහා තාක්ෂණ සහ පර්යේෂණ භාවිතයන් යොදා ගැනීමට පහසුකම් සැලසීම සඳහා තාක්ෂණ හුවමාරු ප්‍රතිපත්තියක් සකස් කරන ලදී. තවද, ජාතික මූලික අධ්‍යයන ආයතනය පෞද්ගලික අංශයේ සමාගමක් සමඟ එක්ව, කාර්මික අරමුණු සඳහා ඇල්ගී භාවිතා කරමින් ජෛව ඩීසල් නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලියක නිරත වූ අතර, කෘෂිකාර්මික සංවර්ධන පියවරවලට සමගාමීව කුඹුරු අක්කර 280,000කට 'Biofilm' ජීව පොහොර හඳුන්වා දීම ද සිදුකර ඇත. මේ අතර, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය විසින් බලශක්ති, දියුණුකළ ද්‍රව්‍ය, ඛනිජ, රෙදිපිළි අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන ක්‍රියාවලි ඇතුළු ප්‍රධාන අංශවල පර්යේෂණ කටයුතු ද සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපළ වාණිජකරණයට අදාළව පවතින දුර්වලතා හඳුනාගැනීම පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින්, නවෝත්පාදන මත පදනම් වූ කාර්මික සංවර්ධනය දිරිගැන්වීම සඳහා ජාතික නවෝත්පාදන නියෝජිතායතනය වසර මුළුල්ලේ විවිධ ක්‍රියාකාරකම් සඳහා සක්‍රීයව සහභාගී විය. නව නිෂ්පාදන සංවර්ධන ක්‍රියාවලි සඳහා 2022 වසර තුළ දී පහසුකම් සලසන අතර ම, ජාතික විද්‍යා පදනම විසින් ශිෂ්‍යත්ව කිහිපයක් ලබාදීම සහ පර්යේෂණවල නියැළෙන්නන් සඳහා අවශ්‍ය පර්යේෂණ ආධාර ලබා දීමට ද අඛණ්ඩව පියවර ගන්නා ලදී.

**කාර්මික අංශයේ අඛණ්ඩ පැවැත්ම සහතික කරන අතර ම, ආර්ථික අර්බුදය ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා රජය විසින් කර්මාන්ත අංශයට නොකඩවා පහසුකම් සලසන ලදී.** ඉන්ධන හිඟය උග්‍ර ලෙස දක්නට ලැබුණු කාල සීමාවල දී, කාර්මික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යැමට පහසුකම් සලසමින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් කළමනාකරණය කෙරෙන ඩිපෝ මගින් කර්මාන්තශාලා සඳහා අවශ්‍ය ඉන්ධන සැපයීමට කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිර්දේශ ලිපි නිකුත් කිරීමට පියවර ගන්නා ලදී. තවද, දේශීය නිෂ්පාදකයින්ට සිය මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව සහතික කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට හැකිවන පරිදි ඉන්දියානු ණය වැඩසටහන යටතේ විදේශ විනිමය ද්‍රවශීලතා පහසුකම් සපයන ලදී. මේ අතර, පෙර නොවූ විරූ සාර්ව ආර්ථික අර්බුදය සහ කොවිඩ්-19 වසංගතය මගින් ඇති කළ අහිතකර ප්‍රතිඵල සැලකිල්ලට ගනිමින්, එක් එක් සිද්ධිය පදනම් කරගෙන, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ඇතුළු සියලුම ආර්ථික අංශවල බලපෑමට ලක් වූ ණයගැතියන් සඳහා 2022 වසරේ ජූලි මාසයේ සිට මාස හයක කාලයක් සඳහා යෝග්‍ය පරිදි ණය සහන ලබාදෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතනවලින් ඉල්ලීම් කර ඇත. තවද, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමයේ නොගෙවූ මුදලෙන් එ.ජ. ඩොලර් මිලියන 13.5ක පමණ මුදලක්, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් හදිසි ප්‍රතිචාර අවශ්‍යතා සඳහා නැවත වෙන් කරන ලදී. මෙහි මූලික පරමාර්ථය වූයේ කෘෂිකර්මාන්තය, සංචාරක කර්මාන්තය සහ අනෙකුත් අපනයන ආශ්‍රිත අංශවල නියැළී සිටින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සාමාන්‍ය බරිත තැන්පතු

අනුපාතිකයට එකතු කළ සාධාරණ ආන්තිකයක් මත තීරණය වන පොලී අනුපාතිකයට යෝග්‍ය පරිදි කාරක ප්‍රාග්ධන ණය ලබා දීමයි. තවද, අමුද්‍රව්‍ය මිල ඉහළ යෑම හේතුවෙන් ඇඟලුම් නිෂ්පාදකයින් මුහුණ දෙන අභියෝග සැලකිල්ලට ගනිමින් දේශීයව නිෂ්පාදනය නොකරන, අවශ්‍ය උපාංග සහ භාණ්ඩ ආනයනය කිරීම මත තීරු බදු සහන ලබාදීමට 2022 වසරේ අගෝස්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

### ඉදිකිරීම් සහ පතල් හා කැණීම්

**සැපයුම් සහ ඉල්ලුම් යන දෙඅංශයෙන්ම පැවති අවහිරතාවන්ගේ බලපෑමට ලක් වූ ඉදිකිරීම් කටයුතුවල එකතු කළ අගය, 2021 වසරේ වාර්තා කළ සියයට 4.4ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 20.9කින් පහත වැටුණි.** මෙහිදී, අමුද්‍රව්‍ය සහ ඉන්ධන හිඟය මෙන්ම ශීඝ්‍රයෙන් ඉහළ ගිය යෙදවුම් පිරිවැය, සැපයුම්කරුවන් විසින් භාණ්ඩ ණයට ලබා දීම සීමා කිරීම සහ රජයේ අරමුදලින් සිදු කරන ලද ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා වූ ගෙවීම් සැලකිය යුතු ලෙස ප්‍රමාද වීම සැපයුම් අංශයේ ඇති වූ ප්‍රධාන අවහිරතා විය. රජයේ අරමුදල් භාවිතයෙන් සිදු කරන ව්‍යාපෘති අත්හිටුවීම මෙන්ම ඉහළ පොලී අනුපාතික හේතුවෙන් පෞද්ගලික ආයෝජන සීමා වීමත් සමඟ ඇති වූ ඉල්ලුම් අංශයේ අවහිරතා මෙම තත්ත්වය තවදුරටත් උග්‍ර වීමට හේතු විය. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මෙම පසුබෑම එම අංශයේ දර්ශක තුළින් ද පිළිබිඹු වේ. ඒ අනුව, 2021 වසරේ දී සියයට 0.8ක සුළු පහත වැටීමක් වාර්තා කළ රටේ සමස්ත සිමෙන්ති උපයෝජ්‍යතාවය 2022 වසරේ දී සියයට 35.9කින් සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, 2021 වසරේ දී සියයට 4.7කින් වර්ධනය වූ ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය ද 2022 වසරේ දී සියයට 35.8කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් පෞද්ගලික නිවාස ඉදිකිරීම් කටයුතු සඳහා ලබා දෙන ණය ප්‍රමාණය ද 2022 වසරේ දෙසැම්බර් මස අවසාන වන විට පහත වැටීමක් වාර්තා කරන ලදී. මේ අතර, වැලි කැණීම් වැනි ඉදිකිරීම් කටයුතු සඳහා අමුද්‍රව්‍ය සපයන කැණීම් කටයුතුවලින් මූලිකව සමන්විත වන පතල් හා කැණීම් කටයුතු ද 2021 වසරේ දී වාර්තා කළ සියයට 1.4ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 31.0කින් පහත වැටුණි. තවද, මැණික් කැණීමේ කටයුතුවල පහත වැටීම පිළිබිඹු කරමින් 2022 වසරේ දී මැණික් අපනයන පරිමාව ද සියයට 8.9ක අඩු වීමක් වාර්තා කරන ලදී.


### විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණය

**විදුලිය, ජලය සහ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවල එකතු කළ අගය 2021 වසරේ දී වාර්තා කළ සියයට 2.2ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 4.3කින් අඩු වූ අතර, ඒ සඳහා, මූලිකවම විදුලිය සහ ගෑස් සැපයීම ආශ්‍රිත කටයුතුවල පහත වැටීම හේතු විය.** ඒ අනුව, වසර තුළ දී සැපයුම් අංශයේ දැඩි අවහිරතාවන්ට සහ මිල ඉහළ දැමීම් වලට ලක් වූ විදුලිය, ගෑස්, වාෂ්ප හා වායු සමීකරණ සැපයීමේ කටයුතු 2021 වසරේ වාර්තා කළ සියයට 4.9ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 5.9කින් අඩු විය. මේ අතර, 2021 වසරේ දී පිළිවෙලින් සියයට 17.8කින් සහ සියයට 3.3කින් පහත වැටුණු ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම හා බෙදා හැරීමේ කටයුතු සහ මලාපවහන, කසළ කළමණාකරණය හා එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණය කිරීමේ කටයුතු 2022 වසරේ දී පිළිවෙලින් සියයට 0.6කින් හා සියයට 3.9කින් වර්ධනය විය.

### සේවා

**බලශක්ති අර්බුදය, භාණ්ඩ හිඟය සහ ඉහළ උද්ධමනය හේතුවෙන් සේවා කටයුතුවල එකතු කළ අගය 2021 වසරේදී වාර්තා කළ සියයට 3.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේදී සියයට 2.0කින් පහත වැටුණි.** මෙම පහත වැටීම කෙරෙහි මූලික වශයෙන් දේපළ වෙළඳාම, රක්ෂණය, මූල්‍ය සේවා, සෞඛ්‍යය සහ වෘත්තීයමය සේවාවන්හි දක්නට ලැබුණු පසුබෑම දායක විය. තවද, තොරතුරු තාක්ෂණය, ගුවන් විදුලි හා රූපවාහිනී විකාශන සේවා මෙන්ම තොග හා සිල්ලර වෙළඳ කටයුතු ද පහත වැටීමක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, කොවිඩ්-19 වසංගතයේ බලපෑම ක්‍රමයෙන් පහව යෑමත් සමඟ සංචාරක කටයුතු ඉහළ


**2.11 රූප සටහන**
**2022 වසරේ සේවා කටයුතුවල වර්ධන වේගයන් (අ)**




(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2.12 රූප සටහන**
**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (අ)**




(අ) 0 සිට 100 දක්වා පරාසය තුළ විහිදෙන විසරණ දර්ශකයක් (Diffusion Index) වන මෙහි දර්ශක අගය එහි කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50ට වඩා වැඩි නම් අදාල ක්‍රියාකාරකමෙහි වර්ධනයක් ද දර්ශක අගය 50ට වඩා අඩු නම් එහි පහත වැටීමක් ද පෙන්නුම් කෙරේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යැම හේතුවෙන් නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා වසර තුළදී සැලකියයුතු ලෙස වර්ධනය වූ අතර, ප්‍රවාහනය, විදුලි සංදේශ සේවා, අධ්‍යාපනය, රාජ්‍ය පරිපාලනය, වෙනත් පෞද්ගලික සේවා සහ තැපැල් හා කුරියර් සේවා ද යහපත් වර්ධනයන් වාර්තා කරන ලදී. සේවා අංශයේ සමස්ත පසුබෑස්ම, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මාසිකව සම්පාදනය කරනු ලබන සේවා අංශයේ ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය මෙන්ම ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ සේවා කටයුතුවලට අදාල ඉල්ලුම් සහ විකුණුම් උප දර්ශක ද වසර තුළ දී සමස්තයක් වශයෙන් පහත වැටීම තුළින් පිළිබිඹු විය.

## තොග සහ සිල්ලර වෙළඳාම

**සැපයුම් අංශයේ අවහිරතා මෙන්ම ඉල්ලුම පහළ යෑම හේතුවෙන් 2022 වසරේ දී තොග සහ සිල්ලර වෙළඳ කටයුතුවල එකතු කළ අගය, 2021 වසරේ දී වාර්තා කළ සියයට 1.5ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.2කින් පහත වැටුණි.** ඒ අනුව, 2021/22 මහ කන්නයේ අස්වැන්න අඩු වීම, ආනයන සීමා කිරීම නිසා පාරිභෝගික භාණ්ඩ ද ඇතුළුව භාණ්ඩ ආනයනය පහත වැටීම සහ ඛනිජතෙල් සැපයුමට බාධා ඇති වීම ආදිය හේතුවෙන් ඇති වූ සැපයුම් අංශයේ අවහිරතා වසර තුළ වෙළඳ කටයුතු කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. තවද, විශේෂයෙන්ම වසරේ දෙවන භාගය වන විට පැවති ඉහළ උද්ධමනකාරී තත්ත්වය හේතුවෙන් පාරිභෝගිකයන්ගේ ක්‍රය ශක්තිය හීන වීම, බදු වැඩි කිරීම, විදුලිය හා ජල සම්පාදනය වැනි මහජන උපයෝගිතා සේවාවල ගාස්තු ඉහළ නැංවීම මෙන්ම ඉහළ පොලී අනුපාතික නිසා ණය ලබා ගැනීම අධෛර්යමත් වීම වැනි ප්‍රවණතා හේතුවෙන් ඇති වූ ඉල්ලුම පහළ යෑම තොග සහ සිල්ලර වෙළඳ කටයුතු තවදුරටත් පහත වැටීමට හේතු විය.

## ප්‍රවාහනය සහ ගබඩා පහසුකම්

**කොවිඩ්-19 වසංගතය ක්‍රමයෙන් පහව යැමත් සමගම මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා සහ ගබඩා පහසුකම් සැපයීමේ කටයුතුවල එකතුකළ අගය 2021 වසරේදී වාර්තා කළ සියයට 0.9ක සුළු වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 3.5ක වර්ධනයක් වාර්තා කරන ලදී.** ප්‍රවාහන කටයුතු පිළිබඳ දර්ශක සැලකීමේ දී, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, පෞද්ගලික බස් ධාවකයන් සහ ශ්‍රී ලංකා දුම්රිය සේවය මගින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් සංඛ්‍යාව 2022 වසරේ දී සැලකියයුතු ලෙස ඉහළ යන ලදී. මේ කෙරෙහි ඉන්ධන පිරිවැය සැලකිය යුතු ලෙස වැඩි වීම නිසා පොදු ප්‍රවාහන සේවා සඳහා ඉල්ලුම ඉහළ යෑම මෙන්ම පොදු ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රමුඛතා පදනම යටතේ ඉන්ධන ලබා දීම ද හේතු විය. තවද, සංචාරක කටයුතු යථාවත් වීමත් සමගම ගුවන් ප්‍රවාහන කටයුතුවල සිදුවූ ක්‍රමික වර්ධනය පිළිබිඹු කරමින් වසර තුළ දී ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින් මෙහෙයවන ලද මගී කිලෝමීටර් ප්‍රමාණයේ ඉහළ යෑමක් වාර්තා විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළඳ කටයුතුවල දක්නට ලැබුණු මන්දගාමීත්වය හේතුවෙන් ශ්‍රී ලංකා වරායයන් මගින් හසුරුවනු ලැබූ බහාලුම් (අඩි 20ට සමාන බහාලුම් ඒකක වලින්) හා නැව් බඩු ප්‍රමාණය වසර තුළ දී පහත වැටුණි.

## නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා

**පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් මෙන්ම ඉන් අනතුරුව කොවිඩ්-19 වසංගතයේ බලපෑම හේතුවෙන් ද පහත වැටී තිබූ නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා කටයුතු 2021 වසරේ දී වාර්තා කළ සියයට 1.7ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 27.0ක ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී.** බලශක්ති සැපයුම් හිඟය මෙන්ම සමාජයීය වශයෙන් පැන නැගුණු අසහනකාරී තත්ත්ව යටතේ ඇති වූ බාධා හමුවේ වුවද, පසුගිය වසරට සාපේක්ෂව සංචාරක පැමිණීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම මේ සඳහා බෙහෙවින් දායක විය. මෙම ඉන්ධන හිඟය ඇතුළු දැඩි අපහසුතා පැවති කාලයේ දී

ප්‍රවාහන පහසුකම් ද ඇතුළත් විශේෂිත සංචාරක පැකේජ ලබා දීම වැනි ක්‍රමවේද තුළින් සංචාරකයන් ආකර්ශනය කර ගැනීමට බොහෝ හෝටල් කටයුතු කරන ලදී. තවද, පසුගිය වසරේදී ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන විදේශ මුදල් ඒකකයන්ට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම ද විදේශීය සංචාරකයින්ට මෙරට වඩා ආකර්ශනීය ගමනාන්තයක් වීමට හේතු විය. කෙසේ වුවද, ඇතැම් ජාත්‍යන්තර මාධ්‍ය තුළින් මෙරට ආර්ථික අර්බුදය අතිශයෝක්තියෙන් යුතුව වාර්තා කිරීම මගින් රට පිළිබඳව ඇති කරන ලද අයහපත් ප්‍රතිරූපය මෙන්ම සමහර රටවල් විසින් නිකුත් කරන ලද අවවාදාත්මක සංචාරක මාර්ගෝපදේශ ද වසර තුළදී සංචාරක කර්මාන්තය විසින් අත්කරගත හැකිව තිබූ වර්ධනයට බාධා ඇති කරන ලදී. තවද, සීමාසහිතව ඉන්ධන නිකුත් කිරීම දේශීය සංචාරකයන්ගේ දිගු දුර සංචාර කටයුතු පහළ යෑමට හේතු විය.

### මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය හා දේපළ වෙළඳාම

**සමස්තයක් වශයෙන් මූල්‍ය, රක්ෂණය සහ නිවාස අයිතිය ද ඇතුලත් දේපළ වෙළඳාම් කටයුතුවල එකතු කළ අගය 2021 වසරේ දී වාර්තා කළ සියයට 7.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේදී සියයට 15.4කින් පහත වැටුණි.** රටේ පැවති ඉහළ පොලී අනුපාතික හේතුවෙන් ණය සඳහා වූ ඉල්ලුම අඩු වූ අතර, උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම මෙම සේවාවල මූර්ත එකතුකළ අගය පහත වැටීම කෙරෙහි හේතු විය. එසේම, ශ්‍රී ලංකා මහ බැංකුව කාර්තුමය වශයෙන් පවත්වනු ලබන ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ දී අනාවරණය වූ පරිදි ඉහළ උද්ධමනය සහ දුර්වල ආර්ථික තත්ත්වය හේතුවෙන් ගණුදෙනුකරුවන්ගේ ණය පියවීමේ හැකියාව පහත වැටීම බැංකු විසින් ණය ලබා දීම සීමා කිරීමට හේතු වී ඇත. ඒ අනුව, මූල්‍ය හා මූල්‍ය අතරමැදිකරණ සේවා 2021 වසරේ දී වාර්තා කළ සියයට 7.0ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 11.0කින් පහත වැටුණු අතර, නිවාස අයිතිය ද ඇතුළු දේපළ වෙළඳාම් කටයුතු 2021 වසරේ දී වාර්තා කළ සියයට 4.4ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 12.1කින් පහත වැටී ඇත. තවද, 2021 වසරේ දී සියයට 26.4ක වර්ධනයක් වාර්තා කළ රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ විශ්‍රාම අරමුදල් කළමනාකරණ කටයුතු ද එහි විශ්‍රාම අරමුදල් කළමනාකරණ කටයුතුවල සිදුවූ පසුබෑස්ම හේතුවෙන් 2022 වසරේ දී සියයට 47.2කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.

### තොරතුරු සහ සන්නිවේදනය

**කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමගම ඇති වූ ඉල්ලුම හේතුවෙන් පසුගිය වසරවල ඉතා ඉහළ වර්ධනයක් පෙන්නුම් කළ තොරතුරු සහ සන්නිවේදන සේවාවල එකතු කළ අගය 2021 වසරේ දී වාර්තා කළ සියයට 21.0ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ වසංගත තත්ත්වය පහව යෑමත් සමග මෙම සේවා සඳහා වූ ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හා දේශීය මෙන්ම විදේශීය වශයෙන් ද ආර්ථික කටයුතු මන්දගාමී වීමත් සමඟ සියයට 0.3කින් පහත වැටුණි.** තවද, විදුලිය හා ඉන්ධන සැපයුමට සිදු වූ බාධා සහ අවශ්‍ය තාක්ෂණික උපකරණ හිඟ වීම ද තොරතුරු සහ සන්නිවේදන සේවාවල වර්ධනයට බාධා පමුණුවන ලදී. මෙහිදී, මෙම කාණ්ඩය සඳහා ප්‍රධාන දායකත්වය දක්වනු ලබන පරිගණක වැඩසටහන් සහ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා කටයුතු 2021 වසරේ දී වාර්තා කළ සියයට 25.2ක වර්ධනයට සාපේක්ෂව, විදුලි කප්පාදුව වැනි දේශීය වශයෙන් වූ සැපයුම් අංශයේ ගැටළු සහ ගෝලීය ඉල්ලුම මන්දගාමී වීම ද හේතුවෙන් 2022 වසරේ දී සියයට 2.3කින් පහත වැටුණි. මේ අතර, 2021 වසරේ දී සියයට 14.2කින් වර්ධනය වූ විදුලි සංදේශ සේවා, ඉහළ උද්ධමනය නිසා ක්‍රය ශක්තිය පහළ යෑම මෙන්ම විදුලි සංදේශ සේවා මත පැනවූ බදු ඉහළ නැංවීම හේතුවෙන් ඉල්ලුම අඩු වීම තුළ 2022 වසරේ දී සියයට 3.1ක අඩු වේගයකින් වර්ධනය විය.

### අනෙකුත් සේවා කටයුතු

**රටෙහි පැවති අයහපත් ආර්ථික වාතාවරණය හේතුවෙන් අනෙකුත් සේවා කටයුතු බොහොමයක එකතු කළ අගය 2022 වසරේ දී පහත වැටුණි.** ප්‍රධාන වශයෙන් වසරේ පළමු භාගයේ පැවති සැපයුම් හිඟය ද වසරේ අවසාන භාගය වන විට ඉල්ලුමේ පහත වැටීමද මේ සඳහා හේතු විය. ඒ අනුව, පැවති අයහපත් ව්‍යාපාරික වාතාවරණය පිළිබිඹු කරමින් වෘත්තීයමය සේවා සහ ගුවන් විදුලි-රූපවාහිනී විකාශන හා එම නිෂ්පාදන කටයුතු පිළිවෙලින් සියයට 4.0ක් සහ සියයට 11.0ක් බැගින් 2022 වසරේ දී පහත වැටුණි. තවද, කොවිඩ්-19 වසංගතයේ දැඩි බලපෑමට ලක්ව තිබූ වසරවල දී ඉහළ වර්ධනයක් වාර්තා කළ සෞඛ්‍ය සේවා කටයුතු ද 2022 වසරේ දී සියයට 8.4කින් පහත වැටුණි. කෙසේ වුවද, අධ්‍යාපනය, රාජ්‍ය පරිපාලනය හා ජාතික ආරක්ෂාව, වෙනත් පෞද්ගලික සේවා සහ තැපැල් හා කුරියර් සේවා 2022 වසරේ දී ආර්ථික වර්ධනයට යහපත් දායකත්වයක් දක්වන ලදී.

## 2.5. වියදම

**පරිභෝජන සහ ආයෝජන වියදමෙන් සමන්විත වන දළ දේශීය වියදම (ද.දේ.වි.), පවත්නා මිල අනුව 2021 වසරේ දී වාර්තා කළ සියයට 13.6ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 32.3ක ඉහළ අගයකින් වර්ධනය වූ අතර, ඒ සඳහා වසර තුළ පැවති ඉහළ මිල මට්ටම් බොහෝ දුරට හේතු විය.** ද.දේ.වි.හි අන්තර්ගත පරිභෝජන වියදම 2021 වසරේ දී වාර්තා කළ සියයට 8.4ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 34.3කින් වර්ධනය වූ අතර, ආයෝජන වියදම ද පෙර වසරේ දී වාර්තා කළ සියයට 25.1ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 28.4කින් වර්ධනය විය. විදේශීය අංශය සැලකූ විට, පවත්නා මිල අනුව ශුද්ධ විදේශීය ඉල්ලුම පෙර වසරේ දී වාර්තා කළ සියයට 34.7ක පහත වැටීමට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 34.1කින් වර්ධනය විය. මේ කෙරෙහි භාණ්ඩ හා සේවා ආනයන වාර්තා කළ සියයට 41.2ක වර්ධනය අභිබවා භාණ්ඩ හා සේවා අපනයනයේ වාර්තා කළ සියයට 74.1ක සැලකිය යුතු වර්ධනය හේතු විය. මෙසේ ආනයන සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය වීම කෙරෙහි ආනයන සීමා කිරීම සහ විදේශ විනිමය හිඟය නිසා ආනයන පරිමා පහත වැටීම බලපෑ අතර, ශ්‍රී ලංකා රුපියල ප්‍රධාන විදේශ මුදල් ඒකකයන්ට සාපේක්ෂව තියුණු ලෙස අවප්‍රමාණය වීම අපනයන සඳහා වාසිදායක තත්ත්වයක් ඇති කරන ලදී. ඒ අනුව, ද.දේ.වි. සහ ශුද්ධ විදේශීය ඉල්ලුමෙන් සැදුම්ලත් ද.දේ.නි., පවත්නා මිල අනුව 2021 වසරේ දී වාර්තා කළ සියයට 12.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 37.2ක වර්ධනයක් වාර්තා කරන ලදී.

**ස්ථාවර මිල අනුව ද.දේ.වි. වසර තුළ දී සැලකිය යුතු ලෙස පහත වැටුණු අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, ක්‍රය ශක්තිය අඩු වීම, ඉහළ පොලී අනුපාතික හේතුවෙන් ආයෝජනය මෙන්ම පරිභෝජනය ද අධෛර්යමත් වීම සහ භාණ්ඩ හිඟය හේතු විය.** ඒ අනුව, 2021 වසරේ දී සියයට 2.7කින් වර්ධනය වූ ද.ජා.වි. 2022 වසරේ දී පරිභෝජන සහ ආයෝජන යන වියදම් ද්විත්වයම පිළිවෙලින් සියයට 7.5කින් සහ සියයට 24.9කින් පහත වැටීම හේතුවෙන් සියයට 13.2කින් පහත වැටුණි. මේ අතර, අපනයන පරිමාව වර්ධනය වීමේ සහ ආනයන පරිමාව පහත වැටීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස, ස්ථාවර මිල අනුව ශුද්ධ විදේශීය ඉල්ලුම 2022 වසරේ දී යහපත් අතට පරිවර්තනය වෙමින් සියයට 101.1කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. ඒ අනුව, ස්ථාවර මිල අනුව ද.දේ.නි. 2021 වසරේ දී වාර්තා කළ සියයට 3.5ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 7.8ක පහත වැටීමක් වාර්තා කරන ලදී.

**2.9 සංඛ්‍යා සටහන**
**සමස්ත ඉල්ලුම (අ)**

රුපියල් මිලියන

| අයිතමය | පවත්නා වෙළෙඳපොළ මිල අනුව | | | 2015 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|
| | 2020 (ආ) | 2021 (ආ)(ඇ) | 2022 (ඇ) | 2020 (ආ) | 2021 (ආ)(ඇ) | 2022 (ඇ) |
| 1. දේශීය ඉල්ලුම | | | | | | |
| පරිභෝජනය | 11,469,129 | 12,434,283 | 16,700,557 | 9,127,604 | 9,293,726 | 8,596,156 |
| (% වෙනස) | 0.6 | 8.4 | 34.3 | -4.9 | 1.8 | -7.5 |
| දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | 5,168,381 | 6,466,957 | 8,304,627 | 4,349,587 | 4,544,089 | 3,412,566 |
| (% වෙනස) | -4.8 | 25.1 | 28.4 | -0.6 | 4.5 | -24.9 |
| **මුළු දේශීය ඉල්ලුම** | **16,637,510** | **18,901,240** | **25,005,184** | **13,477,191** | **13,837,815** | **12,008,722** |
| **(% වෙනස)** | **-1.1** | **13.6** | **32.3** | **-3.6** | **2.7** | **-13.2** |
| 2. විදේශීය ඉල්ලුම | | | | | | |
| භාණ්ඩ සහ සේවා අපනයන | 2,418,542 | 2,980,263 | 5,187,941 | 1,961,341 | 2,159,760 | 2,380,539 |
| (% වෙනස) | -30.3 | 23.2 | 74.1 | -29.6 | 10.1 | 10.2 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 3,384,516 | 4,281,313 | 6,045,399 | 2,842,981 | 2,959,641 | 2,371,412 |
| (% වෙනස) | -22.9 | 26.5 | 41.2 | -20.1 | 4.1 | -19.9 |
| **ශුද්ධ විදේශීය ඉල්ලුම** | **-965,975** | **-1,301,049** | **-857,458** | **-881,640** | **-799,881** | **9,127** |
| **(% වෙනස)** | **-5.1** | **-34.7** | **34.1** | **-14.1** | **9.3** | **101.1** |
| 3. මුළු ඉල්ලුම | **15,671,535** | **17,600,191** | **24,147,726** | **12,595,550** | **13,037,934** | **12,017,849** |
| **(% වෙනස)** | **-1.5** | **12.3** | **37.2** | **-4.6** | **3.5** | **-7.8** |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## පරිභෝජනය

**ආර්ථිකයේ විශාලතම වියදම් කාණ්ඩය වන පරිභෝජන වියදම පවත්නා මිල අනුව 2021 වසරේ වාර්තා කළ සියයට 8.4ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 34.3කින් වර්ධනය වූ අතර, මේ කෙරෙහි ප්‍රධාන වශයෙන් පාරිභෝගික භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතු විය.** මෙහිදී, පරිභෝජන වියදමෙහි ප්‍රධානතම වියදම් කාණ්ඩය වන පෞද්ගලික පරිභෝජන වියදම 2022 වසර තුළදී සමස්ත පරිභෝජන වියදමෙන් සියයට 89.7ක් නියෝජනය කරමින් ඉහළ වේගයකින් වර්ධනය විය. මේ අතර, සමස්ත පරිභෝජන වියදමෙහි අන්තර්ගත රජයේ පරිභෝජන වියදම ද පෙර වසරට වඩා වැඩි වේගයකින් වර්ධනය විය.

**පාරිභෝගිකයන්ගේ ක්‍රය ශක්තිය පිරිහීම සහ සැපයුම් හිඟය හේතුවෙන් පෞද්ගලික පරිභෝජන වියදම මූර්ත වශයෙන් පහත වැටීමක් සිදු වුවද, 2022 වසරේ පැවති ඉහළ මිල මට්ටම් හේතුවෙන් පවත්නා මිල අනුව 2021 වසරේ දී වාර්තා කළ සියයට 9.4ක වර්ධනයට සාපේක්ෂව සියයට 39.0කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.** මෙම වර්ධනය කෙරෙහි, පිළිවෙලින් සියයට 25.9කින් සහ සියයට 69.8කින් වර්ධනය වූ ආහාර හා මධ්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය සහ ප්‍රවාහනය යන ප්‍රධාන පෞද්ගලික පරිභෝජන වියදම් කාණ්ඩයන් මූලික වශයෙන් දායක විය. පවත්නා මිල අනුව, පෞද්ගලික පාරිභෝජන වියදමෙහි දක්නට ලැබුණු ඉහළ වර්ධනය සඳහා ගෝලීය වශයෙන් භාණ්ඩ මිල ඉහළ යෑම සහ දේශීය මුදල් ඒකකය අවප්‍රමාණය වීම නිසා 2022 වසරේ දී ආනයනික පාරිභෝගික භාණ්ඩවල මිල මට්ටම් වැඩිවීම සැලකිය යුතු ලෙස දායක විය. තවද, බලශක්ති මිල ගණන් ඉහළ නැංවීමත් සමඟ විශේෂයෙන් ප්‍රවාහනය, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් බලශක්ති ආශ්‍රිත ගෘහස්ථ පෞද්ගලික පරිභෝජන වියදම් ඉහළ ගිය අතර, එම වැඩි වීම අනෙකුත් බොහෝ පෞද්ගලික පරිභෝජන වියදම් කාණ්ඩයන් වෙත ව්‍යාප්ත විය.

**රජයේ පුද්ගල පරිභෝජන වියදම හා සමූහ පරිභෝජන වියදමෙන් සමන්විත වන රජයේ සමස්ත පරිභෝජන වියදම, පවත්නා වෙළඳපොළ මිල අනුව 2021 වසරේ වාර්තා කළ සියයට 2.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 3.8ක වේගයකින් වර්ධනය විය.** ඒ අනුව, මෙහි ප්‍රධානතම වියදම් කාණ්ඩය වන සෞඛ්‍ය, අධ්‍යාපනය, සමාජ ආරක්ෂණය සහ ක්‍රීඩා, විනෝදාංශ හා සංස්කෘතික කටයුතු ආදිය සඳහා වන රජයේ පුද්ගල පරිභෝජන වියදම 2021 වසරේ වාර්තා කළ සියයට 1.0ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 5.6කින් වර්ධනය විය. තවද,

**2.10 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල අනුව පෞද්ගලික පරිභෝජන වියදමේ සංයුතිය (අ)**

| කාණ්ඩය | මුළු පෞද්ගලික පරිභෝජන වියදමට දායකත්වය (%) | | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|
| | 2020 (ආ) | 2021 (ආ)(ඇ) | 2022 (ඇ) | 2021 (ආ)(ඇ) | 2022 (ඇ) |
| 1. ආහාරපාන සහ මද්‍යසාර නොවන පානීය ද්‍රව්‍ය | 31.4 | 33.4 | 30.2 | 16.2 | 25.9 |
| 2. මද්‍යසාර, දුම්කොළ නිෂ්පාදන සහ වෙනත් මත්ද්‍රව්‍ය | 1.9 | 1.7 | 1.4 | 0.5 | 10.8 |
| 3. ඇඳුම්-පැළඳුම් සහ පාවහන් | 7.4 | 4.2 | 5.1 | -38.0 | 70.7 |
| 4. නිවාස කුලී, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් බලශක්ති භාවිතයන් | 10.3 | 10.2 | 8.1 | 8.6 | 10.8 |
| 5. ගෘහභාණ්ඩ, ගෘහ උපකරණ සහ දෛනික නිවාස අලුත්වැඩියාවන් | 1.6 | 1.8 | 1.5 | 26.4 | 18.3 |
| 6. සෞඛ්‍යය | 2.7 | 3.7 | 3.1 | 48.4 | 16.9 |
| 7. ප්‍රවාහනය | 21.3 | 21.2 | 25.9 | 9.0 | 69.8 |
| 8. සන්නිවේදනය | 1.0 | 1.1 | 0.8 | 15.5 | -0.3 |
| 9. ක්‍රීඩා, විනෝදාංශ සහ සංස්කෘතික කටයුතු | 3.2 | 3.2 | 3.0 | 9.1 | 31.1 |
| 10. අධ්‍යාපනය | 1.7 | 1.6 | 1.5 | 5.6 | 26.6 |
| 11. හෝටල් සහ ආපනශාලා පහසුකම් | 2.8 | 3.4 | 5.1 | 30.6 | 109.0 |
| 12. වෙනත් තැනක සඳහන් නොවන විවිධ භාණ්ඩ හා සේවා ලබාගැනීම | 15.1 | 15.0 | 15.9 | 8.7 | 47.4 |
| 13. ශ්‍රී ලාංකිකයින් එතෙරදී කරන වියදම් | 1.0 | 0.5 | 0.7 | -38.6 | 68.8 |
| 14. අඩු කළා: විදේශිකයින් මෙතෙරදී කරන වියදම් | 1.3 | 1.0 | 2.3 | -18.2 | 225.7 |
| **මුළු පෞද්ගලික පරිභෝජන වියදම** | **100.0** | **100.0** | **100.0** | **9.4** | **39.0** |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2

සාමාන්‍ය රජයේ සේවා, ආරක්ෂාව, නීතිය හා සාමය වැනි සමස්තයක් ලෙස ප්‍රජාවටම ප්‍රතිලාභ සලසන කටයුතු සඳහා වන පරිභෝජන වියදම්වලින් සමන්විත වන රජයේ සමූහ පරිභෝජන වියදම 2021 වසරේ දී වාර්තා කළ සියයට 3.9ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 1.7කින් වර්ධනය විය.

### ආයෝජන

**ස්ථාවර මිල අනුව ආයෝජන වියදමෙහි සැලකිය යුතු පසුබෑමක් පැවතිය ද භාණ්ඩවල මිල මට්ටම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් පවත්නා මිල අනුව ආයෝජන වියදම 2021 වසරේ දී වාර්තා කළ සියයට 25.1ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 28.4කින් වර්ධනය විය.** විදේශ විනිමය හිඟය ද ශ්‍රී ලංකා රුපියල ශීඝ්‍ර ලෙස අවප්‍රමාණය වීම ද නිසා ආයෝජන භාණ්ඩ උග්‍ර ලෙස හිඟ වීම හා මිල වැඩි වීම මෙන්ම, රජයේ ඉදිකිරීම් ව්‍යාපෘති අත්හිටුවීම සහ ඉහළ පොලී අනුපාතික හේතුවෙන් වසර තුළ දී ආයෝජන සඳහා වූ පරිසරය අයහපත් තත්ත්වයක පැවතුණි. කෙසේ වුවද, වසර තුළ දී ඉදිකිරීම් ද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණවල දක්නට ලැබුණු මිල ඉහළ යෑම පිළිබිඹු කරමින් ආයෝජන වියදම සඳහා විශාලතම දායකත්වය දක්වන දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය පවත්නා මිල අනුව, පෙර වසරේ වාර්තා කළ සියයට 15.8ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 21.9කින් වර්ධනය විය. මේ අතර, තොග/පරිලේඛන වෙනස් වීම් සහ වටිනා දේ අත්පත් කර ගැනීම් හා අතහැරීම් ද වසර තුළ දී වර්ධනය විය.

**ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි සමාගම් විසින් ලබාගත් ණය ද ඇතුළුව සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය, 2021 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 780.2ට සාපේක්ෂව වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත 2022 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 1,075.6ක්[6] දක්වා සියයට 37.9කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය.** ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි සමාගම් වෙත ලැබෙන මුළු විදේශ ආයෝජන වලින් සියයට 54.0ක් පමණ වන යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා වූ සෘජු විදේශ ආයෝජන ලැබීම් 2022 වසරේ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇති අතර, 2022 වසරේ

6 මෙයට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත ලැබුණු ණය ද ඇතුළත් වූ ලැබීම් අයත් වන අතර, මෙම ඇස්තමේන්තු මෙම වාර්තාවේ 5වන පරිච්ඡේදයේ දක්වා ඇති ඇස්තමේන්තුවලට සමාන නොවේ. මෙම වාර්තාවේ 5 වන පරිච්ඡේදයේ දක්වා ඇති ඇස්තමේන්තුවලට ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවන සමාගම් සඳහා වූ සෘජු විදේශ ආයෝජනද ඇතුළත්වීම ප්‍රධාන වශයෙන් එයට හේතු වේ. ඒ අනුව, 5වන පරිච්ඡේදයේ සඳහන් 2022 වසරේ දී සමස්ත සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 1,181කි.

**2.11 සංඛ්‍යා සටහන**


**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වූ ව්‍යවසායවල ආයෝජන සහ සේවා නියුක්තිය**

| කාණ්ඩය | ව්‍යාපෘති සංඛ්‍යාව | | ඇස්තමේන්තුගත ආයෝජන (රු. මිලියන) | | | | | | ඇස්තමේන්තුගත සේවා නියුක්තිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2021 (අ) | 2022 (ආ) | 2021 (අ) | | | 2022 (ආ) | | | 2021 (අ) | 2022 (ආ) |
| | | | විදේශීය | දේශීය | එකතුව | විදේශීය | දේශීය | එකතුව | | |
| ආයෝජන මණ්ඩලය (1978 අංක 4 දරන පනත යටතේ) | | | | | | | | | | |
| අනුමත කළ ව්‍යාපෘති | 135 | 160 | 347,871 | 166,184 | 514,056 | 282,842 | 263,529 | 546,371 | 25,632 | 26,177 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 130 | 158 | 346,878 | 165,735 | 512,613 | 281,789 | 262,707 | 544,496 | 25,459 | 26,013 |
| 16 වන වගන්තිය යටතේ | 5 | 2 | 993 | 449 | 1,442 | 1,054 | 821 | 1,875 | 173 | 164 |
| 17 වන වගන්තිය යටතේ ගිවිසගත් ව්‍යාපෘති (ඇ) | 93 | 142 | 41,305 | 74,130 | 115,436 | 327,810 | 188,864 | 516,674 | 21,685 | 21,685 |
| 17 වන වගන්තිය යටතේ දැනට කර ඇති ආයෝජන (ඈ) (ඉ) | 1,875 | 1,922 | 2,258,989 | 2,021,406 | 4,280,395 | 2,420,110 | 2,055,046 | 4,475,156 | 486,362 | ලැ.නො. |
| වාණිජ කටයුතුවල නිරතවූ ව්‍යාපෘති (ඈ) | 2,735 | 2,718 | 651,662 | 1,057,348 | 1,709,010 | 662,641 | 1,059,813 | 1,722,454 | 459,828 | 461,371 |
| 17 වන වගන්තිය යටතේ (ඇ) | 2,100 | 2,116 | 625,665 | 1,020,523 | 1,646,188 | 637,450 | 1,029,961 | 1,667,412 | 375,007 | 380,939 |
| ඇඟලුම් කම්හල් 200 වැඩසටහන යටතේ | 116 | 107 | 505 | 25,639 | 26,143 | 503 | 18,714 | 19,217 | 56,543 | 52,513 |
| 16 වන වගන්තිය යටතේ | 519 | 495 | 25,492 | 11,187 | 36,679 | 24,688 | 11,137 | 35,825 | 28,278 | 27,919 |
| කර්මාන්ත අමාත්‍යාංශය | | | | | | | | | | |
| ලියාපදිංචි වූ සමාගම් (ඈ) | 3,259 | 3,451 | - | - | 209,366 | - | - | 204,600 | ලැ.නො. | ලැ.නො. |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පුළුල් කළ ව්‍යාපෘති ද ඇතුළත්ව
(ඈ) වර්ෂය අවසානයේ සමුච්චිත අගය
(ඉ) සමුච්චිත සැබෑ ආයෝජන අගයන් දක්වා ඇත.
සටහන: ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ අනුමත කළ හා ගිවිසගත් ව්‍යාපෘති, ආයෝජන උපරිමයන් හෝ වෙනත් නම් කරන ලද විශේෂිත අවශ්‍යතාවන්ට යටත්ව තීරුබදු සහ විනිමය පාලන විධිවිධානවලින් නිදහස් වේ.

මූලයන්: ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
කර්මාන්ත අමාත්‍යාංශය

### 2.13 රූප සටහන
### ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි ව්‍යවසායවල විදේශීය සෘජු ආයෝජන (අ) (එ.ජ.ඩොලර් මිලියන)




(අ) ණය ද ඇතුළත්ව

මූලයː ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

සමස්ත සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයේ වර්ධනයට එය ප්‍රධාන වශයෙන් දායක විය. තවද, ආයෝජන මණ්ඩලය යටතේ ලියාපදිංචි සමාගම් වෙත ලැබෙන මුළු විදේශ ආයෝජන වලින්, පිළිවෙළින්, සියයට 34.0ක් සහ සියයට 13.0ක් පමණ වන නිෂ්පාදන සහ සේවා අංශ වෙත වූ සෘජු විදේශ ආයෝජන ලැබීම් ද වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, කෘෂිකාර්මික අංශය සඳහා වූ සෘජු විදේශ ආයෝජන ලැබීම් 2022 වසරේදී ද අඛණ්ඩව අඩු අගයක පැවතුණි. 1978 අංක 4 දරණ ආයෝජන මණ්ඩල පනතේ 16වන සහ 17වන වගන්ති යටතේ, ආයෝජන මණ්ඩලය විසින් වසර තුළ අනුමත කරන ලද ව්‍යාපෘතිවල මුළු වටිනාකම, පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 514.1 සිට රුපියල් බිලියන 546.4ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 6.3ක වර්ධනයක් පෙන්නුම් කළේය. ආයෝජන මණ්ඩල පනතේ 16වන සහ 17වන වගන්ති යටතේ වාණිජ මෙහෙයුම් ආරම්භ කළ ව්‍යාපෘතිවල ඇස්තමේන්තුගත ආයෝජන වටිනාකම, පිළිවෙළින්, රුපියල් බිලියන 35.8ක් සහ රුපියල් බිලියන 1667.4ක් විය.

## පවත්නා සම්පත් සහ උපයෝජනය

**දේශීය සම්පත් නියෝජනය කරනු ලබන ද.දේ.නි. මෙන්ම, විදේශීය සම්පත් නියෝජනය කරනු ලබන ආනයනවලින් ද සමන්විත වන ආර්ථිකයේ සමස්ත සම්පත් ප්‍රමාණය, පවත්නා මිල අනුව 2021 වසරේ දී වාර්තා කළ සියයට 14.8ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 38.0ක ඉහළ වේගයකින් වර්ධනය විය.**


### 2.12 සංඛ්‍යා සටහන
### සම්පත් සංයුතිය සහ උපයෝජනය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)

| අයිතමය | ප්‍රතිශතාත්මක දායකත්වය (%) | | වර්ධනය (%) | |
|---|---|---|---|---|
| | 2021 (ඇ) | 2022 | 2021 (ඇ) | 2022 |
| **1. සම්පත්** | | | | |
| දළ දේශීය නිෂ්පාදිතය | 80.4 | 80.0 | 12.3 | 37.2 |
| භාණ්ඩ සහ සේවා ආනයන | 19.6 | 20.0 | 26.5 | 41.2 |
| **එකතුව** | **100.0** | **100.0** | **14.8** | **38.0** |
| **2. උපයෝජනය** | | | | |
| පරිභෝජනය | 56.8 | 55.3 | 8.4 | 34.3 |
| දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 21.2 | 18.7 | 15.8 | 21.9 |
| තොග/පරිලේඛන වෙනස්වීම් සහ වටිනාදේ අත්පත් කර ගැනීම් සහ අතහැරීම | 8.4 | 8.8 | 57.2 | 44.9 |
| භාණ්ඩ සහ සේවා අපනයන | 13.6 | 17.2 | 23.2 | 74.1 |
| **එකතුව** | **100.0** | **100.0** | **14.8** | **38.0** |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයන්ː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

### 2.14 රූප සටහන
### 2022 වසරේ ආර්ථිකය (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)




(අ) ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ. (2015 පදනම් වර්ෂය)

මූලයන්ː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මෙහිදී, ද.දේ.නි. හා ආනයන 2021 වසරට සාපේක්ෂව 2022 වසර තුළ දී පිළිවෙලින් සියයට 37.2කින් සහ සියයට 41.2කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එසේ වුවද, ස්ථාවර මිල අනුව සැලකීමේ දී 2022 වසර තුළ දී ද.දේ.නි. සහ ආනයන පහත වැටීමක් වාර්තා කරන ලදී. මේ අතර, පවතින සම්පත් බොහෝමයක් පරිභෝජන අරමුණු සඳහා උපයෝජනය කර ඇති අතර, එය පවත්නා මිල අනුව 2022 වසරේ දී මුළු සම්පත් භාවිතයෙන් සියයට 55.3ක් විය. තවද, ආයෝජනය සහ අපනයන මුළු සම්පත් භාවිතයෙන් පිළිවෙලින් සියයට 27.5ක් සහ සියයට 17.2ක් විය.

### ඉතුරුම්

**රටෙහි දේශීය ඉතුරුම් මෙන්ම ජාතික ඉතුරුම් ද පවත්නා මිල අනුව 2022 වසර තුළ දී වර්ධනය විය.** ඒ අනුව, 2021 වසරේ දී සියයට 22.9කින් ඉහළ ගිය දේශීය ඉතුරුම්, රාජ්‍ය නිර්-ඉතුරුම්වල ඉහළ යෑම හමුවේ වුව ද පෞද්ගලික ඉතුරුම්වල වර්ධනය හේතුවෙන් 2022 වසර තුළදී සියයට 44.2කින් වැඩි විය. ඒ අනුව, දේශීය ඉතුරුම් ද.දේ.නි.හි ප්‍රතිශතයක් ලෙස සියයට 30.8ක් දක්වා ඉහළ ගියේය. එමෙන්ම, රුපියල් වටිනාකම අනුව ශුද්ධ ප්‍රාථමික ආදායම තවදුරටත් පහත වැටුනු අතර, ශුද්ධ විදේශීය ජංගම සංක්‍රාම වර්ධනයක් වාර්තා කරන ලදී. එහි සමස්ත ප්‍රතිඵලයක් ලෙස ජාතික ඉතුරුම් පසුගිය වසරේ වාර්තා කළ සියයට 17.7ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේදී සියයට 37.6ක ඉහළ වේගයකින් වර්ධනය විය. මේ අතර, ආයෝජන වියදම්වලට සාපේක්ෂව ඉතුරුම් ඉහළ වේගයකින් වර්ධනයට වීම හේතුවෙන් ජාතික ඉතුරුම්-ආයෝජන පරතරය 2022 වසර තුළ දී අඩු විය.

### 2.6. ආදායම

**2022 වසරේ දී විශාලතම ආදායම් සංරචකය වෙමින් දළ මිශ්‍ර ආදායම ආර්ථිකය තුළ දළ එකතු කළ අගයෙන් සියයට 34.6ක් ජනනය කරනු ලැබූ අතර, එය 2021 වසරේ දී පවත්නා මිල අනුව වාර්තා කළ සියයට 11.2ක වර්ධනයට සාපේක්ෂව මෙම වසරේ දී සියයට 45.4ක වර්ධනයකි.** මේ අතර, මෙම වසරේ දෙවන විශාලතම ආදායම් සංරචකය වූ දළ මෙහෙයුම් අතිරික්තය, 2021 වසරේ දී වාර්තා කළ සියයට 17.3ක වර්ධනයට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 36.0කින් වර්ධනය වී ඇත. තවද, අනෙකුත් ආදායම් සංරචක සලකන විට, සේවක ආදායම් හා නිෂ්පාදනය මත සහනාධාර අඩු කරන ලද බදු ද 2022 වසරේ දී වර්ධනය වී ඇත. මේ අතර, දළ එකතු කළ අගය සඳහා දායකත්වය දක්වන ලද ආයතනික අංශ අනුව ආදායම ජනනය කිරීම සැලකීමේ දී මූල්‍ය නොවන ආයතනික අංශය ප්‍රධාන දායකත්වය දක්වන ලද අතර, ඉන් අනතුරුව ගෘහ ඒකක හා ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන අංශය, රාජ්‍ය අංශය හා මූල්‍ය ආයතන අංශය පිළිවෙලින් සිය දායකත්ව සපයන ලදී.

**2.13 සංඛ්‍යා සටහන**

**පරිභෝජනය, ආයෝජන සහ ඉතිරිකිරීම් (පවත්නා වෙළඳපොළ මිල අනුව) (අ)(ආ)**

| කාණ්ඩය | රුපියල් මිලියන | | වර්ධනය (%) | | ද.දේ.නි. ට දායකත්වය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2021 (ඇ) | 2022 | 2021 (ඇ) | 2022 | 2021 (ඇ) | 2022 |
| 1. වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. | 17,600,191 | 24,147,726 | 12.3 | 37.2 | 100.0 | 100.0 |
| 2. පරිභෝජන වියදම | 12,434,283 | 16,700,557 | 8.4 | 34.3 | 70.6 | 69.2 |
| පෞද්ගලික | 10,769,655 | 14,973,295 | 9.4 | 39.0 | 61.2 | 62.0 |
| රජය | 1,664,627 | 1,727,261 | 2.3 | 3.8 | 9.5 | 7.2 |
| 3. ආයෝජන | 6,466,957 | 8,304,627 | 25.1 | 28.4 | 36.7 | 34.4 |
| 4. දේශීය ඉතුරුම් | 5,165,908 | 7,447,170 | 22.9 | 44.2 | 29.4 | 30.8 |
| පෞද්ගලික | 6,456,349 | 8,987,618 | 19.9 | 39.2 | 36.7 | 37.2 |
| රජය | -1,290,441 | -1,540,448 | -9.3 | -19.4 | -7.3 | -6.4 |
| 5. දේශීය ඉතුරුම්-ආයෝජන පරතරය | -1,301,049 | -857,458 | -34.7 | 34.1 | -7.4 | -3.6 |
| 6. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඈ) | -395,539 | -621,353 | 6.5 | -57.1 | -2.2 | -2.6 |
| 7. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඈ) | 1,034,694 | 1,159,474 | -10.1 | 12.1 | 5.9 | 4.8 |
| 8. ජාතික ඉතුරුම් | 5,805,063 | 7,985,291 | 17.7 | 37.6 | 33.0 | 33.1 |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් කුමන හෝ වෙනසක් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

**2.14 සංඛ්‍යා සටහන**

**පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක (අ)(ආ)**

| අයිතමය | ප්‍රතිශතක දායකත්වය (%) | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2021 (ඇ) | | | | | 2022 | | | | |
| | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා.තො.ගෘ.සේ.ආ.* අංශය | සමස්ත ආර්ථිකය | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා.තො.ගෘ.සේ.ආ.* අංශය | සමස්ත ආර්ථිකය |
| සේවක ආදායම් | 45.6 | 6.5 | 26.5 | 21.4 | 100.0 | 47.7 | 10.2 | 21.7 | 20.5 | 100.0 |
| දළ මෙහෙයුම් අතිරික්තය | 84.6 | 12.1 | 3.3 | 0.0 | 100.0 | 86.4 | 11.3 | 2.4 | 0.0 | 100.0 |
| මිශ්‍ර ආදායම | - | - | - | 100.0 | 100.0 | - | - | - | 100.0 | 100.0 |
| නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළා එම සහනාධාර) | 74.5 | 10.4 | - | 15.2 | 100.0 | 73.2 | 10.7 | - | 16.1 | 100.0 |
| මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය | 43.5 | 6.2 | 9.2 | 41.1 | 100.0 | 43.6 | 6.8 | 7.1 | 42.4 | 100.0 |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
*ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලයː ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 2.7 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

### ජනගහනය

**පෙර වසරට සාපේක්ෂව අඩු වර්ධන වේගයකින් වුවද ශ්‍රී ලංකාවේ ජනගහනය 2022 වසරේ දී අඛණ්ඩව වර්ධනය විය.** ඒ අනුව, 2022 වසරේ දී ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික ජනගහනය මිලියන 22.181ක් ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර ඇති අතර, එය 2021 වසරේ දී වාර්තා වූ සියයට 1.1ක වර්ධනයට සාපේක්ෂව සියයට 0.1ක සුළු වර්ධනයකි. මේ අතර, බස්නාහිර පළාත තුළ ජනගහනය 2022 වසරේ දී යම් අඩු වීමක් පෙන්නුම් කළ ද එම පළාත මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් සියයට 28.0ක ඉහළම ප්‍රතිශතය නියෝජනය කරන ලද අතර, ඉන් අනතුරුව මධ්‍යම සහ දකුණු පළාත් පිළිවෙලින් සියයට 12.7ක් සහ සියයට 12.2ක් බැගින් නියෝජනය කරන ලදී. මේ අතර, උතුරු පළාත 2022 වසරේ දී මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් සියයට 5.3ක් ලෙස අඩුම ප්‍රතිශතය නියෝජනය කරන ලදී. 2021 වසරේ දී වර්ග කිලෝමීටරයකට පුද්ගලයන් 353ක්ව පැවති ජන ඝනත්වය, ජනගහන වර්ධනයට සමගාමීව 2022 වසරේ දී වර්ග කිලෝමීටරයකට පුද්ගලයන් 354ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. එසේම, මෑත වසරවල පැවති ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, කාන්තා ජනගහනය පිරිමි ජනගහනයට වඩා ඉහළ මට්ටමක මෙම වසරේදී ද පැවතුණි.

**2.15 සංඛ්‍යා සටහන**

**පළාත් මට්ටමෙන් ජනගහනය සහ ජන ඝනත්වය (අ)(ආ)**

| පළාත | 2021 | | 2022 | |
|---|---|---|---|---|
| | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය | ජනගහනය පුද්ගලයන් '000 | ජන ඝනත්වය |
| බස්නාහිර | 6,219 | 1,731 | 6,209 | 1,728 |
| මධ්‍යම | 2,811 | 504 | 2,812 | 504 |
| දකුණ | 2,696 | 501 | 2,702 | 502 |
| උතුර | 1,165 | 141 | 1,173 | 141 |
| නැගෙනහිර | 1,783 | 190 | 1,788 | 191 |
| වයඹ | 2,592 | 345 | 2,592 | 345 |
| උතුරු මැද | 1,402 | 144 | 1,406 | 144 |
| ඌව | 1,400 | 168 | 1,408 | 169 |
| සබරගමුව | 2,088 | 424 | 2,091 | 425 |
| **මුළු එකතුව** | **22,156** | **353** | **22,181** | **354** |

(අ) තාවකාලික
(ආ) මධ්‍ය වාර්ෂික ජනගහන දත්ත 2012 ජන හා නිවාස සංගණනය මත පදනම් වේ.

මූලයː රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ශ්‍රම බලකාය

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව 2022 වසරේ දී ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය 2021 වසරට සාපේක්ෂව ඉහළ ගිය අතර, ශ්‍රම බලකාය පහළ යන ලදී.** මෙහිදී, කුටුම්බ ජනගහනයේ වර්ධනයට සමගාමීව, ආර්ථික වශයෙන් සක්‍රීය නොවන ජනගහනය 2021 වසරේ වාර්තා වූ මිලියන 8.581 සිට 2022 වසරේ දී මිලියන 8.615ක් දක්වා ඉහළ ගිය අතර, ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය[7] නිරූපණය කෙරෙන ශ්‍රම බලකාය 2021 දී වාර්තා කල මිලියන 8.553 සිට 2002 දී මිලියන 8.547ක් දක්වා සුළු වශයෙන් අඩු විය. ඒ අනුව, ශ්‍රම බලකාය සහ

7 ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය, එනම් සලකා බලන සතියක කාලසීමාව තුළ වයස අවුරුදු 15 සහ ඊට වැඩි සේවා නියුක්ත සහ සේවා වියුක්ත ජනගහනය අයත් වේ.

**2.16 සංඛ්‍යා සටහන**

**කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)**

| ශීර්ෂය | 2020 | 2022 (ආ) | | | | |
|---|---|---|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| **කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000** | **17,134** | **17,105** | **17,126** | **17,186** | **17,230** | **17,162** |
| **ශ්‍රම බලකාය පුද්ගලයන් '000** | **8,553** | **8,762** | **8,576** | **8,430** | **8,421** | **8,547** |
| සේවා නියුක්ත | 8,114 | 8,389 | 8,177 | 8,010 | 8,015 | 8,148 |
| සේවා වියුක්ත | 440 | 373 | 399 | 419 | 406 | 399 |
| **ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඇ)** | **49.9** | **51.2** | **50.1** | **49.0** | **48.9** | **49.8** |
| පුරුෂ | 71.0 | 71.8 | 70.9 | 70.4 | 69.0 | 70.5 |
| ස්ත්‍රී | 31.8 | 33.6 | 32.1 | 31.0 | 31.6 | 32.1 |

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ආ) තාවකාලික
(ඇ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කුටුම්බ ජනගහනය අතර අනුපාතය වන ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 2021 වසරේ වාර්තා වූ සියයට 49.9 සිට 2022 වසර වන විට සියයට 49.8ක් දක්වා සුළු වශයෙන් පහළ ගියේය. මෙහිදී, 2021 වසරේ දී සියයට 71.0ක් ලෙස වාර්තා වූ පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය 2022 වසරේ දී සියයට 70.5ක් දක්වා පහළ ගිය අතර, ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය හිතකර ප්‍රවණතාවයක් පෙන්නුම් කරමින් පෙර වසරේ දී වාර්තා කළ සියයට 31.8ට සාපේක්ෂව සියයට 32.1ක් දක්වා ඉහළ ගියේය. තවද, ස්ත්‍රී පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්ව පරතරය 2021 වසරේ වාර්තා වූ සියයට 39.2ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 38.4ක් දක්වා පහළ යන ලදී.

## සේවා නියුක්තිය

**සේවා නියුක්ත ජනගහනය[8] 2021 වසරේ දී වාර්තා වූ මිලියන 8.114 සිට 2022 වසරේ දී මිලියන 8.148ක් දක්වා ඉහළ ගොස් ඇත.** මෙහිදී, ප්‍රධාන ආර්ථික කටයුතු අනුව සේවා නියුක්තිය සැලකූ විට, කර්මාන්ත කටයුතුවල සේවා නියුක්තිය 2021 වසරේ දී මිලියන 2.109 සිට 2022 වසරේ දී මිලියන 2.158ක් දක්වා ඉහළ ගිය අතර, සේවා කටයුතුවල සේවා නියුක්තිය 2021 වසරේ දී වාර්තා වූ මිලියන 3.791ට සාපේක්ෂව 2022 වසරේ දී මිලියන 3.831ක් දක්වා ඉහළ යන ලදී. කෙසේ වුවද, කෘෂිකර්මාන්ත කටයුතු ආශ්‍රිත සේවා නියුක්තිය 2022 වසරේ දී මිලියන 2.159ක් ලෙස වාර්තා වූ අතර, එය පෙර වසරේ වාර්තා වූ මිලියන 2.213ට සාපේක්ෂව පහළ යාමකි. ඒ අනුව, කර්මාන්ත සහ සේවා කටයුතුවලින් සමස්ත සේවා නියුක්තියට සපයන දායකත්වය 2021 වසරේ පිළිවෙළින් පැවති සියයට 26.0 සහ සියයට 46.7 සිට 2022 වසරේ දී පිළිවෙළින් සියයට 26.5ක් සහ සියයට 47.0ක් දක්වා ඉහළ ගිය අතර, කෘෂිකර්මාන්ත කටයුතුවල දායකත්වය පෙර වසරේ වාර්තා කළ සියයට 27.3 සිට 2022 වසර වන විට සියයට 26.5ක් දක්වා පහළ යන ලදී. තවද, රැකියාවේ සේවා තත්ත්වය අනුව සේවා නියුක්තිය සැලකූ විට, රාජ්‍ය අංශයේ සේවකයන්, තමාගේම වැඩකටයුතු කරන්නන් සහ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් 2021 වසරට සාපේක්ෂව 2022 වසරේදී පහත වැටුණු අතර, පෞද්ගලික අංශයේ සේවකයින් හා සේව්‍යයන් සංඛ්‍යාව ඉහළ යන ලදී. තවද, සේවා නියුක්තිය සඳහා ඉහළම දයකත්වය මෙවරද ලබාදුන් පෞද්ගලික අංශය 2022 වසරේදී සමස්ත සේවා නියුක්තියෙන් සියයට 42.9ක් නියෝජනය කළ අතර, ඉන් අනතුරුව විශාලම දයකත්වය දක්වනු ලැබූ තමාගේම වැඩකටයුතු කරන්නන්ගේ ප්‍රතිශතය සියයට 33.1ක් විය.

**2.17 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| අංශය | 2021 (අ) | 2022 (ආ) | ප්‍රතිශත වෙනස 2022/2021 (ආ) |
|---|---|---|---|
| රාජ්‍ය | 1,181,422 | 1,181,766 | 0.0 |
| රජය සතු ව්‍යවසායයන් | 219,838 | 212,117 | -3.5 |
| **සමස්ත රාජ්‍ය අංශය** | **1,401,260** | **1,393,883** | **-0.5** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

**මුදල් අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ දත්ත අනුව 2022 වසරේ දී රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය මිලියන 1.394ක් ලෙස වාර්තා විය.** මේ සඳහා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් සභා සහ රජය සතු ව්‍යවසායයන්ගේ සේවා නියුක්තිකයින් ඇතුලත් වෙයි. ඒ අනුව, 2021 වසරේ දී මිලියන 1.401ක් වූ රාජ්‍ය අංශයේ සේවා වියුක්තියෙහි පහත වැටීමක් 2022 වන විට වාර්තා වී ඇති අතර, මේ සඳහා රජය සතු ව්‍යවසායයන්ගේ සේවක සංඛ්‍යාව පහත වැටීම බලපාන ලදී.

8 අදාළ යොමු කාලය තුළ සේවකයන්, සේව්‍යයන් සහ තමාගේම වැඩ කටයුතු කරන්නන් හෝ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් ලෙස අවම පැයක්වත් ආර්ථික කටයුත්තක යෙදුන පුද්ගලයන් සේවා නියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි. මෙයට ආදාළ යොමු කාලය තුළ ආර්ථික කටයුත්තක යෙදී නොසිටියත් එම ආර්ථික කටයුත්ත සමඟ විධිමත් බැඳීමක් ඇති පුද්ගලයන් ද අයත් වේ.

## සේවා වියුක්තිය


**සේවා වියුක්ති අනුපාතිකය 2021 වසරේ වාර්තා වූ සියයට 5.1 සිට 2022 වසරේ දී සියයට 4.7ක් දක්වා පහළ යන ලදී.** ඒ අනුව, පෙර වසරේ දී මිලියන 0.440ක් ලෙස වාර්තා වූ සේවා වියුක්ත ජනගහනය[9] 2022 වසර වන විට මිලියන 0.399ක් දක්වා පහළ ගියේය. මෙහිදී, පුරුෂ සේවා වියුක්ති අනුපාතිකය සියයට 3.7ක මට්ටමේම නොවෙනස්ව පැවති අතර, ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 2021 වසරේ වාර්තා කළ සියයට 7.9ට සාපේක්ෂව 2022 වසරේ සියයට 6.5ක් දක්වා පහත වැටුණි. තවද, අ.පො.ස. උසස් පෙළ හා ඉන් ඉහළ අධ්‍යාපනය ලැබූ කාණ්ඩයේ සේවා වියුක්ති අනුපාතිකය 2021 වසරේ දී වාර්තා වූ සියයට 9.1 සිට 2022 වසරේ දී සියයට 7.8ක් දක්වා සැලකිය යුතු ලෙස පහළ යන ලදී. එසේම, තරුණ (අවුරුදු 15-24) සේවා වියුක්ති අනුපාතිකය 2021 වසරේ වාර්තා වූ සියයට 26.5ට සාපේක්ෂව 2022 වසරේ දී සියයට 22.8ක් දක්වා පහත වැටෙන ලදී.

## විදේශ සේවා නියුක්තිය

**2022 වසරේ දී විදේශ රැකියා සඳහා 311,056 දෙනෙකු පිටත්ව යන ලද අතර, මෙය 2021 වසරේ දී පිටත්ව ගිය 122,264ට සාපේක්ෂව සියයට 154.4ක සැලකිය යුතු වර්ධනයකි.** 2022 වසර තුළ දී රට අත්විඳි ආර්ථික අර්බුදය ද මෙසේ විශාල පිරිසක් රැකියා සඳහා විදේශගත වීම කෙරෙහි හේතු විය. ප්‍රතිශතයක් ලෙස ගත් කළ වසර තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව යන ලද පිරිසෙන් සියයට 60.1ක් පුරුෂයින් වූ අතර, සියයට 39.9ක් කාන්තාවන් විය. මෙහිදී, ශ්‍රම කාණ්ඩය අනුව සැලකූ විට, වෘත්තීය, මධ්‍යම මට්ටම, ලිපිකරු හා ඒ අශ්‍රිත, පුහුණු, අර්ධ පුහුණු, නුපුහුණු හා ගෘහ සේවිකා යන කාණ්ඩ සියල්ලම යටතේ විදේශ රැකියා සඳහා පිටත් වීමේ ඉහළ යෑමක් වාර්තා වූ අතර, එහි සමස්ත වර්ධනය කෙරෙහි විශේෂයෙන්ම පුහුණු, නුපුහුණු සහ ගෘහ සේවිකා කාණ්ඩ ඉහළ දායකත්වයක් දක්වන ලදී. මේ අතර, 2022 වසරේ දී ද රැකියා සඳහා මැද පෙරදිග රටවල්වලට වැඩි වශයෙන් විදේශගත වීම් වාර්තා වූ අතර, එය රැකියා සඳහා සමස්ත විදේශගත වීම් වලින් සියයට 84.7ක් විය. එයින් ද සියයට 91.3ක් කටාර්, සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය හා කුවේට් යන රටවල් සඳහා විය.


9 රැකියාවක් සොයන හා රැකියාවක් නොකළ සහ පසුගිය සති හතරක කාලය තුළ රැකියාවක් සෙවීමට යම් පියවරක් ගත් හා ඉදිරි සති දෙක තුළ රැකියාවක් ලැබුණහොත් භාරගැනීමට හැකියාවක් ඇති පුද්ගලයන් සේවා වියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි.

**2.16 රූප සටහන**
**නිපුණතා කාණ්ඩ අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**





මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**2.15 රූප සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය (%)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**2.17 රූප සටහන**
**ප්‍රධාන ගමනාන්ත අනුව විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**




මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

2

**2.18 සංඛ්‍යා සටහන**

**විදේශ රැකියා සඳහා පිටත්ව යෑම්**

| විදේශ සේවා නියුක්තිය | 2020 | | 2021 (අ) | | 2022 (ආ) | |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % | සංඛ්‍යාව | දායකත්වය % |
| **මුළු විදේශ රැකියා සංඛ්‍යාව** | **53,711** | **100.0** | **122,264** | **100.0** | **311,056** | **100.0** |
| **මූලයන් අනුව** | | | | | | |
| ලියාපදිංචි නියෝජිතයන් | 18,065 | 33.6 | 41,805 | 34.2 | 123,420 | 39.7 |
| වෙනත් | 35,646 | 66.4 | 80,459 | 65.8 | 187,636 | 60.3 |
| **ස්ත්‍රී/පුරුෂ අනුව** | | | | | | |
| පුරුෂ | 32,500 | 60.5 | 81,110 | 66.3 | 186,965 | 60.1 |
| ස්ත්‍රී | 21,211 | 39.5 | 41,154 | 33.7 | 124,091 | 39.9 |
| **ශ්‍රම කාණ්ඩය අනුව** | | | | | | |
| වෘත්තීය | 2,957 | 5.5 | 8,373 | 6.8 | 14,307 | 4.6 |
| මධ්‍යම මට්ටම | 1,496 | 2.8 | 4,256 | 3.5 | 8,130 | 2.6 |
| ලිපිකරු හා ඒ ආශ්‍රිත | 2,496 | 4.6 | 6,540 | 5.3 | 12,134 | 3.9 |
| පුහුණු | 16,664 | 31.0 | 40,174 | 32.9 | 92,836 | 29.8 |
| අර්ධ පුහුණු | 789 | 1.5 | 1,930 | 1.6 | 4,133 | 1.3 |
| නුපුහුණු | 13,987 | 26.0 | 31,676 | 25.9 | 105,509 | 33.9 |
| ගෘහ සේවිකා | 15,322 | 28.5 | 29,315 | 24.0 | 74,007 | 23.8 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

## ශ්‍රම ඵලදායිතාව

**වැඩ කරන ලද පැයකට එකතු කළ අගය (2015 මිල අනුව) වශයෙන් මනිනු ලබන ශ්‍රම ඵලදායිතාව, 2021 වසරේ දී වාර්තා වූ පැයකට රුපියල් 768.08 සිට 2022 වසරේ දී පැයකට රු. 686.57ක් දක්වා සියයට 10.6කින් පහත වැටුණි.** මෙහිදී, කර්මාන්ත හා සේවා කටයුතුවල ශ්‍රම ඵලදායිතාවෙහි පහත වැටීමක් වාර්තා වූ අතර, ඒ කෙරෙහි එම ක්‍රියාකාරකම්වල එකතු කළ අගය පහත වැටීම මූලික වශයෙන් හේතු විය. ඒ අනුව, කර්මාන්ත හා සේවා කටයුතුවල ශ්‍රම ඵලදායිතාව 2021 වසරේ දී පිළිවෙලින් වාර්තා කළ පැයකට රුපියල් 922.15 සහ පැයකට රුපියල් 945.97 සිට 2022 වසර වන විට පැයකට රුපියල් 759.80ක් සහ පැයකට රුපියල් 839.85ක් දක්වා පහත වැටුණි. කෙසේ වුවද, කෘෂිකාර්මික කටයුතුවල එකතු කළ අගය මෙන්ම වැඩ කරන ලද පැය ගණන ද පහත වැටීම හේතුවෙන් එම කටයුතුවල ශ්‍රම ඵලදායිතාව 2021 වසරේ පැවති මට්ටමට ආසන්න මට්ටමකම පැවතිණි. ඒ අනුව, 2021 වසරේ දී පැයකට රුපියල් 243.04ක් වූ කෘෂිකාර්මික කටයුතුවල ශ්‍රම ඵලදායිතාව 2022 වසරේ දී පැයකට රුපියල් 243.94ක් ලෙස වාර්තා විය. තවද, ශ්‍රම ඵලදායිතා මට්ටම අනුව සැලකූ විට, ශ්‍රම උපයෝජන කාර්යක්ෂමතාව සේවා කටයුතුවල වැඩි අගයක් වාර්තා කළ අතර, ඉන් අනතුරුව කර්මාන්ත කටයුතුවලින් ද අඩුම අගය කෘෂිකර්මාන්ත කටයුතුවලින් ද වාර්තා විය.